1 අඳුරෙන් අඳුරට යන ● → ●

○ ← ● අඳුරෙන් එළියට එන 2

**දස සංයෝජන ධර්ම**

| | සංයෝජන | කෙටි විස්තරය |
|---|---|---|
| 1 (1) | සක්කාය දිට්ඨි | මමය, පුද්ගලයාය, සත්වයාය, යනාදී මෙම පඤ්චස්කන්ධය වන රූප, වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණය යන ස්කන්ධ එකතුවක් බව තේරුම් ගැනීමට නොහැකිව මමය, පුරුෂය, ස්ත්‍රීයය, දෙවියා ආදී වශයෙන් වැරදි ලෙස සලකති. මෙම වැරදි වැටහීම, පිළිගැනීමෙන් කටයුතු කිරීම සසරට හේතු වන බැවින් සක්කාය දිට්ඨිය සංයෝජනයකි. |
| 1 (2) | විචිකිච්ඡා | නිවන් දකින මාර්ගය ගැන හෝ එම මාර්ගය දේශනා කළ ශාස්තෘන් වහන්සේ ගැන හෝ මිනා සංසාරය ගැන විශ්වාසයක් නොමැති නම් එය නිවන් දකින්නට මහත් බාධාවකි. කුසුරුවෙන් යන ප්‍රධාන වී ඇතිවන විචිකිච්ඡාව හෙවත් සැකය සසර ගමනට හේතුවන සංයෝජන ධර්මයක් ලෙස දක්වනු ලැබේ. |
| 1 (3) | සීලබ්බතපරාමාස | ගව, එළු, ආදී සත්වයන්ගේ ප්‍රකෘති ස්වභාවට සීල යැයි කියනු ලැබේ. යමෙකු ගවාදී සත්වයෙකු සේ අනුව කටයුතු කරයිද එය ව්‍රත සමාදානයයි. මිනිසෙකු මෙසේ විශුද්ධියට පැමිණිය හැකි යැයි වැරදි සීල ව්‍රත රකින් නම් එය සීල ව්‍රත පරාමර්ශන සමාදානය හෙවත් සීලබ්බත පරාමාස වේ. එය සසර බැඳෙන සංයෝජනයකි. |
| 2 (4) | කාමරාග | සතර අපාය, මිනිස් ලෝකය, සදෙව් ලොව යන එකොළොස් කාම භූමිහි ඉපිද රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන අරමුණු වල ඇලී ලෙස දැඩිව ඇලී කටයුතු කිරීම, මෙම දැඩි ලෝභය සසර බඳින කාම රාගය සංයෝජනයකි. |
| 3 (5) | ව්‍යාපාද | තමන් ප්‍රිය කරන පඤ්චකාම අරමුණු නොලැබීමෙන්, එම අරමුණු වලක්වන සත්ව, පුද්ගල වස්තූන්ට විරුද්ධවීම ව්‍යාපාදය වේ. මෙය අනෙක් ගුණ ධර්ම වැඩීමට ඉඩ අහුරන බැවින් සසර දිග් වීමට හේතුවන සංයෝජන ධර්මයකි. |
| 4 (6) | රූපරාග | සොළොසක් වූ රූපාවචර බ්‍රහ්ම ලෝක භූමිහි ස්කන්ධ පැවැත්වීමේ ආශාව රූප තණ්හාව හෙවත් රූප රාගයයි. එබැවින් සංයෝජන ධර්මයකි.(රූපාවචර බ්‍රහ්මයන් ප්‍රීති සුඛය ආහාර කොට ගන්නේය. නාසය,දිව,ශරීරය යන ඉන්ද්‍රියන්ගේ ප්‍රසාද රූප නිර්මිත නැත.) |
| 4 (7) | අරූපරාග | රූපයේ දෝෂයන් දැක අරූප ධ්‍යාන වඩා වේදනා,සංඥා,සංස්කාර, විඤ්ඤාණ යන ස්කන්ධ සතරක් ඇති සතරක් වූ අරූප ලෝකයන්හි ඉපදීමේ ආශාව අරූප රාගයයි. එයද සසර බැඳෙන සංයෝජනයකි. |
| 4 (8) | මානය | පුද්ගලයෙක් හෝ පිරිසක් අරමුණු කර තමන් ඔවුන්ට වඩා උසස් කර හෝ පහත් කර, නැතිනම් සමානයයි මැනගනී.මේ හේතුවෙන් කළ යුත්ත නොකර නැවත නොකළ යුත්ත කිරීම,වැනි කටයුතු කරයි. එම නිසා සසර බැඳීමක වැඩේවේ. එබැවින් මානය සසර බඳින සංයෝජන ධර්මයකි. |
| 4 (9) | උද්ධච්චය | සිතේ නොසන්සුන් බව හෙවත් අරමුණෙහි සිත නොපිහිටා සැලෙන, දැගලන බව උද්ධච්චයයි. සමාධියට විරුද්ධ උද්ධච්චය අරමුණෙන් අමිහිර බව, වැඩ කටයුතු නිසුළු වීම වැනි කරුණු මත ඇතිවේ. මෙම නිසා එවැනි සිත් ඇතිවන අවස්ථාවේ ප්‍රඥාව පහළ නොවේ. එබැවින් උද්ධච්චය සංයෝජන ධර්මයකි. |
| 4 (10) | අවිජ්ජා | සංයෝජන ඇති කරන ප්‍රධාන හේතුව අවිද්‍යාවයි. දුකෙන අරමුණු ඇති සැටියෙන් දැක ගැනීමට අසමත් බව අවිද්‍යාව නිසා ඇති වන්නේය. මෙම පඤ්චස්කන්ධය ගැනද ලෝකයේ පැවැත්ම ගැනද නිවැරදි දැනීම නොමැති බව අවිද්‍යාව වන බැවින් අවිද්‍යාව සංයෝජන ධර්මයකි. |

* සත්වයන්ට සංසාර ගමන සීමා කිරීමට නොදී නිවුන් සංසාරේ අඳ බඳ තබන කෙලෙස් ධර්ම සංයෝජන ධර්ම නම් වේ. ලෝකය හා බැඳෙන ආකාරය අනුව අජ්ඣත්ත (එකොළොස් කාම ලෝකයේ බැඳෙන) බහිද්ධ (විසි ආකාර බ්‍රහ්ම ලොව බැඳෙන) නම් වේ. මෙම සංයෝජන නැසීම ඒ ඒ මාර්ග ඥාන පහළ වීමත් සමග සිදුවේ. සංස්කාර ස්වභාවය ත්‍රිලක්ෂණයෙන් තමන්ට වඩාත් ප්‍රකට ලක්ෂණයකින් වඩාත් ගැඹුරට දැකීම තුලින් උසස් උසස් මාර්ග ඥාන පහළ කර ගත හැක.(අෂ්ටාංගික මාර්ගය අනුව)

## (ලෝකෝත්තර ඥාන මගින් විනාශ වන ලෞකික ධර්ම)

**සංයෝජන ධර්ම විනාශ වන අයුරු**

| ඕරම්භාගිය සංයෝජන(අජ්ඣත්ත) | | | | උද්ධම්භාගිය සංයෝජන(බහිද්ධ) | | |
|---|---|---|---|---|---|---|
| 1. සක්කාය දිට්ඨි<br>2. විචිකිච්ඡා<br>3. සීලබ්බත පරාමාස | සෝවාන් මාර්ග ඥානයෙන්ද | 4. කාම රාග<br>5. ව්‍යාපාද | අනාගාමි මාර්ග ඥානයෙන්ද | 6. රූප රාග<br>7. අරූප රාග | 8. මානය<br>9. උද්ධච්චය<br>10. අවිජ්ජා | අර්හත් මාර්ග ඥානයෙන්ද |

**දස අකුසල කර්ම වශයෙන් විනාශ වන අයුරු**

- 1. පාණාතිපාතා, 2. අදින්නාදානා, 3. මිච්ඡාචාරා, 4. මුසාවාදා ← සෝවාන් මාර්ග ඥානයෙන්ද
- 5. පිසුණාවාචා, 6. ඵරුසාවාචා, 7. සම්ඵප්පලාප, 8. ව්‍යාපාද ← අනාගාමි මාර්ග ඥානයෙන්ද
- 7. සම්ඵප්පලාප, 9. අභිද්‍යා ← අර්හත් මාර්ග ඥානයෙන්ද
- 10.මිථ්‍යා දිට්ඨි ← සෝවාන් මාර්ග ඥානයෙන්ද

**☆ නීවරණ වශයෙන් විනාශ වන අයුරු**

- 1. කාමච්ඡන්ද, 2. ව්‍යාපාද ← අනාගාමි මාර්ග ඥානයෙන්ද
- 3. ථීන මිද්ධ, 4. උද්ධච්ච, 5. කුක්කුච්ච ← අර්හත් මාර්ග ඥානයෙන්ද
- 6. විචිකිච්ඡා ← සෝවාන් මාර්ග ඥානයෙන්ද

**☆ අෂ්ඨ ලෝක ධර්ම වශයෙන් විනාශ වන අයුරු**

- 1. ලාභ, 2. අලාභ, 3. අයස, 4. යස, 5. නින්දා, 6. ප්‍රශංසා ← අර්හත් මාර්ග ඥානයෙන්ද
- 7. සුඛ, 8. දුඛ ← අනාගාමි මාර්ග ඥානයෙන්ද

**අකුසල සිත් වශයෙන් විනාශ වන අයුරු**

1. ලෝභ මූල සම්ප්‍රයුක්ත සිත් 04 ද, මෝහමූල විචිකිච්ඡා සිතද ← සෝවාන් මාර්ගයෙන්
2. ලෝභ මූල විප්‍රයුක්ත සිත් 04 ද, මෝහ මූල උද්ධච්ච සිතද ← අර්හත් මාර්ගයෙන්
3. ද්වේශ මූල සිත් 2 තද(අසංස්කාරික,සසංස්කාරික වශයෙන්) ← අනාගාමි මාර්ගයෙන්

**අකුසල මූල් වශයෙන් විනාශ වන අයුරු**

- 1. ලෝභය, 2. මෝහය ← අර්හත් මාර්ග ඥානයෙන්
- 3. ද්වේශය ← අනාගාමි මාර්ග ඥානයෙන්

සැලකිය යුතුයි :-
* විචිකිච්ඡාව අභිධර්මයේ අටාකාරයකින්ද, සම්මාදිට්ඨි සූත්‍රයේ දසාකාරයකින්ද දක්වා ඇත.
* බුදු දහමට පෙර උතුම්ම සැපය ලෙස ලෝකයේ සැලකුවේ කය නැති අරූප බ්‍රහ්ම ලෝකවල ඉපදීමය. නමුත් අය සැලකුවේ සිත නැති අසංඥ බඹලොව ඉපදීමයි.

විශේෂ කරුණු :-
* සකෘදාගාමී මාර්ග ඥානයෙන් සංයෝජන ධර්ම තුනී වීම පමණක් සිදුවේ.
* සෝවාන් ඵලයට පත් අයෙකු යමෙක් ජීවිතය තොර කරනවා යැයි කියා කුසලුව මරන්නට දක්වාවද එය නොකරති.
* අවිද්‍යාව සසර බැඳීමේ ප්‍රධාන කාරණා වන නිසා තමන්ගේ දාෂ්ඨිය ඇති කර ගැනීම තුලින් සසර ජය ගැනීමට ප්‍රධාන හේතුව වේ.

පුණ්‍යානුමෝදනය :- බු.ව. 2552 උඳුවප් පුන් පොහෝ දින ධර්ම දානය ලෙස මෙම දහම් පත්‍රිකාව (තඩවන ගුණානන්ද හිමි) වන අප විසින් සකස් කොට පොහුණුවිට පදිංචි සැදැහැති කමලා ගොරොන්ගොඩ උපාසිකා මාතාවගේ(විශ්‍රාමික ගුරු) ධන පරිත්‍යාගයෙන් මුද්‍රණය කොට බෙදා දෙන ලදී. මෙම ධර්ම දානය එතුමිය ඇතුළු සියලු සැමට නිවන් අවබෝධය පිණිස හේතුවේවායි ප්‍රාර්ථනා කරමි..

උපකාරක පොත් :- කෙලෙස් එක්දහස් පන්සියය(රේරුකානේ චන්ද්‍රවිමල හාමිමි රචිත), ත්‍රිපිටක ග්‍රන්ථ දීඝ නිකාය III, (හා උඩයේ අරියධම්ම ස්වාමීන් වහන්සේගේ ධර්ම දේශනා(අන්තෝජට සූත්‍ර දේශනාව)

තෙරුවන් සරණයි !

3 එළියෙන් අඳුරට යන ○ → ●

○ ← ○ එළියෙන් එළියටඑන 4

1 සම්මා සම්බුද්ධ

2 ප්‍රත්‍යෙක බුද්ධ

**පඤ්ච බල ධර්ම**

| | බල ධර්ම | කෙටි විස්තරය |
|---|---|---|
| ① | සද්ධා බලය | ලෝභාදී කෙලෙසුන්ට නොසෙල්විය හැකි පමණට, කෙලෙස් පීඩනය ඉවසිය හැකි පමණට කෙලෙසුන් පැරදවිය හැකි, නැසිය හැකි පමණට ශක්තිමත් වූ බුද්ධාදී රත්නත්‍රය කෙරෙහි ඇති විශ්වාසය සද්ධා බලයයි. |
| ② | විරිය බලය | ලෝභාදී කෙලෙසුන්ට නොසෙල්විය හැකි පමණට, කෙලෙස් පීඩනය ඉවසිය හැකි පමණට කෙලෙසුන් පැරදවිය හැකි, නැසිය හැකි පමණට ශක්තිමත් වූ වීර්යය විරිය බලයයි. |
| ③ | සති බලය | ලෝභාදී කෙලෙසුන්ට නොසෙල්විය හැකි පමණට, කෙලෙස් පීඩනය ඉවසිය හැකි පමණට කෙලෙසුන් පැරදවිය හැකි, නැසිය හැකි පමණට පැවැත්විය හැකි චිළඹ සිටි සිහිය හෙවත් සතිය (සතර සතිපට්ඨානයේ පිහිටීම) සති බලයයි. |
| ④ | සමාධි බලය | ලෝභාදී කෙලෙසුන්ට නොසෙල්විය හැකි පමණට, කෙලෙස් පීඩනය ඉවසිය හැකි පමණට කෙලෙසුන් පැරදවිය හැකි, නැසිය හැකි පමණට ශක්තිමත් වූ සිතේ එකඟ බව හෙවත් සමාධිය සමාධි බලයයි. |
| ⑤ | පඤ්ඤා බලය | ලෝභාදී කෙලෙසුන්ට නොසෙල්විය හැකි පමණට, කෙලෙස් පීඩනය ඉවසිය හැකි පමණට කෙලෙසුන් පැරදවිය හැකි, නැසිය හැකි පමණට වැඩූ ප්‍රඥාව පඤ්ඤා බලයයි. |

* සතිස් බෝධි පාක්ෂික ධර්ම අතුරින් පස්වන් ධර්ම කොටසයි. නොයෙක් බල ඇති ලෝකයේ මෙම බල ධර්ම නිවන් මග අහුරන මාර සේනාවන් ජය ගැනීමට ඇති ශක්තිය මෙහි බල ධර්ම ලෙස දක්වා ඇත. සතුරු වේසින් එන සතුරාට වඩා මිතුරු වේසින් එන සතුරා හඳුනා ගැනීම ඉතා දුෂ්කරය. කුසල් ලෙස අකුසල්ද, අකුසල් ලෙස කුසල්ද කරන මග හරවන විද්‍යාව ධර්ම සන්තානයේ පහල වේ. මේවා හඳුනා මැඩ පැවැත්වීමට අවශ්‍ය බලය මෙම පඤ්ච බල ධර්ම තුලින් ඇති කර ගත යුතු. පඤ්ච ඉන්ද්‍රියන්ගේ බල භාවය මෙහි බල ධර්ම ලෙස වර්ණා ගත යුතුය. විශේෂයෙන් නිවන් දැකීමට බාහිර, අභ්‍යන්තර පැන නගින කෙලෙස් මැඩ පවත්වා ගැනීමට හැකි බලයයි.

**උපමා මඟින් බලධර්ම දැක්වීම** :-
1. සද්ධා බලය - සතුරු සතුන් ගහන ගංගාවට බැස තමන් ඉදිරියෙන් යමින් බියපත්ව සිටි පිරිසද එතර කරන්නාක් මෙනි.
2. විරිය බලය - බරක් කරට ගත් අයෙකු එය බිම නොතබා අවසන් තැන තරා ගෙනියන්නාක් මෙනි.
3. සති බලය - දියෙහි ඉල්පී පාවී ස්වභාවයෙන්ම පහලට ගමන් කරන ලී කඳක් එසේ නොයන්නට නොදී රැකගන්නාක් මෙනි.
4. සමාධි බලය - දිය බඳුනක් තුලින් තම පෙවඟල්ල දකින්නට උත්සාහ කරන්නා එක් ඉරියව්වකින් ඒ දෙස බලා සිටින්නාක් මෙනි.
5. පඤ්ඤා බලය- දොරටු පාලකයෙකු විසින් ඇතුල්වන පිටවන සියලු දෙනා ඒ ඒ ලක්ෂණයන්ගෙන් දැන ගන්නාක් මෙනි.

**ආර්යවංශ ධර්ම** :-
1. සිවුරු පිළිබඳව ලද සැටියකින් සතුටු වන බව.
2. ආහාරය පිළිබඳව ලද සැටියකින් සතුටු වන බව.
3. සෙනසුන් පිළිබඳව ලද සැටියකින් සතුටු වන බව.
4. භාවනාවෙහි ඇලෙන බව ය.

**පැවිදිවූවනට නිවන් මග බාධා කරන මාර සේනා යෝධයෝ** (ගිහිව නිවන් මග ගමන් කරන්නන් හටද මේ මාර සේනාවෝ ඇත.) :-
- ⊛ පැවිද්දන් පෙළෙන සා පිපාසා දෙක එක් මාර සේනාවේ යෝධයෙකි.(ආර්ය වංශ ධර්මයේ අරතිය)
- ⊛ සා-පිපාසා නිසා (ලද පමණින් සතුටු නොවීම)පෙවීමේ තණ්හාව ඇතිවීම එක්මාර සේනාවේ යෝධයෙකි.
- ⊛ සිත දුබල වූ කල්හි ථිනමිද්ධය ඇතිවේ. එය එක් මාර සේනාවේ යෝධයෙකි.
- ⊛ බියෙන් විවේක නොලබා කල් යවන්නවුන්ගේ සන්තානයේ ප්‍රතිපත්තියේ විචිකිච්ඡාව ඇති වීම එක් මාර සේනාවේ යෝධයෙකි.
- ⊛ තමන් ප්‍රතිපත්තියේ යෙදී සිටිමින් අන් අයව ප්‍රතිපත්ති ගරහා කිරීමට යාමෙන් තමන් පිරිහීම මාර සේනාවේ යෝධයෙකි.
- ⊛ ප්‍රතිපත්තියේ මඳ ගුණයක් ඇතිවීමෙන්, අන් අයගේ ගුණ මකා දැමීමේ ස්වභාවය හෙවත් මක්ඛය එක් මාර සේනාවේ යෝධයෙකි.
- ⊛ ලැබූ මඳ ගුණය නිසා ගරුකළ යුත්තන්ට ගරු නොකිරීමේ ථම්භය එක් මාර සේනාවේ යෝධයෙකි.
- ⊛ ඇත්තාවූ මඳ ගුණ නිසා ලාභ, සත්කාර, කීර්ති, ප්‍රසංශාවන් ගෙන් මත්වී තමන් උසස් කොට ගැනීම එක් මාර සේනාවේ යෝධයෙකි.
- ⊛ ලාභ, සත්කාර ආදියෙන් මත්වී, අනුන් පහත් කොට සිතයි නම් එය එක් මාර සේනාවේ යෝධයෙකි.
- ⊛ ගිහි ජීවිතයෙන් බැහැරව නිවන් මගට බැසීමට අඹුදරු, වස්තුව, දේපල බාධා කරයි . එය මාරසේනාවේ යෝධයෙකි.

**සැලකිය යුතුයි** :-
* සද්ධාව ඇතිකර ගත හැක්කේ දහම් ඇසීම, දහම් පොත් කියවීම, සමථ-විදර්ශනා භාවනා වැඩීම තුලිනි.
* එක් බල ධර්මයක් ඇති අයට අනෙක් බල ධර්ම සතර ඇති කර ගැනීම පහසුය. එසේවත් නැති අයකුට එක් ධර්මයක් වත් ඇති කර ගැනීම දුෂ්කර විය හැකිය.
* කෙලෙස් මරුන්ගේ දත් අතරට හසු වී සිටින ගිහි පිංවතුන්ට එයින් මිදීමට ඇති උපාය බල ධර්ම ඇති කර ගැනීමයි.

**විශේෂ කරුණු** :-
* නැවත නැවත ජාති, ජරා,ව්‍යාධි,මරණ දුක්වලින් හා අපාය දුක්ඛ ගෙන දෙන මාර සේනාව පරදවා නිවන් සුවය ලැබීමට සෑම දෙනාම ඇති කරගත යුතු ශක්තිය නම් බල ධර්ම වඩවා ගැනීමයි.

---

පුණ්‍යානුමෝදනය :- බු.ව.2552 බිනර පුන් පොහෝ දින ධර්ම දානය වශයෙන් මෙම දහම් පත්‍රිකාව සකස් කොට (පාඨවත ගුණානන්ද හිමි) වන අප විසින් වැලිගම්පිටියේ පදිංචි සත්ගුණවත් කාරියප්පෙරුම මහතා සහ මහත්මියගේ ධන පරිත්‍යාගයෙන් මුද්‍රණය කරන ලදී. මෙම පිංකම එතුමා ඇතුළු ඔබ සැමටම 'නිර්වාණ අවබෝධය පිණිස හේතු වේවා' යි ප්‍රාර්ථනා කරමි.

උපකාරක පොත් :- බෝධි පාක්ෂික ධර්ම , ශාසනික පරිත්‍රාණ විධිය, පොතුරු සංගිය

තෙරුවන් සරණයි !

3 තථාගත ශ්‍රාවක

4 චක්‍රවර්ති රජ

1 බුද්ධානුස්සති භාවනාව


මෛත්‍රී භාවනාව 2

**ආර්යය අෂ්ඨාංගික මාර්ගය**

| | මාර්ග අංග | අර්ථය/චෛතසිකය | සම්පූර්ණ විය යුතු කරුණු |
|---|---|---|---|
| පඤ්ඤා ① | සම්‍යග් දෘෂ්ටිය 02 | නිවැරදි දැකීම. (අමෝහ/ප්‍රඥා චෛතසිකය) | 1. දශ වස්තුක සම්‍යග් දෘෂ්ටිය 2. චතුස්සත්‍ය සම්‍යග් දෘෂ්ටිය යන දෙකින් දෙවන සම්‍යග් දෘෂ්ටිය ඇතිකර ගැනීම ප්‍රධාන වේ. |
| පඤ්ඤා ② | සම්‍යග් සංකල්ප 03 | යහපත් කල්පනාව (විතර්ක චෛතසිකය) | 1. නෛෂ්ක්‍රම්‍යය (පඤ්ච කාමයන්ගෙන් මිදීමට සිතීම.) 2. අව්‍යාපාද 3. අවිහිංසා යන සංකල්පනා ඇතිකර ගැනීම. |
| ශීල ③ | සම්‍යග් වචන 04 | අයහපත් වචනයෙන් වැළකීම (විරති චෛතසිකය) | 1. මුසාවාදා 2. පිසුනාවාචා 3. පරුෂාවාචා 4. සම්ඵප්‍රලාප යන මේවා කීමෙන් වැළකී සිටීම. |
| ශීල ④ | සම්‍යග් කර්මාන්ත 03 | අයහපත් කායකර්ම වලින් වැළකීම (විරති චෛතසිකය) | 1. ප්‍රාණ ඝාතය 2. අදත්තාදානය 3. කාමයෙහි වරදවා හැසිරීම, යන මෙම ක්‍රියාවන්ගෙන් වැළකීම. |
| ශීල ⑤ | සම්‍යග් ආජීවය 05 | අයහපත් දිවිපැවැත්මෙන් වැළකීම (විරති චෛතසිකය) | 1. ආයුධ වෙළඳාම 2. වහල් වෙළඳාම 3. මස් වෙළඳාම 4.මත්පැන් වෙළඳාම 5. විෂ වෙළඳාම ආදියෙන් ජීවත් නොවීම. |
| සමාධි ⑥ | සම්‍යග් ව්‍යායාමය 04 | යහපත් උත්සාහය (වීර්ය චෛතසිකය) | 1. උපන් අකුසල් දුරු කිරීමට. 2. නුපන් අකුසල් නුපදීමට. 3. උපන් කුසල් දියුණු කිරීමට. 4. නුපන් කුසල් උපදවා ගැනීමට උත්සාහ කිරීම. |
| සමාධි ⑦ | සම්‍යක් ස්මෘතිය 04 | යහපත් සිහිය. (සති චෛතසිකය) | 1. කාය 2. වේදනා 3. චිත්ත 4.ධම්ම යන අරමුණු තුළ සිහිය මනා කොට පැවැත්වීම.(සතර සතිපට්ඨානය) |
| සමාධි ⑧ | සම්‍යග් සමාධිය 04 | යහපත් එකඟ බව (ඒකාග්‍රතා චෛතසිකය) | 1. ප්‍රථම ධ්‍යාන 2.ද්විතීය ධ්‍යාන 3. තෘතීය ධ්‍යාන 4. චතුර්ථ ධ්‍යාන යන්හි සමාධිය, එකඟ බව. (අභිධර්ම දේශනාව අනුව ධ්‍යාන 5 කි.) |

සැලකිය යුතු කරුණු :-

* ශීල, සමාධි, ප්‍රඥා, ලෙස ආර්යය අෂ්ඨාංගික මාර්ගය හැඳින්වූවත් සටහන් වීමේදී ප්‍රඥාව මුලට යෙදෙන්නේ එහි සම්‍යග් දෘෂ්ටිය දියුණු වීම අනෙක් චෛතසික ධර්මයන්ගේ දියුණුවට උපකාරයෙන් දියුණු වන බැවිනි.ඒවා වැඩෙන්නේ චක්‍රයක් ලෙසට එකිනෙකට සහාය වීමෙනි.
* ප්‍රඥාවන්තයෙකුට සිල් රැකීම පහසුය.එම නිසා සිතේ සමාධිය ඇතිවේ. සමාධි සිත තව තවත් ප්‍රඥාව දියුණු වීමට උපකාර වේ. මෙසේ ශීල නිසා සමාධියත් සමාධිය නිසා ප්‍රඥාවත් ඔවුනොවුන් බලවත්ව වැඩේ.




* පංච ශීලය රකින්නා විශේෂ දිනයන්හිදී අට සිල්, නව සිල්, දස සිල් රැකීමෙන් පංච ශීලය රැකීමට මහත් බලයක් වේ.
* ආර්යය අෂ්ඨාංගික මාර්ගයේ 'සම්‍යග් කර්මාන්ත' පංච ශීලය රකින්නෙකු අතින් ආරක්ෂා වන අතර අනෙක් මාර්ග අංග වැඩීමටත් උපකාරී වේ.එම නිසා පංච ශීලය රකින ගිහි සැප විඳින පිංවතුන්ට පවා මාර්ග ඵල අවබෝධ කර ගත හැක.
* ආර්යය අෂ්ඨාංගික මාර්ගයේ (මධ්‍යම ප්‍රතිපදාව) විරති චෛතසික තුනෙන් එකක් පමණක් එක් සිතක පහළ වේ. අනෙක් චෛතසික 4,5,6, වශයෙන් එක් සිතක ඇති වුවත් මාර්ගස්ථ සිතේ විරති තුනම හා අනෙක් සියළු චෛතසික පහළ වේ.
මෙම සිසල්ල පළමු වර සිතේ පහළ වීම (චිත්ත වීථිය) සෝවාන් මාර්ග ඵල, 2 වන වර, 3 වන වර, 4වන වර ආදී කෙදිනක හෝ මෙම චෛතසික ධර්ම සමග චිත්ත වීථි ඇතිවීම සකෘදාගාමී, අනාගාමී, අර්හත් මාර්ග ඵලයන්ට පත් වීමයි.දුක් කෙළවර කිරීමයි.

සමථ භාවනා මගින් (විදර්ශනාවට කිසිම ධ්‍යානයක සිට යොමුවිය හැක.)
* උපචාර (ධ්‍යානයන්ට ආසන්න සිත) 1වන ධ්‍යාන(අර්පණා), 2වන ධ්‍යාන, 3වන ධ්‍යාන, 4වන ධ්‍යාන
1----5 2----5 3----5 4----5

5 වන ධ්‍යාන 4-----5 → අරූප ධ්‍යාන වැඩීම කළ හැක. → අභිඥා උපදවීම කළ හැක.

විදර්ශනා භාවනා මගින්
* උපචාර (ධ්‍යානයන්ට ආසන්න සිත) 1වන ධ්‍යාන(අර්පණා), සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත් මාර්ග ඵලයන්ට පත්වීමයි.
1---5 1---5 1---5 1---5 1---5

ධ්‍යාන අංග චෛතසික :-

| | | | | |
|---|---|---|---|---|
| විතර්ක | විචාර | ප්‍රීති | සුඛ / උපේක්ෂා (වේදනා චෛතසිකය) | ඒකාග්‍රතා |
| 1 | 2 | 3 | 4 | 5 |

3 අශුභ භාවනාව

මරණානුස්සති භාවනාව 4

1. සඤ්ජීව නරකය
ධර්මපොත් විනාශ කළවුන්, බෝධි වෘක්ෂ කපා හෙළවුන්
වසර මිලියන 9 : දින 1 , ආයුෂ ඒ නියා වර්ෂ 500

2. කාලසූත්‍ර නරකය
දුසිල් සිවුරු පෙරවූ භික්ෂූන්, ද කරළු මැසූවන්, පාපස මරුවන්
වසර මිලියන 36 : දින 1 , ආයුෂ ඒ නියා වර්ෂ 1000

3. සංඝාත නරකය
සිල්වතුන්ට වධ දුන්, කොල්ල කෑවුන්, උතුමන් බින්දවුන්, ගල් පෙරළා සතුන් මැරුවන්
වසර මිලියන 144 : දින 1 , ආයුෂ ඒ නියා වර්ෂ 2000


4. රෞරව නරකය
මව් පියන්ට තළා පෙළා දැමූ, එක් කුස උපන් බෑයන් නෑදෑමිත්‍රයන් පෙළා දැමූ උන්
වසර මිලියන 576 : දින 1 , ආයුෂ ඒ නියා වර්ෂ 4000

5. මහා රෞරව නරකය
පන් සිල්, අට සිල්, දස සිල්, සාමණේර, උපසපන් උතුමන්ට වධ දුන්, මැරූ අය
වසර මිලියන 2304 : දින 1 , ආයුෂ ඒ නියා වර්ෂ 8000

6. තාප නරකය
ඡන්ද, ද්වේෂ, භය, මෝහ සතර අගති පාලකයන්, දුවිලි වොවිද්දේ අය ගත්උන්
වසර මිලියන 9216 : දින 1 , ආයුෂ ඒ නියා වර්ෂ 16000

7. ප්‍රතාප නරකය
සොරුන්වෙන් අයුක්තිය යුක්ති කළ වුන්
ආයුෂ : දෙගව් දිග, පළල, උස ගලක් වසර 100 ට වරක් දිවසළුවකින් 1 වරක් බැගින් පිසදැමීමෙන් ඕම මට්ටමට සම වන තෙක්

8. අවීචිමහානරකය
පංචානන්තරිය පාප කර්ම කළ වුන්, නියත මිථ්‍යාදෘෂ්ටිකයන්
ආයුෂ : සතරගව් දිග, පළල, උස ගලක් වසර 100 ට වරක් දිවසළුවකින් 1 වරක් බැගින් පිසදැමීමෙන් ඕම මට්ටමට සම වන තෙක්




පරිවාර උස්සද නරක 16 : 1. අබ්බුද, 2. නිරබ්බුද, 3. අබබ, 4. අටට, 5. අහහ, 6. කුමුද, 7. සොගන්ධික, 8. උප්පල, 9. පදුම, 10. පුණ්ඩරීක, 11. කුථ, 12. කුක්කුළ, 13. සොල්ලිම්බලි, 14. අසිපත්තවන, 15. ඛාරොදක, 16. ලෝකුම්භ • දස මහා නරක

පරිවාර කුඩා නරක 16 : වේතරණී, සොණසාද, සිඞ්ඝාටක, සත්තිසූල, බලිසකිර, ලොහකණ්ටක, සිම්බලි, සීත, අයුරාමපල, ලොහසෙල්කලු, සොහුරකෙස්, අගකුළු, සිසිරන්‍රූන, කොරහ, ගාප, පලුකහ

පරිවාර කුඩා නරක 16 : මංසපෙසි, සාකුණ, මංසපිණ්ඩ, අසිලොම, සත්තිලොම, උසුලොම, රජ්ජුගන්ධ, සූචික, කණ්ඩූපම, කුටාගාර, මිල්හගන්ධ, නිච්ඡවි, මහාදුග්ගන්ධ, සිඛිපම, අසිපත, සංකුලා

පරිවාර කුඩා නරක 16 : සමිද්ධිදෘශ, පාණිපිණ්ඩ, කාකොල, මහසංඥ, සල්ලිවිඩ, මහාපාදු, විහසල්ප, නිසල්ප, නිකල්ප, සිදුකල්ප, පණ්ඩුකල්ප, සම්සකල්ප, අවීටකල්ප, හවිකල්ප, දහකල්ප, විසාදනකල්ප

පරිවාර කුඩා නරක 16 : මාදනකල්ප, සෙරපකල්ප, සිඳුද්දනකල්ප, පණ්ඩිදනකල්ප, සොලුකකල්ප, අවිමරණාව, මහාදුම, උච්චාරුල්ප, ආරාමද්දන, නිරයග්ගි, සොණුද්‍රයග්ගි, මුද්ගාරකයග්ගි, දුක්කරග්ගි, අනුපරිධියග්ගි, ඛුම්භයග්ගි, අනුයග්ගි

පරිවාර කුඩා නරක 16 : විතරයග්ගි, වාණිසයග්ගි, සාසයග්ගි, සොලුයග්ගි, කුටිලුකියග්ගි, පරාජණිකාය, විටයග්ගි, සොටිග්ගි, රජයග්ගි, විලුපයග්ගි, උසයග්ගි, උච්චාකියග්ගි, මුට්ඨාලූනගි, නක්කාලිප්තාය, පරසලුයග්ගි, උද්ධගෝරක

පරිවාර කුඩා නරක 16 : කුත්පණුසලුග්ගි, සොලුනදු, කටියග්ගි, ගසබ්යග්ගි, කුසග්ගි, නිවාරිත, උච්චකුම්භා, ගුම්භතාප, සසල්ප, කුරග්ගි, නිත්පසලුතාලුග, කුත්කුටග්ගි, පත්තග්ගි, වලුකලුග්ගි, ජම්බීයග්ගි, මිතත්තාප

පරිවාර කුඩා නරක 16 : 1. අපවිච්ඡෙදයග්ගි, 2. කුලුකුයග්ගි, 3. ගුත්‍රපත්තක, 4. කිලෙලුයග්ගි, 5. ඉන්ද්‍රියඅනුප්පත්ති, 6. කුසග්ගි, 7. වේරළු, 8. ගුම්ල්වින, 9. නොදනී, 10. නොදනී, 11. නොදනී, 12. නොදනී, 13. නොදනී, 14. නොදනී, 15. නොදනී, 16. නොදනී

සැ.යු. සඤ්ජීව නරකය වටා ඇති උස්සද නරක 16 නරකය වට අනෙක් කුඩා නරක පොතේ ඉදිරිපත් කළ පිළිවෙලට 16 බැගින් පොරත් කර ඇත. ඒ ඒ කුඩා නරක නියත වශයෙන් ඇත්තේ 8 මහා නරක අතරත් කරුව කරුත් විරාලයි විෂා බැලිය යුත්තෙ.

සැලුම: පූජ්‍ය කලුකොළුයාවේ පඤ්ඤාසෙකර නාහිමි විසින් ප්‍රථම වරු 1938 දී සම්පාදිත නරකයේ 120 ක විස්තර ඇතුලු මහා නිම් පතකය පොත හා පවිත් මුද්‍රණ ආයුරෙන් අභිධර්මයට ඇදි පිනක් දෙනාට ධර්මදානය පිණිස, ; ගැළපුණු විකුණිකය එසේ අප විසින් මේ සටහන් කෝ ඉතාම ඉක්මන් සටහන් දී යෝවන් මාර්ගය සිහින් පසා නිර්මාණය කරන ලදී. ධර්මදානයට, ධර්මඅවබෝධයට ඉදි පින් සම්පත්තේ මෙම පින් අනුමෝදන් වෙත්වා, සැමට එම් මුදුණාර සර ධර්ම අහාර කර යෙත්වා, නිවන් සැප ප්‍රාර්ථනා කෙරෙත්වා!

ධර්මදානයට සමගවී.
විහිණීම සතුරා පාගයි.


A. යොදුන් 9

B. යොදුන් 1000

C. යොදුන් 1000

D. යොදුන් 9

E. යොදුන් 15000




මෙම පත්‍රිකාව e-mail මිත්‍රේ පොමින්ද් ලබා ගත හැක. විමසීම් 0728098052 මට් 3

(1) ආයු (2) වර්ණ

## අකුසල් සිත් දොළොස

* සතර අපායෙහි උත්පත්තිය සහ බොහෝ කායික මානසික පීඩා ඇති කරන සිත් මේවාය.

අකුශල සිත්වල අකුශල චෛතසික යෙදෙන අයුරු: 1. මෝහය 2. අහිරිකය 3. අනොත්තප්පය 4. උද්ධච්චය

| | | අකුසල සිත්හි ප්‍රභේද | 1-4 | 5. ලෝභය | 6. දිට්ඨිය | 7. මානය | 8. ද්වේෂය | 9. ඊර්ෂ්‍යාව | 10. මාත්සර්යය | 11. කුක්කුච්චය | 12. ථීනය | 13. මිද්ධය | 14. විචිකිච්ඡාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලෝභ සිත් (08) | 1 | සෝමනස්ස සහගත දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත අසංස්කාරික සිත | ✓ | ✓ | ✓ | | | | | | | | |
| | 2 | සෝමනස්ස සහගත දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත සසංඛාරික සිත | ✓ | ✓ | ✓ | | | | | | ✓ | ✓ | |
| | 3 | සෝමනස්ස සහගත දෘෂ්ටිගත විප්‍රයුක්ත අසංස්කාරික සිත | ✓ | ✓ | | ✓ | | | | | | | |
| | 4 | සෝමනස්ස සහගත දෘෂ්ටිගත විප්‍රයුක්ත සසංඛාරික සිත | ✓ | ✓ | | ✓ | | | | | ✓ | ✓ | |
| | 5 | උපේක්ෂා සහගත දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත අසංස්කාරික සිත | ✓ | ✓ | ✓ | | | | | | | | |
| | 6 | උපේක්ෂා සහගත දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත සසංඛාරික සිත | ✓ | ✓ | ✓ | | | | | | ✓ | ✓ | |
| | 7 | උපේක්ෂා සහගත දෘෂ්ටිගත විප්‍රයුක්ත අසංස්කාරික සිත | ✓ | ✓ | | ✓ | | | | | | | |
| | 8 | උපේක්ෂා සහගත දෘෂ්ටිගත විප්‍රයුක්ත සසංඛාරික සිත | ✓ | ✓ | | ✓ | | | | | ✓ | ✓ | |
| ද්වේශ සිත් (02) | 1 | දෝමනස්ස සහගත පටිඝ සම්ප්‍රයුක්ත අසංස්කාරික සිත | ✓ | | | | ✓ | ✓ | ✓ | ✓ | | | |
| | 2 | දෝමනස්ස සහගත පටිඝ සම්ප්‍රයුක්ත සසංඛාරික සිත | ✓ | | | | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | |
| මෝහ සිත් (02) | 1 | උපේක්ෂා සහගත විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිත(අසංස්කාරි) | ✓ | | | | | | | | | | ✓ |
| | 2 | උපේක්ෂා සහගත උද්ධච්ච සම්ප්‍රයුක්ත සිත(අසංස්කාරි) | ✓ | | | | | | | | | | |

* ලෝභ, ද්වේශ මෝහ සිත් වලින් කෙරෙන දස අකුශල කර්ම පථ

- ලෝභ සිත්: ① ප්‍රාණඝාතය ② අදත්තාදානය ③ කාමමිථ්‍යාචාරය ④ මුසාවාදය ⑤ පිසුනාවාචා ⑥ පරුෂවචනය ⑦ සම්ඵප්‍රලාපය ⑧ අභිධ්‍යාව ⑨ ව්‍යාපාදය ⑩ මිථ්‍යාදෘෂ්ටිය
- ද්වේශ සිත්: ① ② ③ ④ ⑤ ⑥ ⑦ ⑨
- මෝහ සිත්: මෝහය සියලු අකුශල සිත් වල යෙදේ. උද්ධච්ච සිත ප්‍රතිසන්ධිය නොගෙනදෙයි

**වචන තේරුම :-**

- * සෝමනස්ස - සන්තෝෂයෙන්
- * උපේක්ෂා - මධ්‍යස්ථ
- * දෘෂ්ටි ගත - වැරදි විශ්වාසය
- * පටිඝ - ගැටීම, තරහව
- * සම්ප්‍රයුක්ත - යුක්ත වීම
- * විප්‍රයුක්ත - යුක්ත නොවීම
- * අසංස්කාරි - මෙහෙයවීමක් නැති වූ
- * සසංස්කාරි - මෙහෙයවීමක් ඇති වූ
- * ථීනය - සිතේ අලස බව

**සිත හා චෛතසික අතර සමාන කරුණු :-**

1. සිත සමග එකට ඉපදීම
2. සිත සමග එකට නිරුද්ධ වීම
3. සිතින් ගන්නා අරමුණම ගැනීම
4. සිතට නිශ්‍රය වූ වස්තුවම නිශ්‍රය කර ගැනීම

**සිත :-** යම් සන්තානයක් තුළ පහළ විය හැකි සිත් ගණන 121 කි. එයින් සතර අපා උත්පත්තියක් ගෙන දෙන අකුශල සිත් (12-1-11) කි. තවද පෙර කරන ලද කුශලා කුශල විපාක සිත් 18 (කු.වි 8, අ.වි. 7, ක්‍රි.3) අහේතුක සිත් වේ. මෙලොව කරන ලද කුශල සිත් 08 ද එහි විපාක සිත් 08 ද රහතන් වහන්සේලා සිදු කරන කුශල කර්ම ක්‍රියා වශයෙන් 08 ක් ද වශයෙන් කාමාවචර සිත් 24 කි. රූපාවචර ධ්‍යාන පස වඩවා ගැනීමෙන් කු: 05, වි: 05, ක්‍රි: 05 වශයෙන් සිත් 15 ක් ඉපදවිය හැකිය. ඒ වාගේම අරූප ධ්‍යාන වැඩීම තුළින් කු:04 වි:04 ක්‍රි: 04 ක් වශයෙන් සිත් 12 ක් ඉපදවිය හැකිය. ලෝකෝත්තර මාර්ග 04-ඵල 04 ධ්‍යාන පසෙන්ම ඉපදවිය හැකි නිසා 8 x 5 - 40 ක් ලෝකෝත්තර සිත් අත්තේය. මෙලෙස සියළු සිත් 121 ක් ඇත්තේය.

- කු.වි. - කුසල විපාක
- අ.වි. - අකුසල විපාක
- ක්‍රි. - ක්‍රියා සිත්
- කු. - කුසල් සිත්
- වි. - විපාක සිත්

**චෛතසික :-** ඒ ඒ සිත්හි බැඳී උපදින සියළු චෛතසික ගණන 52 කි. එයින් සෑම සිතකම උපදින චෛතසික ගණන 07 කි. කුශලාකුශල සිත් වල භේදයකින් තොරව සුදුසු පරිදි උපදින චෛතසික 06 ක්ද අකුශල සිත්හි උපදින චෛතසික 14 ක්ද ඇත. කුශල සිත් වල පමණක් සුදුසු පරිදි යෙදෙන චෛතසික 19 ක්ද, විරති 03, අප්‍රමාණ්‍ය 02, ප්‍රඥා හෙවත් අමෝහය වශයෙන් යෙදෙන චෛතසික 06 ක් ඇත. ලෝකෝත්තර මාර්ග සිත් පහළ වීමේදී පමණක් විරති චෛතසික එකවිට යෙදේ. එක සිතක යෙදෙන වැඩිම චෛතසික ගණන 37කි.

**විශේෂ කරුණු :-** * සිතින් අරමුණු ගැනීම සිදු කරන අතර එයට බලය ශක්තිය ලැබෙන්නේ යෙදෙන චෛතසික වලිනි. චෛතසික 52 ම සියළු සිත් වල යෙදෙන බලවත්ම චේතනා චෛතසිකය වන අතර අනෙක් චෛතසික රජු වටා ඇති ඇමතිවරු සේ චේතනාව මුල්කොට ක්‍රියා කරයි. කර්මය වන්නේද සංයෝග වන චෛතසිකයන්ගෙන් බලවත් වන චේතනා චෛතසිකය බැවින් බුදුන් වහන්සේ "චේතනා හං භික්ඛවේ කම්මං වදාමි" යි වදාල සේක.

**අකුශලයෙන් වළකින අවස්ථා :-**

| | |
|---|---|
| සම්පත්ත විරතිය | පාපයක් කිරීමට එළඹි අවස්ථාවේ එහි ආදීනව සලකා වැළකීම |
| සමාදාන විරතිය | පාපයක් කිරීමට එළඹි අවස්ථාවේ සමාදන් වූ සිල් පද සලකා එයින් වැළකීම |
| සමුච්ඡේද විරතිය | මාර්ග සිත් පහළ වූ විට පාප සිත් විනාශ වීමෙන් පාපයක් කිසිවිට සිදු නොවීම |


පුණ්‍යානුමෝදනය :- බු.ව.2551 ඉල් පුන් පොහෝ දින ධර්ම දානය වශයෙන් මෙම දහම් පත්‍රිකාව සකස් කොට (සඩවත ගුණානන්ද හිමි) වන අප විසින් පරිත්‍යාග කරන ලදී. මෙම පින්කම ඔබ සැමට නිවන් සැප පිණිස හේතු වේවායි ! අනුමෝදනාය කරමි

උපකාරක පොත් :- අභිධර්ම මාර්ගය, සුවිසි මහා ගුණ, (රේරුකානේ නාහිමි රචිත) හා වෙනත් - රන් වැට ඉතිහාසය

(3) සැප තෙරුවන් සරණයි ! බල (4)

# පාරමිතා විභංගය

0777 77 2555



**සැප ගෙන දෙන දෙලොස් කරුණු**

| | සැපයට හේතු | අදාල ගාථා ධර්ම | |
|---|---|---|---|
| ① | (1) කළ පුන්නයන් පැමිණි කල්හි යහළුවන් ඇති බව සැපයකි.<br>(2) ලද දෙයින් සතුටු වීම සැපයකි.<br>(3) ජීවිත කෙළවර දී පින් ඇති බව සැපයකි.<br>(4) සියලු දුක් නසන අර්හත් ඵලය සැපයකි. | " අත්ථම්හි ජාතම්හි සුඛා සහායා<br>තුට්ඨී සුඛායා ඉතරීතරේන<br>පුඤ්ඤං සුඛං ජීවිත සංඛයම්හි<br>සබ්බස්ස දුක්ඛස්ස සුඛං පහාණං " | (ධම්ම පදය නාගවග්ග 12 වන ගාථාව) |
| ② | (5) ලෝකයෙහි මවට උපස්ථාන කරන බවද සැපයට කරුණකි.<br>(6) ලෝකයේ පියාට උපස්ථාන කරන බවද සැපයට කරුණකි.<br>(7) පැවිද්දන්ට උපස්ථාන කරන බවද සැපයට කරුණකි.<br>(8) පව් දුරු කළ බුදු, පසේ බුදුවරයන්ට, බුද්ධ ශ්‍රාවකයන්ට උපස්ථාන කරන බවද සැපයට කරුණකි. | " සුඛා මත්තෙය්‍යතා ලොකෙ<br>අථො පෙත්තෙය්‍යතා සුඛා<br>සුඛා සාමඤ්ඤතා ලොකෙ<br>අථො බ්‍රහ්මඤ්ඤතා සුඛා " | (ධම්ම පදය නාගවග්ග 13 වන ගාථාව) |
| ③ | (9) ශීලය ජරාව දක්වාම සැපයට කරුණකි.<br>(10) මනා කොට පිහිටි ශ්‍රද්ධාව සැපයට කරුණකි.<br>(11) ප්‍රඥාව ලැබීම සැපයට කරුණකි.<br>(12) පව් නො කිරීමද සැපයට කරුණකි. | " සුඛං යාව ජරා සීලං<br>සුඛා සද්ධා පතිට්ඨිතා<br>සුඛො පඤ්ඤාය පටිලාභො<br>පාපානං අකරණං සුඛං " | (ධ. පදය නාගවග්ග 14 වන ගාථාව, මිදුලපත් මිලා කිරීමට පැමිණි මාරයා පලවා ඒ නිමිති කොට වදාළ ගාථා තුනකි.) |

* *මෙහි සඳහන් විස්තර කරුණු සිදු කර ගැනීමට හා ලැබීමට පෙර කළ පුණ්‍ය ශක්තිය ප්‍රධාන වේ. මේ භවයේ පෙරැති උතුම් චරිත්‍ර මාර්ග ධර්ම ඉටු කිරීමෙන් මෙලොව පරලොව සැපය පිණිසම හේතු වේ. දෙවියන් සහිත ලෝකයාගේ ගෞරවාදරයට පාත්‍ර වේ. ඒ වගේම ලෝකෝත්තර සැප ලබා ගත හැකි වීමට මිනිසත් බව ලත් මෙලොවම ගුණධර්ම වඩා සතුටු වෙමින් සොඳුරු ද විවිත්ව.*

**ජීවිතයේ අවසාන මොහොත** ① එක් ජීවිතයක අවසාන මොහොත චුති චිත්තය පහළ වන අවස්ථාවයි. චුති සිතට අරමුණු වන ආරම්මණයට අනුව අභිනව භවය තීරණය වන්නේය. එබැවින් අතීතයේ සිට සැදැහැවතුන් ගත කරන ජීවිතය තුළදී සිදු කරන පිංකම් මනසෙහි රඳවා ගැනීම සඳහා පිං පොතක් සකස් කරගෙන ඇත. මෙම ජීවිතයේ කෙළවරදී එය කියවා හෝ කියවාගෙන සිතේ සතුටින් සිට අවසාන මොහොතේ සිහි මුළා නොවී ජීවිතයෙන් සමු ගැනීම ඒ තුළින් බලාපොරොත්තු විය. මෙම නිසාම බුදුනට අභිනව භවය දෙව්-මිනිස් සුගති භවයන් ලබන්නට හේතු වී ඇත. ඒ බව දුටුගැමුණු රජතුමාගේ ජීවිතයෙන්ද මනාව පැහැදිලි වන්නේය. ජීවිත කෙළවරදී පින්කර ඇති බව චුති චිත්තයට කර්මය, කර්ම නිමිත්ත, ගති නිමිත්ත වශයෙන් ඉදිරිපත් වන එක් අරමුණක් යහපත් කර ගැනීමට හේතු වේ.

**ගුණ උතුමන් පෙළීමෙන් උපදින බිහිසුණු නරක සිහිපයක්** ②
* ලෝකාන්තරික නරකය - හොරුවන් හා මව්පියන් අනාථයා බොරු දිවුරමින් කළෝ ද මෙහි පැසෙති.
* මහාරෞරව නරකය - මහණ බමුණන් හා මව්පියන් නින්දාවීමට රැවටීම් ආදි අගෞරව කළෝ ද මෙහි පැසෙති.
* අවීචි මහා නරකය - මව්පිය, මහණ බමුණන් බිම සිටියදී උසසුන් වල සිටියෝද, රළු බසින් අවමන් කළෝද මෙහි පැසෙති.
* ගොසුරැයන් නරකය - මහණ බමුණන්ට, මව්පියන්ට ආක්‍රොශ පරිභව කළෝ ද මෙහි පැසෙති.
* පදුම නරකය
* පාණිනිස්ස නරකය } - ඍෂීන්ට ගැරහූවෝ මෙම නරකයන්හි පැසෙති. (අවීචි නරකය වටා පිහිටි බිහිසුණු නරක 128 ක් සිහිපයක් මෙහි සඳහන් කොට ඇත.) (සද්ධර්ම රත්නාවලිය සහ ප්‍රදීපිකාව)

**බුදු රජුන් මහානාම ශාක්‍ය රජු සැනසීම** ③ " බොහෝ මිනිසුන් දහම් සිදු කරගෙන සිටියද යම් යම් හට්ටු වලදී නිරන්තරයෙන් කුණුරුවන් කෙරෙහි සිහිය නොමැති වන නිසාවෙන් එවැනි අවස්ථාවක මිය ගිය හොත් කොතැනක මා උත්පත්තියක් ලබාවිද ? " යන ප්‍රශ්නය මහානාම ශාක්‍ය රජතුමා බුදුන් වහන්සේගෙන් විමසීය .

" බොහෝ කලක් තුළදී යමෙකුගේ සිතක් ශ්‍රද්ධාව, සීලය, ශ්‍රැතය (බොහෝ ධර්මය අසා ධාරණය කොට සිටීම) ත්‍යාගය හා ප්‍රඥාව දියුණු වී තිබේ නම් යමෙක් ගිතෙල් හෝ තෙල් බඳුනක් ඉතා ගැඹුරු වූ පොකුණකට බහා බිඳ දැමුවහොත් ඒ බඳුන් කැබලි පතුලට ගිලා බසින මුත් එහි ඇති ගිතෙල් හෝ තෙල් දිය මතු පිටට පැමිණෙන්නේය. රජතුමනි! එසේම ඔබ බොහෝ කලක් ශ්‍රද්ධාදී මෙම කුසල ධර්ම බොහෝ දියුණු කර ඇති බැවින් මරණය නිරුපද්‍රිතව සිදු වන්නේයැයි " බුදුන් වහන්සේ වදාළහ.

**විශේෂ කරුණක්** යමෙකුට අතීතයේ සිදුවූ අකුසල කර්ම නිතර නිතර සිතට මතුවී පීඩාවක් ඇති විය හැකිය. එවිට එම අරමුණු විදර්ශනාවට නගා මහත් කුසලයක් සිදු කර ගත හැකිය. ඒ සඳහා අකුසල කර්මයට අදාල වූ පංච පුද්ගල හා වස්තූන්ගෙන් ලැබුණු රූප, ශබ්ද ආදී බාහිර අරමුණුද ඊට ස්පර්ශ වූ කාය වස්තු, ශ්‍රෝත ආදී අභ්‍යන්තර ප්‍රසාද රූප සහ එම ස්පර්ශයෙන් අරමුණු කොට ඇති වූ ඇලීම - ගැටීම හා මධ්‍යස්ථ බවට පත්වූ චිත්ත-චෛතසිකයෝ සියල්ලම මේ මොහොත වන විට ඇතිවී, පැවති, නැතිවී ඇති බැවින් අතීතය. මේ මොහොතේ ඇතිවන සියල්ලමත් එසේම වන්නේය. අනාගතයේ සියල්ලමත් එසේම අතීත වන්නේ යැයි සිහි කිරීමට පුරුදු කර ගැනීමෙන් මහත් සැනසිල්ලක් ඇති කර ගත හැකි වෙයි.

---

**පුණ්‍යානුමෝදනය :-** බු.ව. 2553 නිකිණි පුන් පොහෝ දින ධර්ම දානය ලෙස මෙම දහම් පත්‍රිකාව (සංස්කරණ ගුණානන්ද හිමි) වන අප විසින් සකස් කොට වැලිගම්පිටියේ පදිංචි සැදැහැති පී. කුලරත්න කාරියප්පෙරුම මහතාගේ ධන පරිත්‍යාගයෙන් මුද්‍රණය කොට බෙදා දෙන ලදී. මෙම ධර්ම දානය එතුමා ඇතුළු සියලු සත්වයන්ට නිවන් අවබෝධය පිණිස හේතු වේවායි ප්‍රාර්ථනා කරමි.

**උපකාරක පොත් :-** ශාසනාව තරණය, බුද්ධ නීති සංග්‍රහය (පේරුසාගේ චන්ද්‍රවිමල නායක හිමි රචිත)
අංගුත්තර නිකාය V, සංයුත්ත නිකාය-2 (ත්‍රිපිටක ග්‍රන්ථ)

*තෙරුවන් සරණයි !*



[illegible] - [illegible] 034-2282859

1 ශාරීරික රෝග

2 මානසික රෝග

| කු<br>ස<br>ල්<br>සි<br>ත්<br>අ<br>ට | සදෙව් ලොව හා මනුලොව උප්පත්තිද දෙලොව කායික මානසික සුවද ඇති කරන සිත් මේවාය | | කුසල සිත් වල 'හේතු ධර්ම' යෙදෙන අයුරු →<br>කාමාවචර කුසල සිත් වල ප්‍රභේද ↓ | අලෝභය | අද්වේෂය | අමෝහය |
|---|---|---|---|---|---|---|
| | ත්‍රිහේතුක සිත් (02) | 1 | සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංස්කාරික සිත | ✓ | ✓ | ✓ |
| | | 2 | සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත සසංස්කාරික සිත | ✓ | ✓ | ✓ |
| | ද්විහේතුක සිත් (02) | 3 | සෝමනස්ස සහගත ඥාන විප්‍රයුක්ත අසංස්කාරික සිත | ✓ | ✓ | |
| | | 4 | සෝමනස්ස සහගත ඥාන විප්‍රයුක්ත සසංස්කාරික සිත | ✓ | ✓ | |
| | ත්‍රිහේතුක සිත් (02) | 5 | උපේක්ෂා සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංස්කාරික සිත | ✓ | ✓ | ✓ |
| | | 6 | උපේක්ෂා සහගත ඥාන සම්ප්‍රයුක්ත සසංස්කාරික සිත | ✓ | ✓ | ✓ |
| | ද්විහේතුක සිත් (02) | 7 | උපේක්ෂා සහගත ඥාන විප්‍රයුක්ත අසංස්කාරික සිත | ✓ | ✓ | |
| | | 8 | උපේක්ෂා සහගත ඥාන විප්‍රයුක්ත සසංස්කාරික සිත | ✓ | ✓ | |
| | | | * දස පුණ්‍ය ක්‍රියාවන් මෙම සිත් අටෙන්ම කළ හැකි බැවින් දස පුණ්‍ය ක්‍රියා සිත් 80 කි. (8X10 = 80) | | | |

**දස පුණ්‍ය ක්‍රියා**

1. දානය
2. සීලය
3. භාවනාව
4. අපචායන
5. වෙයාවච්ච
6. ප්‍රාප්තිදානය
7. පත්තානුමෝදනය
8. ධර්ම ශ්‍රවණය
9. ධර්ම දේශනය
10. දිට්ඨිජුකම්මය

ප්‍රති සන්ධිය :- *(මරණාසන්න විපාක සිතට අනුව ලබන ප්‍රතිසන්ධිය)*

1. ත්‍රි හේතුක උත්කෘෂ්ඨ විපාක සිත → ත්‍රි හේතුක ප්‍රතිසන්ධියක් ඇති කරයි.
2. ත්‍රි හේතුක ඕමක විපාක සිත → ද්වි හේතුක ප්‍රතිසන්ධියක් ඇති කරයි.
3. ද්වි හේතුක විපාක සිත → ද්වි හේතුක හෝ අහේතුක ප්‍රති සන්ධියක් ඇති කරයි.

බුදුන් වහන්සේ ත්‍රිහේතුක සිත් පහල කරගන්නට උපදෙස් දුන් ආකාරය }

" පුබ්බේව දානා සුමනෝ - "දන් දීමට පෙර සතුටු සිත් ඇති කර ගන්නේය.
දදං චිත්තං පසාදයෙ - දෙන කල්හි සිත පහදවා ගන්නේය.
දත්වා අත්තමනො හොති - දීමෙන් පසු සතුටු සිත් ඇති කර ගන්නේය.
එසා යඤ්ඤස්ස සම්පදා" - මේ කරුණු තුන දායකයාගේ සම්පත්තිය වන්නේය."

*(මෙය දන් දීමේ පිංකමක් ගැන සඳහන් වුවත් අන් පිංකම් තුළදීද රැකේම විය යුතුය.)*

විශේෂ කරුණු :-

☆ සිතක යෙදෙන **හේතු ධර්ම** සිතේ බලවත් බව මගින විශේෂ කරුණකි. සෝමනස්ස - උපේක්ෂා, අසංස්කාරි - සසංස්කාරික බව අප්‍රධාන කරුණුය.

☆ ත්‍රිහේතුක සිත්වල උත්කෘෂ්ඨ - ඕමක වශයෙන් ප්‍රභේදයක් ඇත. එසේ වන්නේ එම සිත් පහල වීමට පෙර හා පසු ඇති කර ගත් යහපත් සිත් වල බලයෙනි.

☆ ත්‍රිහේතුක - ද්විහේතුක උප්පත්ති කායික වශයෙන් සෙවිය නොහැකි කරුණකි. ධ්‍යාන ලාභීන්, මඟඵල ලාභීන් ත්‍රිහේතුක උප්පත්ති ලාභීහුය. බුද්ධත්වයට පත්වන ආත්මභාවයේදී බෝධි සත්වයන් 'සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංස්කාරි' විපාක සිතකින් උපදී. නිතර නිතර කුසල් දහම් කරන්නවුන්ට අවසාන සිත යහපත් කර ගැනීමට පහසු වේ.

☆ කුසලාකුසල කර්ම සිදුවීම එක සිතකින් පමණක් සිදු නොවේ. ඒ සඳහා සිත් වාරයක් ඇතිවිය යුතුය. චිත්ත වීථි යනු එයට නමකි. භවාංග සිතින් ආරම්භ වී ජවන සිත් ඇතුලත්ව නැවත භවාංග වීම දක්වා සිත් ඇතිවන පිළිවෙලක් ඇත. එය චිත්ත නියාම ධර්මයයි. සිත් පහල වීමේ වේගවත් බවට සමාන කළ හැකි අන් දෙයක් ලොව නැත්තේය. එබැවින් කුසල කර්ම සිදු කිරීමට පෙර, කරන විට හා කළ පසු යහපත් සිත් පහල කර ගැනීමෙන් අප්‍රමාණ ත්‍රිහේතුක කුසල සිත් ඇතිකර ගත හැක.

මරණාසන්න සිතට (චුති සිතට) අරමුණු ලැබෙන ආකාර තුන }

| | |
|---|---|
| 1. කර්මය | මරණාසන්න මොහොතේ ජීවත්ව සිටි විට කළ කර්මයන්ගෙන් බලවත් වූ කර්මය වශයෙන් ගරුක,ආසන්න,ආචිර්ණක,කතත්වා ආදී එක් කර්මයක් සිහියට වැටීම. |
| 2. කර්ම නිමිත්ත | මරණාසන්න මොහොතේ ජීවත්ව සිටි විට කරගත් කුසලාකුසල කර්මයකට උපකාර වූ සත්ව, පුද්ගල, වස්තූන්ගේ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ආදී එක් අරමුණක් සිහි වීම. |
| 3. ගති නිමිත්ත | මරණින් පසු උපදින ස්ථානය මනසට අරමුණු වීම. |

පුණ්‍යානුමෝදනය :- බු.ව.2551 උඳුවප් පුන් පොහෝ දින ධර්ම දානය වශයෙන් මෙම දහම් පත්‍රිකාව සකස් කොට (කඩවත ගුණානන්ද හිමි) වන අප විසින් පරිත්‍යාග කරන ලදී. මෙම පින්කම ඔබ සැමට නිවන් සැප පිණිස හේතු වේවායි ! අනුමෝදනා කරමි අනුමෝදන් වෙත්වා !

උපකාරක පොත් :- අභිධර්ම මාර්ගය, බෞද්ධයාගේ අත්පොත (රේරුකානේ නාහිමි රචිත) වෙනත් - බුද්ධ වංශ පාලිය (ත්‍රිපිටකය)

තෙරුවන් සරණයි !

3 ආගන්තුක රෝග

4 සහජ රෝග

1 රාග සංඥාව-අසුභ සංඥාව මගින්

ද්වේෂ සංඥාව-මෛත්‍රී සංඥාව මගින් 2

**එකොළොස් මෙත්තානිසංස**

| | ආනිසංස | කෙටි විස්තරය |
|---|---|---|
| 1 | සුඛං සුපති | (සැපසේ නිදයි) මෙත් වඩන්නෝ ඒ මේ අත පෙරළිමෙන්, ගත් දෙඩවීමෙන්, දත්මිටි කමින් තොරව නින්දට වන් කල සමවතකට සමවන් මෙන් සුවසේ නිදයි. |
| 2 | සුඛං පටිබුජ්ඣති | (සැපසේ අවදිවෙයි) මෙත් වඩන්නෝ ඒ මේ අත දඟලමින් , කෙඳිරිගාමින්, ඇඹරෙමින් තොරව අවදිවන් කල්හි පිපෙන පියුමක් මෙන් ප්‍රබෝධයෙන් පිබිදෙයි. |
| 3 | න පාපකං සුපිනං පස්සති | (පාපික සිහින නොදකියි) මෙත් වඩන්නෝ භය, තැති ගැනීම, දුක, ශෝකාදි ගෙන දෙන නපුරු සිහින නොදකියි. දක්නා කල දාගැබ්, බෝධීන්, විහාරාදී වඳින්නා වූ යහපත් සිහිනම දකී. |
| 4 | මනුස්සානං පියො හොති | (මිනිසුන් හට ප්‍රිය වෙයි) මෙත් වඩන්නෝ කෙළෙඹි ඔබා ලූ මුක්තාහාරයක් මෙන්, හිස පැළඳි මල් දමක් මෙන් මිනිසුන්ට ප්‍රිය කරයි.සියළු දෙනාම ඇසුරට ප්‍රිය කරයි. |
| 5 | අමනුස්සානං පියො හොති | (දෙවියන් හට ප්‍රිය වෙයි) මෙත් වඩන්නෝ දෙවියන් හටද ප්‍රිය වෙයි. මෛත්‍රී භාවනාව වැඩූ භික්ෂූන් වහන්සේලා වස් කාලයෙන් අනතුරුව වෙනත් ස්ථාන කරා වැඩමවීමට සූදානම් වූ විට දෙවියන් හඬා වැලපෙමින් ගෙනද ඇත. |
| 6 | දේවතා රක්ඛන්ති | (දෙවියෝ රකියි)මෙත් වඩන්නෝ දරුවන් රකින මවක් මෙන් දෙවි,දේවතාවෝ ආරක්ෂා කරයි.(ක.මෙත්ත සූත්‍ර) |
| 7 | නාස්ස අග්ගි වා විසංවා සත්ථංවා කමති | (ශරීරයට ගිනි, විෂ, ආයුධ නොවදියි)මෙත් වඩන්නෝ හට ස්වභාවික හෝ යම් පිරිහෙළයකට උත්සාහ කරන්නෙකුගේ වස විෂ, ආයුධ, ගිනි කිසිවක් මගින් හානි කිරීමට නොහැකි වෙයි. |
| 8 | තුවටං චිත්තං සමාධියති | (වහා සිත එකඟ වෙයි)මෙත් වඩන්නෝ හට නීවරණයන්ගෙන් සිත මිදෙනු කොට ප්‍රමාදවීමක් නොමැතිව වහාම සිත එකඟ කර ගැනීමට හැකි වෙයි.සමාධිගත වේ. |
| 9 | මුඛ වණ්ණො විප්පසීදති | (මුහුණ පැහැපත් වෙයි)මෙත් වඩන්නන්ගේ මුහුණ අන් සියළු දෙනාගේ මුහුණු වලට වඩා ප්‍රිය ස්වභාවයකින් යුක්ත වේ. පිපුණු පියුමක් මෙන් පැහැපත් බවින් දක්නට කැමති බවකින් යුක්ත වෙයි. |
| 10 | අසම්මුළ්හො කාලං කරොති | (නො මුළාව කළුරිය කෙරේ.)මෙත් වඩන්නනට නොමුළාව සිදු වන මරණයක් ලැබෙන්නේමය.සිහු නින්දට වන් කෙනෙකු මෙන් භය, තැති ගැනීමෙන් තොරව කළුරිය කරයි. |
| 11 | උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො හොති | (මෙම භවයේ රහත් විය නොහැකි වී නම් මරණින් මතු බඹ ලොව උපදියි) මෙත් වඩන්නෝ ධ්‍යාන ලබා රහත් බවට පැමිණීමට නොහැකි වූයේ නම් මේ අත් බවින් චුතව නිදා පිබිදියාක් මෙන් බඹලොව උපදියි. |

* *මෙහි සඳහන් මෛත්‍රී භාවනා ආනිසංස ඒකොළොසෙන් එකක් හැර අන් සියළු කරුණු මෙලොවදීම අත්දැකිය හැකි කරුණුය. එසේත් මෛත්‍රිය වැඩීමේදී මෙම කරුණු කිසිවක් අපේක්ෂා නොකරම මෙත් වැඩීම කළ යුතුය.එවිට මෙහි සඳහන් යම් යම් කරුණු සමාරම අප් දැකිය හැකි වේ. මෛත්‍රිය වැඩීම නිතර පුහුණු කර ගැනීම තුලින් ගමනක් යන විටද, පුර විරෝධයක් ලද මොහොතකද එසේසින් මෛත්‍රී වඩා ප්‍රබෝධමත් මානසික සුවයක් ඇති කර ගත හැකි වේ. (මෛත්‍රී භාවනාව තුලින් මෙම ආනිසංස ඒකි ලැබෙනවා යන විශ්වාසය ඇති කර ගැනීම සඳහා උත්සාහ ඇති කර ගැනීමයි.)*

අග්ගික්ඛන්ධොපම සූත්‍ර දේශනාව — අප භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අග්ගික්ඛන්ධොපම සූත්‍රය දේශනා කිරීමෙන් භික්ෂූන් සැට නමක් රහත් වන්නාහ. සැට නමක් උණු ලේ වමාරන්නාහ. තව සැට නමක් සිවුරු හැර ගිහි වන්නාහ. යයි සිදුවන යගපහ දැන තොකොල් රට ගම් නියම් ගම් සැරිසරන සේක් මහත් වූ බෙනයක් සහිත රටක් ගිනිගෙන ඇවිළෙනු දැක එය අරමුණු කොට අග්ගික්ඛන්ධොපම සූත්‍ර දේශනාව වදාළහ. බුදුන් වහන්සේ සිතූ පරිදි මෙසේ විය.

1. විරිය ලිහිල්ව කටයුතු කළ භික්ෂූන් විරිය දැඩි කොට අප්‍රමාද කොට සව් කෙළෙසුන් නසා සැට නමක් රහත් භාවයට පත් විය.
2. උණුලේ වමාරූ භික්ෂූහු පැවිදිව පාරාජිකා වූවෝ බැවින් මවුන් සාමණේර භූමියෙහි සිටිනා දසසිල් පුරා ශුවණ මෙහෙයවා සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, බවටද සෙස්සෝ දෙව්ලොව උපදින්නටද හේතු විය.
3. සිවුරු හළ භික්ෂූහු කුඩා කුඩා ශික්ෂා පද බිඳිමින් සිටි බැවින් අනාගතයේදී සංඝාදිසේස, පාරාජිකාවන්ට පත්විය හැකි බැවින් උපාදිව උපාසක භාවයෙන් ගිහි පන්සිල්, පොහොය අටසිල් ආදී ආරක්ෂා කොට සෝවාන්, සකෘදාගාමී, අනාගාමී බවටද සෙස්සෝ දෙව්ලොව උපදින්නටද හේතු විය.

බුදුරජුන්ට ධර්ම සංවේගය පහළ වීම — බුදුන් වහන්සේ අග්ගික්ඛන්ධොපම දේශනාවෙන් අනතුරුව දෙව්රම් වෙහෙරේ අඩමසක් විවේකීව එළ සමවත් සුවවිඳ දිනක් ආනන්ද මහ තෙරුන් සමඟ දෙව්රම් වෙහෙර හැසිරෙන කල්හි පෙර සතාවතින් බබළුව දෙව්රම් වෙහෙර අද නිස්ව පැවතීමට හේතු කවරේදැයි ආනන්ද තෙරුන්ගෙන් විමසූහ. ශ්‍රී වහන්සේ වදාළ අග්ගික්ඛන්ධොපම දේශනාව ආරංචි වූ භික්ෂූන් දසදෙනා, විසිදෙනා ආදී සිවුරු හැර යන්නට විය. "සැදැහැවතුන් විසින් පින් සලකා පිරිනමනු ලබන දන් වැළඳීම අයුතුයි, උසස් පැතුම් නමක් කුළ නොමැතියි" කියා එසේ වන්නට විය යැයි තථාගතයන් වහන්සේට සැළ කළහ. මම සම්මත් සුව විඳිත කළ මාගේ දරුවන් රැක ගන්නට නිසිවෙක් සමර්ථ නොවූයේ දැයි ධර්ම සංවේගය පහළ කොට භික්ෂූන් රැස් කරන්නට ආනන්ද තෙරුන්ට වදාළහ.

මෙත්තානිසංස සූත්‍ර දේශනාව — මහා ගංගාවකට බසින්නවුන්ට බොහෝ කොටවල් ඇත්නම් මෙන් මාගේ ශාසනයෙහි සැනසෙන්නට බොහෝ දේ ඇතැයි වදාළ බුදුන් වහන්සේ රැස්කරවූ භික්ෂූන්ට "යම් භික්ෂු නමක් අසුරු සැනක් ගසන ස්වල්ප කාලයක් හමුදු සියළු සතුන් කෙරෙහි මෙත් සිත් වඩාද එම භික්ෂු තෙම මගේ අවවාදය පිළිගන්නෙකැයි, දායකයන් විසින් දෙනු ලබන රටිට පිණ්ඩය නොනිස්ව වළඳන්නෙකු යැයිද කියනු ලැබේ."යි වදාළහ. යමෙක් මෛත්‍රී සිත භාවනා නැවත පුරදද කෙරෙන්නේ නම් කිසු ගැන කියනු කිම දැයි වුවල අච්ඡරා සංඝාත සූත්‍රය වදාරා මෛත්‍රී අනුහස් දක්වන මෙත්තානිසංස සූත්‍ර දේශනාව වදාළ සේක.

සැලකිය යුතුයි:- * අග්ගික්ඛන්ධොපම දේශනාව තථාගතයන් වහන්සේ සිදු නොකළේ නම් එම භික්ෂූන් අපායගත වී බොහෝ දුක් විඳීමට සිදු වන්නේය.

විශේෂ කරුණු :- * වැද්දෙකු විසින් තම පැටවාට කිරි දෙමින් සිටි එළදෙනක මැරීම සඳහා හෙල්ලයකින් ඇන්නේය. එම හෙල්ල එළදෙනගේ ඇඟේ වැදී තල් කොළයක් සේ හැකිලී ගියේය. එළදෙනගේ සිත ධ්‍යාන සිතක් නොවූවද එය මැදු සිතේ, ප්‍රිය සිතේ බලයයි. මෛත්‍රී සිතේ කෙසේ නම් බලයක් පැවතිය හැකිද? (බොහෝ උදාහරණ දැන ගැනීම පිණිස ජාතක පොත බලන්න.)

---

පුණ්‍යානුමෝදනය :- බු.ව. 2553 නිකිණි පුන් පොහෝ දින ධර්ම දානය ලෙස මෙම දහම් පත්‍රිකාව (කඩවත ගුණානන්ද හිමි) වන අප විසින් සකස් කොට හේනේගම පදිංචි ඩබ්ලිව්.ඒ.සිරියාවතී මහත්මිය විසින් මියගිය ඩී.පී.ජයසේකර රාලහාමි,දෙමාපියන් හා සහෝදරයන් ඇතුළු මියගිය සියළු ඥාතීන්ට පිං අනුමෝදනය පිණිස තම ධන පරිත්‍යාගයෙන් මුද්‍රණය කොට බෙදා දෙන ලදී. මෙම පිංකම මියගිය සියළු දෙනාටත්, ඔබ සියළු දෙනාටත් නිවන් අවබෝධය පිණිස හේතුවේවායි ! ප්‍රාර්ථනා කරමි.

උපකාරක පොත් :- බෞද්ධයාගේ අත්පොත(රේරුකානේ නාහිමි රචිත)
සිඟාලෝවාද සූත්‍ර දේශනාව(නා උයනේ අරිය ධම්ම නාහිමි රචිත)
පිරිත් පොත(සිරිවන්තුඩුවේ ධම්මකිත්ති ශ්‍රී ප්‍රඥාසාර නාහිමි සම්පාදිත)

තෙරුවන් සරණයි !

3 විතර්ක සංඥාව-ආනාපාන සංඥාව මගින්

මානය-අනිත්‍ය සංඥාව මගින් 4

1 කබලිංකාරාහාරය(මුවෙහෙන්මා ගත්තා ආහාර)

(තමන්ගේ ආලුණු ඩවරය තුළින් ආහාර වීම (එස්සාහාරය) 2

ආ ය ත න ස ය

| | ආයතන | කෙටි විස්තරය |
|---|---|---|
| ① | චක්ඛායතනය (චක්ඛු ප්‍රසාදය) | රූපය දක්නා සිතට උප්පත්තිස්ථාන වන්නා වූ ඇසෙහි පිහිටි ඔපය චක්ඛායතන නම් වේ. එයටම චක්ඛු ප්‍රසාදය යැයි කියනු ලැබේ. මෙය ඇසේ කළු ඉංගිරියාව මැද උකුණු හිසක් ප්‍රමාණයට පිහිටා ඇත. හට්ටු සතක් සහිත මෙම කුඩා ගුලියේ ඇතුළත පිටත පැතිර පවත්නා ඔපයක් ඇත්තේය. ඒ තුළ ඇසට යොමු වන රූපයන්ගේ ඡායාව එහි පහළ වීමත් එය දැන ගන්නා සිතක් පහළ වීම පෙනීම යැයි කියනු ලැබේ. රූපයන්ගේ වර්ණ රූප චක්ඛායතනයට ගෝචර රූපය වන්නේය. |
| ② | සෝතායතනය (ශ්‍රෝත ප්‍රසාදය) | ශබ්ද දැන ගන්නා සිතට උප්පත්ති ස්ථාන වන්නා වූ කනෙහි පිහිටි ඔපය සෝතායතන නම් වේ. එයටම ශ්‍රෝත ප්‍රසාදය යැයි කියනු ලැබේ. මෙය කන ඇතුළත දුඹුරු පැහැති සියුම් ලොම් සහිත මුද්දක් ලෙස පිහිටා ඇත. එහි ඔපය තුළ සමීපයේ පැමිණි ශබ්ද පහළ වෙයි. මෙය දැනගන්නා සිත ඇසීම ඇසීම යැයි කියනු ලැබේ. සෝතායතනයට ගෝචර රූපය වන්නේ ශබ්දයයි. |
| ③ | ඝානායතනය (ඝ්‍රාණ ප්‍රසාදය) | ගඳ දැනගන්නා සිතට උප්පත්ති ස්ථාන වන්නා වූ නාසය තුළ පිහිටි ඔපය ඝානායතන නම් වේ. එයටම ඝාන ප්‍රසාදය යැයි කියනු ලැබේ. මෙය නාසය තුළ එළු කුරයක් බඳු ස්ථානයක පිහිටා ඇත. එහි ගඳ සුවඳ දෙක හා වැදීමට යෝග්‍ය වූ ඔපයක් ඇත. එයට ගඳ-සුවඳ ප්‍රවිෂ්ට වූ විට ඒවා හැඳින ගන්නා සිත ඇති වූ විට එය ආඝ්‍රාණය යැයි කියනු ලැබේ. ඝානායතනයට ගෝචර රූපය ගන්ධය වන්නේය. |
| ④ | ජිව්හායතනය (ජිහ්වා ප්‍රසාදය) | රස දැනගන්නා සිතට උප්පත්ති ස්ථාන වන්නා වූ දිවෙහි පිහිටි ඔපය ජිව්හායතන නම් වේ. එයටම ජිහ්වා ප්‍රසාදය යැයි කියනු ලැබේ. මෙය දිවෙහි නෙළුම් පෙත්තක වැනි හැඩයක් ඇත්තා වූ ස්ථානයක නොයෙක් රසයන් හා වැද්දෙන ඔපයෙන් පිහිටා ඇත. රසයන් එහි ගැටුණු කල්හි එය දැනගන්නා සිත පහළ වේ. එයට රස දැනුම යැයි කියනු ලැබේ. ජිව්හායතනයට ගෝචර රූපය ආහාරයේ රසය වන්නේය. |
| ⑤ | කායායතනය (කාය ප්‍රසාදය) | තද බව, සිසිල, උණුසුම් බව ආදී දන්නා සිතට උප්පත්ති ස්ථාන වන්නා වූ ශරීරයේ ඇතුළත පිටත පිහිටි ඔපය කායායතන නම් වේ. එයටම කාය ප්‍රසාදය යැයි කියනු ලැබේ. මෙය කාය ප්‍රසාද කෙසගත්,ලොම්, නිය, වියළි සම, ආහාර දිරවන පාචක තේජෝධාතුව පවතින ස්ථාන හැර අන් සෑම තැනෙකම පිහිටා ඇත.කාය ප්‍රසාදයන්ට ගෝචර ස්පර්ශයක්(සැතු ගුණයක්) ගැටුනු විට එය දැන ගන්නා සිත පහළ වේ. එවිට සීතල උණුසුම් දැණුනා යැයි කියනු ලැබේ. |
| ⑥ | මනායතනය (හෘදය වස්තු රූපය) | මනායතන නම් එකුන් අනූ චිත්තයයි.(89) අරමුණු ගැනීම සිතින් සිදු කරන අතර එම අරමුණු දැන ගැනීම සිත සමඟ යෙදෙන චෛතසිකයන්ගෙන් සිදු කරයි. එබැවින් මනායතනයට ගෝචර වන්නේ චෛතසික දෙපනස(52) සහ සූක්ෂම රූප සොළොස හා නිර්වාණය. පසේව ද්වාරයනට අදාළ ප්‍රසාද රූප ඇතුවාක් මෙන් මනෝද්වාරයට හෘද වස්තුවේ අඩ පතක් පමණ ලේ ධාතුවේ යම් දෙයක් උපකාර කොට පවතී. |

*✱ චිත්ත - චෛතසික ඉපිද සමාට ආයන් කාරයයන් සිදු කරන ස්ථාන ආයතන වන අතර ප්‍රසාද රූප, පසේව ඉන්ද්‍රිය යනුවෙන් හඳුන්වන්නේද මෙම ආයතනම වේ. ශරීරයේ පිහිටි ආයතන අධ්‍යාත්මික ඊට ගෝචර අරමුණු බාහිර ආයතන නම් වේ. මෙසේ විවිධාකාරයෙන් ආයතන සය විභාග කොට දක්වා ඇත්තේ නාම රූප දෙකෙහි කාමච්ඡන්දයන්ගේ මමත්වය දුරු කිරීම දුෂ්කර බැවිනි.*

විඥ්ඥාණය (සිත) උපදින අයුරු

1. චක්ඛු ප්‍රසාදයේ, රූපයේ වර්ණය ගැටීමෙන් එහි උපදින සිත චක්ඛු විඥ්ඥාණයයි.
2. ශ්‍රෝත ප්‍රසාදයේ, හඬ ගැටීමෙන් එහි උපදින සිත ශ්‍රෝත විඥ්ඥාණයයි.
3. ඝ්‍රාණ ප්‍රසාදයේ, ගන්ධය ගැටීමෙන් එහි උපදින සිත ඝ්‍රාණ විඥ්ඥාණයයි.
4. ජිහ්වා ප්‍රසාදයේ, රස ගැටීමෙන් එහි උපදින සිත ජිහ්වා විඥ්ඥාණයයි.
5. කාය ප්‍රසාදයේ, ස්පර්ශයන් ඇති වීමෙන් එහි උපදින සිත කාය විඥ්ඥාණයයි.
6. හෘදය වස්තු රූපයේ, ධම්මාරම්මණ පහළ වීමෙන් එහි උපදින සිත මනෝ විඥ්ඥාණයයි.

මෙම සිත් සමඟ අදාළ චෛතසික ක්‍රියාකර අරමුණු දැනගනී. එම අරමුණෙහි වේදනාව ඒ ඒ පුද්ගලයන්ගේ ප්‍රඥාවට අනුව විශේෂ වේ.

සැලකිය යුතුයි :- ✱ අණ්ඩජ, ජලාබුජ,සත්වයා ප්‍රතිසන්ධියෙන්ම කායායතන, මනායතන පහළ වේ, අනෙත් ආයතන ක්‍රමයෙන් පහළ වේ.
✱ සූක්ෂම රූප නම් ආපෝ ධාතුව, භාව රූප දෙක, හෘද රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාශ රූපය, විකාර රූප පස හා ලක්ෂණ රූප සතර සමඟ නිර්වාණ ධර්මය.(රූපස්කන්ධ විස්තරය බලන්න)

විශේෂ කරුණු :- ✱ කාම ලෝකයේ ආයතන සයම පහළ වේ. රූපාවචර බඹ ලොව චක්ඛු, ශ්‍රෝත, මන යන ආයතනද, අසඥ බඹ තලයේ එකද ආයතනයක් පහළ නොවේ.අරූපාවචර බඹලොවෙහි මනායතන පමණක් පහළ වේ.
✱ කර්ම විපාක වශයෙන් උපතින් ශ්‍රෝත ප්‍රසාද නොපිහිටි අයෙකු ගොළු බවට පත්වේ.
✱ කර්මානුරූපව හෝ වයස්ගත වීම තුළින් සියලු දෙනාගේම ආයතන හෙවත් ප්‍රසාද රූප දුර්වල වීම සිදු වේ.
✱ විඥ්ඥාණ හෙවත් සිත ඇති වන අයුරු විභාග කොට දැන ගැනීම තුළින් ජීවත් වීම යනු නොයෙක් අරමුණු ද්වාරයන්ට පැමිණීම නිසා ඒවා කෙරෙහි සතුට, දුක, මධ්‍යස්ථ වේදනා විඳීම හැර අන් කවරක්ද? යන බව වැටහේ.
✱ විඥ්ඥාණයෙහි ආත්ම සංඥාව දුරු කර ගැනීමට දුෂ්කර බැවින් ආයතන නොයෙක් අයුරින් විභාග කොට දක්වා ඇත.

---

පුණ්‍යානුමෝදනය :- බු.ව. 2552 බක් පුන් පොහෝ දින ධර්ම දානය ලෙස මෙම දහම් පත්‍රිකාව (කඩවත ගුණානන්ද හිමි) වන අප විසින් සකස් කොට වැලිගම්පිටියේ පදිංචි සත්ගුණවත් කාරියප්පෙරුම මහතාගේ සහ එම මහත්මියගේ ධන පරිත්‍යාගයෙන් මුද්‍රණය කොට බෙදා දෙන ලදී. මෙම ධර්ම දානය සියළු දෙනාටම නිවන් අවබෝධය පිණිස හේතුවේවායි ප්‍රාර්ථනා කරමි.

උපකාරක පොත් :- වේරුගොඩ චන්දවිමල හාමිමි රචිත පටිච්ච සමුප්පාදය
කලල්ල්ලේ ධම්මානන්ද හාමිමි රචිත ත්‍රිපිටකයෙහි සංස්කෘතික ලක්ෂණ
බලන්ගොඩ ආනන්ද මෛත්‍රිය හාමිමි රචිත බුද්ධ චරිතය

තෙරුවන් සරණයි !

3 මනෝසඤ්චේතනාහාරය(මේ සෙයින්ම කුසලාකුසල චේතනා ආහාර වීම.)

(මේ සෙයින්ම සියලු රජිතය වන ආහාර වීම)විඤ්ඤාණාහාරය 4

පසළොස්වක | අව අටවක

# දස අකුසල කර්ම

**සි ත ය**

| අකුසලය | හේතුව | සම්පූර්ණ විය යුතු කරුණු |
|---|---|---|
| අභිද්‍යාව | අන් සතු වස්තු තමන් සතු කර ගැනීමේ දැඩි ආශාව. | 1. අන් සතු වස්තුවක් වීම.<br>2. එය තමසතු කරගැනීමේ දැඩි ආශාව. |
| ව්‍යාපාදය | අන් සතු වස්තුව තමා සතු වීම සඳහා හෝ තමන් හා විරුද්ධයන් විනාශ වීමේ කැමැත්ත. | 1. අන්‍ය සත්වයෙකු හෝ පුද්ගලයෙකු වීම.<br>2. ඔවුන් විනාශ කිරීමට සිතීම හෝ විනාශය කැමති වීම. |
| මිථ්‍යාදෘෂ්ටිය | කර්මය, කර්ම ඵලය කෙරෙහිත් හා නිවන් මග කෙරෙහි වැරදි මත | 1. යම් දෘෂ්ටියක් වැරදි ආකාරයෙන් ගැනීම.<br>2. එයම සත්‍ය යැයි නිශ්චය කර ගැනීම |

**කා ය ය**

| | | |
|---|---|---|
| පාණාතිපාතා | පර පණ නැසීම. | 1. පණ ඇති සතෙකු වීම.<br>2. පණ ඇති සතෙකු බව දැන ගැනීම.<br>3. මරණු කැමති සිත.<br>4. මරන්නට උපක්‍රම කිරීම.<br>5. එම උපක්‍රමයෙන් මැරීම. |
| අදත්තාදානය | තමන් සතු නොවූ දෑ සොර සිතින් ගැනීම. | 1. අන් සතු වස්තුවක් වීම.<br>2. අන් සතු වස්තුවක් බව දැන ගැනීම.<br>3. පැහැර ගනු කැමති සිත.<br>4. පැහැර ගැනීමට උපක්‍රම කිරීම.<br>5. එම උපක්‍රමයක් ගැනීම. |
| කාම මිථ්‍යාචාරය | අන් කෙනෙකු යටතේ යැපෙන රැකෙන ස්ත්‍රියක හෝ පුරුෂයකු සමග සංවාසයේ යෙදීම. | 1. සේවනය නොකළ යුතු ස්ත්‍රියක හෝ පුරුෂයෙකු වීම.<br>2. සේවන චිත්තයක් ඇතිවීම.<br>3. සේවනයට උත්සාහ කිරීම.<br>4. සේවන ආස්වාදය ලැබීම. |

**ව ච න ය**

| | | |
|---|---|---|
| මුසාවාදය | අසත්‍ය ප්‍රකාශ හෝ ඇඟවීම් කිරීම. | 1. කියන කරුණ බොරුවක් වීම.<br>2. අනුන් රවටන අදහස.<br>3. ඇඟවීමට උත්සාහ කිරීම.<br>4. අනෙකා එයින් රැවටීම. |
| පිසුනාවාචාව | දෙදෙනෙක් අතර හෝ පිරිසක් අතර අසමගිය ඇති කරන වචන | 1. භේද කළයුතු කෙනෙකු සිටීම.<br>2. කෙනෙකු හා බිඳවන අදහස.<br>3. බිඳවීම පිණිස යමක් කිරීම.<br>4. එය ඇසූ තැනැත්තා එය විශ්වාස කිරීම. |
| පරුෂ වචනය | අනෙයක් ප්‍රිය නොකරන වචන භාවිතය, | 1. ආක්‍රොශ කරන්න පුද්ගලයෙකු සිටීම.<br>2. ආක්‍රොශ සහගත සිත් ඇතිවීම.<br>3. ඔවුන්ගේ සිත් රිදවන වචන කීම. |
| සම්ඵප්‍රලාපය | කියන-අසන දෙපක්ෂයට ප්‍රයෝජන නැති වචන | 1. අසන හා කියන අයට ප්‍රයෝජනයක් නැති කථාවක් කියන අදහස.<br>2. එබඳු කථාවක් කීම. |

සැලකිය යුතු කරුණු :-
* කුසලාකුසල කර්මයන් වර්තමාන භවයටත් මරණින් මතු භවයටත් හා නිවන් දක්නා භවය තෙක් විපාක දේ.
* අංග සම්පූර්ණ අකුසල කර්මයකින් සතර අපා උප්පත්තිය හෝ උපන් ආත්ම භවයන්ට අනිෂ්ට ප්‍රති විපාක හෝ ගෙන දේ.
* ආනන්තරිය පාප කර්ම හැර අන් අකුසල කර්ම, කුසල කර්ම මගින් යටපත් කිරීම කළ හැක.

අභිධර්මයට අනුව :-
* ජවන සිත් 1 / 2 3 4 5 6 / 7

1. දිට්ඨ ධම්ම වේදනීය (වර්තමාන භවය)
2-6. අපරාපරිය වේදනීය (තුන්වන භවයේ සිට නිවන් දක්නා වූ භවය)
7. උපපජ්ජ වේදනීය (අනාගත භවය)

පුර අටවක | අමාවක

අ ෂ් ට දු ෂ් ට ක් ෂ ණ

| | දුෂ්ටක්ෂණ | කෙටි විස්තරය |
|---|---|---|
| ① | නරකයට වැටී සිටින කාලයය | නරකය නම් සතර අපායන්හි දුක් බහුල වූ අපාය භූමියයි. එහි දුගඳ බොහෝ ඇත්තේය. කෙසේවත් එහි සිරීමට පසුබිමින් හෝ ගුවණාන්ද එහි උපන්නුන් හට නැත්තේය. නිරන්තරයෙන් දුවීමට දුක්වේදීමින් පාපයට අනුව මැරි මැරී එහිම උපදිති. එබැවින් පාපය විඳවා ගෙවා දැමීම හැර වෙනත් පින්කම් කිරීම, එම භවයෙන් සසරින් තර ගැනීම ඊනි උපන් කල කළ නොහැක්කේය. |
| ② | තිරිසන්ව උපන් කාලයය | තිරිසන්ව උපදින සත්වයන්ට විශේෂ භූමියක් අපාය භූමියක් නැත්තේය. උපන් අකුසල කර්ම අනුව ඒ ඒ තිරිසන්ව ඉපිද ඒව කලාපෙන ස්ථානයන සිටින් වෙති. බොහෝ සා පිපාසාවෙන්ද අවි - වැනි පුලුනින්ද පීඩාවට පත්වෙති. බොහෝ සත්වයන් නාවින නාවින අකුසල කම් වල යෙදීමෙන් අපායන්හිම උපදින්නේය. එබැවින් තිරිසන්ව උපන් කල පින්කම් කිරීමට නොහැකි වන්නේය. |
| ③ | ප්‍රේතව උපන් කාලයය | ප්‍රේතයෝ ඕපපාතිකව පහළවන අපායික සත්ව කොටසකි. තිරිසන් සතුන් විඳිනා දුකට වඩා මහත් දුකට පත්ව සිටින සත්ව කොට්ඨාශයකි. කුසාල්වද, ගිනෙන් වූ ගොයෙන් වූ සරීර ඇත්තෝ වෙති. උපන් පාපයට අනුව කොයෙන් පිළිකුල් ආහාරයෙන් ජීවත් වෙති. (සෙල, සෙම, සොටු, සැරව, මලුසා අපද්‍රව්‍ය ආදිය) මෙවැනි භවයක සිටීම කුසල කර්මයන් සිදුකළ නොහැකි වන්නේය. |
| ④ | අසඤ්ඤ භාවය හා සතර අරූප බඹ ලෝකයන්හි උපන් කාලයය | කෙනෙකු සිතේ ස්වභාවයට කළකිරීම හේතුවෙන් සංඥාව යකාගා සංඥා විරාගීකව වඩවා එම ධ්‍යාන බලයෙන් අසඤ්ඤ බඹ ලොවිද, රූපයම් කව අයෙකු කයේ ස්වභාවයට කළකිරීමෙන් අරූප ධ්‍යාන වඩවා අරූප බඹලෝ කලයන්හිද උපදිති. අසඤ්ඤ භවයේ සිත ක්‍රියා විරහිතව පවතින බැවින් සංඥා ආදී සිතිවිලි පහළ නොවන බැවින් හා අරූප බඹ ලොව පස්දොර ඉන්ද්‍රියන් නොමැති බැවින් එම ලෝකයන්හි කුසල කම් සිදුකළ නොහැකි වන්නේය. |
| ⑤ | බුදුවරයන් බුද්ධශ්‍රාවකයන් නොයැවිණෙන ප්‍රදේශයන්හි උපන් කාලයය | ලෝකයේ සත්‍ය අවබෝධ කිරීමට මග පෙන්වීමක් නොමැතිව කටයුතු කිරීමට හැකියාවක් නැත්තේය. ඒ සඳහා සම්මා සම්බුදුවරයෙකු හෝ බුද්ධ ශ්‍රාවක කල්‍යාණ මිතුරු ඇසුරක් ලැබිය යුතුය. එවැනි උතුමන් නැති ප්‍රදේශයන්හි උපන් අයෙකුට එවැනි උසස් කුසල කම් සිදුකර ගත නොහැක්කේය. |
| ⑥ | අංගවිකලව උපන් කාලයය(පංච ඉන්ද්‍රියන් එකක් හෝ දුබලව ඉපදීම) | කායික හෝ මානසික දුබල බවින් උපදින්නෝ බලවත් කුසල කර්මයකින් උපන්නෝ නොවෙති. (අහේතුක/ද්විහේතුක) එබැවින් ඉන්ද්‍රියන්ගෙන් එකකුදු හෝ දුබල බවින් යුක්ත නම් ධර්මය අවබෝධයට බාධක වේ. කිසියම් කුසල කර්මයක් බලවත්ව සිදු කිරීමට නොහැකි වන්නේය. |
| ⑦ | මිත්‍යා දෘෂ්ටි ගෙන සිටින කාලයය | දස අකුසල කර්මයන්ගේ බලවත්ම අකුසල කර්මය වන්නේ මිත්‍යා දෘෂ්ටියයි. එහි බලවත් කම කොතරම්ද යත් ලෝක විනාශ සිදුවන කාලයන්හිද වැරදි දෘෂ්ටි ගත වූ අය වෙනත් සක්වල අපාය භූමි උපදින බව දැක්වේ. දැඩිව මිත්‍යාදෘෂ්ටි ගත වූවන්ට කිසිම කුසල කර්මයක් සිදුකළ නොහැක්කේය. |
| ⑧ | අබුද්ධොත්පාද කාලයය | බුදුවරයෙකු පහළ වීම සම්බුද්ධ පහළ වීමයි. පසේ බුදුවරයෙකුට හැර අන් කිසිවකුට අබුද්ධෝත්පාද කාලයන්හි ධර්මය අවබෝධ කළ නොහැක. දානාදී පින්කම් වුවද උසස් ලෙස සිදුකළ නොහැක්කේය. |

*(අෂ්ට + දුෂ්ට - අක්ෂණ) අක්ෂණ යනු යම් ආකාරයක උසස් අවස්ථාවක් කර ගැනීමට ඉඩ ප්‍රස්ථා නොලැබීමයි. ඊට හේතු වන කරුණු අට අෂ්ටදුෂ්ටක්ෂණ වශයෙන් හඳුන්වයි. සසර සැරිසරන සත්වයන්ට මුණ ගැසෙන්නේ දුෂ්ටක්ෂණ කාලයන්ය. එබැවින් මෙම ලැබූ ක්ෂණ සම්පත්තියෙන් උපරිම ඵල නෙලා ගැනීමට වීර්යය වඩවා මනුෂ්‍ය ආත්ම භාවය අර්ථවත් කර ගත යුතු වේ.*

බුදුන් රජුන්ගේ දිනපතා කරන අවවාදය:

"භික්ඛවේ ! අප්පමාදෙන සම්පාදෙථ. දුල්ලභො බුද්ධොත්පාදෝ ලොකස්මිං, දුල්ලභො-මනුස්සත්ත පටිලාභො, දුල්ලභා ඛණසම්පත්ති, දුල්ලභා පබ්බජ්ජා, දුල්ලභං සද්ධම්ම සවණං "

"මහණෙනි ! අප්‍රමාදයෙන් යුක්ත වව්. ලෝකයේ බුද්ධොත්පාදය දුර්ලභය, මිනිසත් බව ලැබීම දුර්ලභය, ක්ෂණ සම්පත්තිය දුර්ලභය, පැවිද්ද දුර්ලභය, සද්ධර්ම ශ්‍රවණය දුර්ලභය"

(ලෝකයේ දුර්ලභ කරුණු පස දිනපතා සිහිගැන්වීම බුදුන්වහන්සේගේ දින චර්යාවේ එක් අංගයක් විය)

මනුෂ්‍යත්වය ලැබීම දුෂ්කර බවට උපමාව: "පුරුෂයෙක් එක් සිදුරක් ඇති විය දඬු කඩක් මහ මුහුදට දමන්නේය. සතර දිශාවෙන් හමන සුළඟින් ගසාගෙන එළ මතින් ඒ ඒ දිශාවට ගෙන යනු ලබයි. සමුද්‍රයෙහි වෙසෙන වර්ෂ සියයකට වරක් මතුවට එන කණ කැස්බෑවෙක් මුහුදු දියෙන් අහසට හිස දිගු කරයි. එවිට විය සිදුරට උගේ ඇස ඇතුල් වී අහස දකී. මෙය යම් කාලයක් ගතවී සිදුවිය හැකි කරුණකි. එහෙත් මිනිසත් බව ලැබීම ඊට වඩා අති දුර්ලභයි." බුදුන් වහන්සේ වදාළ සේක.

ක්ෂණ සම්පත්තිය: ලෝකයේ දුර්ලභ කරුණු අතරින් එක් කරුණකි ක්ෂණ සම්පත්තිය. පින් කිරීමට අවකාශ නොලැබෙන දුෂ්ටක්ෂණයෙන් මිදී ලබන මනුෂ්‍යත්වය හෝ දිව්‍ය බුද්ධ සම්පත්තිය ක්ෂණ සම්පත්ති ලෙස දක්වා ඇත.

සැලකිය යුතුයි:-

* සත්වයින් නරකයෙහි විඳින දුක සර්වාකාරයෙන් කියනහොත් වසර සියයක් දහසක් මුළුල්ලෙහි කියා වුවද කෙනෙකුට අවසන් නොකළ හැකි බව තථාගතයන් වහන්සේ වදාළහ.
* තිරිසන් ගත සත්වයින් යම් යම් අවස්ථාවන්හි ධර්ම දේශනා කව ප්‍රසාද සිතින් අසමින් සිටියදී මරණයට පත්වී සුගතිගාමී වූ අවස්ථා කිහිපයක් ධර්මයේ සඳහන්ව ඇත.
* ප්‍රේතව ඉපිද සිටින පරදත්තූපජීවික ප්‍රේත කොට්ඨාශයට අයත් වූවන්ට පමණක් තම ඥාතීන් අනුමෝදන් කරන පිංහෙම් දානයෙන් හෝ අයෙකුගෙන් සතුටුව ජීවිත සැපවත් කරගත හැකි වන්නේය

විශේෂ කරුණු:-

* අසුර අපායික සත්වයන් යනු ප්‍රේත කොට්ඨාශයකි. බුදුන්ට ගන්නයෝ යැයිද කියති. ඒ අතරින් පිපාසාතර මහා, පුනබ්බසුමාතා, යන යක්ෂණියන් දහම් අසා සෝවාන් ඵලයට පත්වී ඇති හෙයින් මුළුනේතුක සුගතියෙහි අසුර අපායේ සිදු වන බව විශේෂ කරණෙකි.
* යම් මාර්ග ඵලයකට පත්ව අරූප ධ්‍යාන වඩා අරූප බඹ තලයෙහි උපන් කළ ප්‍රඥාව දියුණු කොට අන් මාර්ගයන්ට පත්විය හැක.
* සෑම කල්හිම උසස් කුසල ධර්ම වඩවා ගැනීමට ප්‍රධාන හේතුව වන්නේ ධර්මය නිවැරදිව දැන ගැනීම හැකි කල්‍යාණ මිතුරන් සිටීම.

පුණ්‍යානුමෝදනය :- බු.ව. 2553 පොසොන් පුන් පොහෝ දින ධර්ම දානය ලෙස මෙම දහම් පත්‍රිකාව (කඩවත ගුණානන්ද හිමි) වන අප විසින් සකස් කොට වැලිගම්පිටියේ පදිංචි ජයන්තා මාලනී මහත්මිය පරලොව ගිය හේ. ඒ කරුණාවෙනි වන තම මෑණියන්ට පිං පිණිස කළ ධන පරිත්‍යාගයෙන් මුද්‍රණය කොට බෙදා දෙන ලදී. එතුමිය ඇතුළු ඔබ සියළු දෙනාට මෙම ධර්ම දානය නිවන් අවබෝධය පිණිස හේතුවේවායි ! ප්‍රාර්ථනා කරමි.

උපකාරක පොත් :- චතුරාර්ය සත්‍යය.බෝද්ධයාගේ අත්පොත(රේරුකානේ චන්දවිමල නාහිමි රචිත)
බුද්ධවංශපාලිය, ධම්මපදය, විමාන වත්ථු යන ග්‍රන්ථ

තෙරුවන් සරණයි !

1 දානය

ප්‍රිය වචනය 2

පටිච්ච සමුප්පාද ධර්මය

| හේතු ඵල ධර්ම | කෙටි තේරුම | කෙටි විස්තරය |
|---|---|---|
| (1) අවිද්‍යාව | දුක,දුකට හේතුව නිවන,නිවනට මග නොදැනීම | ජීවිතය පවත්වනවිට නොයෙකි ලෞකික සැපය ගැන මුලාවෙන් මත්ව කටයුතු කිරීම නිසා සංස්කාරයන්ගේ සැබෑ තත්වය නොදැනීම. (දුක් දුක, විපරිනාම දුක, සංස්කාර දුක) |
| (2) සංස්කාර | පිං පව් සිදු කර ගැනීම | වස්තු-පුද්ගලයන්ගේ යථාර්ථය නොදැනීම නිසා මෙලොව-පරලොව සැප විඳීම උදෙසා පිං-පව් සිදු කිරීම. |
| (3) විඤ්ඤාණ | පෙර භවයේ අවසාන සිතේ විපාක සිත | අතීත භවයේ සිදුකරගත් පිං-පව් මරණ මොහොතේ සිහි වීමෙන් එම චුති චිත්තයට අනතුරුව ඇති වන ප්‍රතිසන්ධි සිත |
| (4) නාම රූප | පංචස්කන්ධයයි. (වේදනා,සංඥා,සංස්කාර විඤ්ඤාණ සහිත රූපය) | විඤ්ඤාණය සමග බැඳී පවතින වේදනා,සංඥා, හා සංස්කාර යන නාම කාණ්ඩය හා එය දරාගන්නා රූප කාණ්ඩය(කළල රූපය) |
| (5) සළායතන | සිත හටගත් කළල රූපයේ සළ-ඉන්ද්‍රියන් ඇතිවීම | ශරීරය ලෙස වර්ධනය වන රූප කාණ්ඩයේ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන අරමුණු දැන ගැනීමට සිතට උපකාර ඉන්ද්‍රියන් පහළවීම. |
| (6) ඵස්ස | ඉන්ද්‍රියන් සය තුළින් සිතෙහි අරමුණු ගැටීම | ඇස, කන, නාසය,දිව, ශරීරය හා මනස තුළින් අදාළ අරමුණු ස්පර්ශ කරමින් සිතේ පහළ වන චෛතසිකයයි. |
| (7) වේදනා | ගැටුණ අරමුණු නිසා තුන් ආකාර වේදනාවෙන් එක් ආකාරයක් ඇතිවීම | රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ,ධර්ම වශයෙන් ලැබෙන ආරම්මණයන්ගේ රසය සෝමනස්ස,දෝමනස්ස උපේක්ෂා යන තුන් ආකාරයෙන් විඳීම චෛතසිකයයි. |
| (8) තණ්හා | ෂඩ්ද්වාර ආරම්මණ තුළින් ඇතිවන වේදනාවට ඇලීම | ද්වාර සයෙහි ආලම්බනයන්ගේ වශයෙන්ද, අධ්‍යාත්මික,බාහිර වශයෙන්ද ත්‍රිවිධ වේදනා නිසා ත්‍රිවිධ තණ්හා ඇතිවීම. |
| (9) උපාදාන | තණ්හාවෙන් අරමුණු දැඩිව ගැනීම | අරමුණේ වේදනාව දියුණු වීමෙන්,එම වේදනාව කෙරෙහි ඇලීම බලවත් වීමෙන් උපාදාන ඇතිවේ. |
| (10) භව | උපාදානයෙන් සිදුකරන සකල භවගාමී කුසල අකුසල කර්ම භව වේ | කාම භව, උප්පත්ති භව, වශයෙන් සකල කුසල-අකුසල යන්ගෙන් සංසාරය දික්කරන භව ගාමී කර්මභවයෝ වෙති. |
| (11) ජාති | පෙර භවයේ කුසල අකුසල නිසා අනාගත භවයේ පංචස්කන්ධය පහළ වීම | මෙම සන්ධි ස්ථානය සංස්කාර-විඤ්ඤාණ වශයෙන් අතීත වර්තමාන භව සම්බන්ධය හා සමාන වේ.(සියුම් විස්තර පොත පතින් බලන්න) |
| (12) ජරා-මරණ | උපන් ජාතියේ ශරීරය දිරාපත් වෙමින් මරණයට පත්වීම | උපදින්නා වූ සියළු ජාතියක වෙනස් වෙමින්, ගෙවෙමින්, පැසීමෙන්, දිරීමෙන් විඤ්ඤාණය පැවැත්විය නොහැකි තත්වයට පත්වීම මරණයයි. |

අතීත භවයේ ප්‍රධාන හේතු 02 කි.

මරණය (චුති සිත)

(1) සන්ධිය

උප්පත්තිය (ප්‍රතිසන්ධි සිත)

අතීත හේතුන් නිසා වර්තමාන ඵල 05 කි.

සසර ගමන වෙනස්වීම ස්ථානය

(2) සන්ධිය

සසර ගමන නැවැත්වීම

වර්තමාන භවයේ හේතු 03

මරණය (චුති සිත)

(3) සන්ධිය

උප්පත්තිය (ප්‍රතිසන්ධි සිත)

වර්තමාන හේතු 03 නිසා අනාගතයේ ඇති වන ඵල 02 කි.

මෙම අතීත හේතු තුළ ○ තණ්හා ○ උපාදාන ○ භව, යන හේතුද ඇත.

වර්තමාන හේතු තුළ ○ අවිද්‍යාව ○ සංස්කාර යන හේතුද ඇත.

අනාගත ඵල වශයෙන් හඳුන්වන්නේ ○ විඤ්ඤාණ ○ නාම-රූප ○ සළායතන ○ ඵස්ස ○ වේදනා යන මේයි.



විශේෂ කරුණු :- * පටිච්ච සමුප්පාද ධර්මය වනාහි සම්මා සම්බුද්ධවරයෙකු ලොව පහළවීමෙන් අසන්නට ලැබෙන අති දුර්ලභම ධර්ම දේශනයකි. බොහෝ දෙනාගේ ජීවිත තුළ යම් සිඩාවක් ඇති වීමට හේතු නැතිවට වෙනත් කෙනෙකුගේ ක්‍රියා කලාපයක් දැක්වුවත් මෙම ධර්මයට අනුව ප්‍රධාන වරදකරු වන්නේ තමන්ගේ සිතේ කෙලෙස් බව වටහාගෙන සන්සුන් විය හැක.

* පටිච්ච සමුප්පාද විවරණය කර ඇත්තේ ආත්මභාව තුනක් අතර හේතු-ඵල දක්වමින් විස්තර කරමිනි. එහි මරණය සිදුවන අවස්ථා දෙකක් හා සසර ගමන දික් කරන වේදනා-තණ්හා සන්ධි ස්ථානය (සංසාර චක්‍ර නැවැත්වීමටද හැකි ස්ථානය එයයි.) දක්වා ඇත.

* සංසාරය හේතු-ඵල චක්‍රයක් නිසා එය විස්තර කිරීමේ ක්‍රම සිය ගණන් ඇත. බුදු සසරකින් දේශනා කරන බව විශුද්ධි මාර්ගයේ උපමාවකින් මෙසේ දක්වා ඇත. "වැල් උපයෝගී කරගෙන ජීවත් වන මිනිසෙකු සිය වැඩිට ඇති වැල් කෙළීම මෙසේ සිදු කරයි. වැලේ අග සිට මුල දක්වා, නැවත විටක මැදින් කපා අග දක්වා,විටෙක මැදින් කපා මුල දක්වාද, නැවත විටෙක මුලින් කපා අග දක්වා ගෙන යයි" බුදුන් වහන්සේද මෙසේ පටිච්ච සමුප්පාදය දේශනා කරන බව සඳහන් වේ.

* සසර ගමන හේතු-ඵල ධර්මයන් මැදින් මෙම පටිච්ච සමුප්පාද ධර්මය සිතා බොට ඉගෙන ගෙන මෙනෙහි කිරීම තුළින් සංසාරිල්ලක් මෙලොවදීම අප විඳිය හැක.ඒ තුළින් සසර ගමන නැවැත්වීම ඉක්මන් කරගත හැක.

පුණ්‍යානුමෝදනය :- බු.ව.2551 නිකිණි පුන් පොහෝ දින ධර්ම දානය වශයෙන් මෙම දහම් පත්‍රිකාව සකස් කොට (කඩවත ගුණානන්ද හිමි වන) අප විසින් පරිත්‍යාග කරන ලදී. මෙම පින් අනුමෝදනයෙන් නිවන් සැප ප්‍රාර්ථනා කෙරේවා !

උපකාරක පොත් :- පටිච්ච සමුප්පාදය, අභිධර්ම මාර්ගය, විදර්ශනා භාවනා, (රේරුකානේ චන්දවිමල හිමි රචිත) හා විශුද්ධි මාර්ගය

තෙරුවන් සරණයි !

3 අර්ථ චර්යාව

සමානාත්මතාව 4

1 කාය දුශ්චරිතය

2 වාග් දුශ්චරිතය

ස ත ර සෘ ධි පා ද

| සෘද්ධිපාද | කෙටි විස්තරය |
|---|---|
| ① ඡන්දිද්ධිපාදය | යමක් ලබා ගැනීම හෝ අතහැර ගැනීමට ඇති බලවත් කැමැත්ත ඡන්දයයි. මෙහි සඳහන් ඡන්දිද්ධිපාදය නම් සන්තානයෙහි පහළ නොකළ ධ්‍යාන හෝ මාර්ගඵල ඇතිකර ගැනීමේ කැමැත්ත. විශේෂයෙන්ම සසර දුකින් මිදීමේ දැඩි කැමැත්ත. |
| ② විරියිද්ධිපාදය | මෙතෙක් ජීවිතකාලයේ සිදුවී ඇති අකුසල් නැවත සිදු නොකර සිටීම හා සිදු නොවී ඇති අකුසල් ඇති වීමට ඉඩ නොතැබීමත්, සිදුකර ඇති කුසල් නැවත නැවත සිදු කිරීම වගේම උපදවා නැති කුසල් (ධ්‍යාන මාර්ග ඵල) සිදු කිරීමේ වීර්යය, කැමැත්ත විරියිද්ධිපාදයයි. |
| ③ චිත්තිද්ධිපාද | සෘද්ධිය ලැබෙන තුරු අන් දෙයකට නොනැමෙන අතිශයින් සෘද්ධියට නැමුණා වූ සිත පැවැත්වීම. නොයෙක් කාම විතර්කයන් සිහි වී සෘද්ධිය ලැබීම සඳහා පවත්වන සිත දුබල වන්නට නොදී පැවැත්වීමේ චිත්ත ශක්තිය චිත්තිද්ධිපාදයයි. |
| ④ විමංසිද්ධිපාදය | සසර පැවැත්ම විමසා බලා සසරේ අනිත්‍ය බව, දුක් බව, අනාත්ම බව, පැවැත්මේ භයානකත්වය, අපායික දුක්ඛිතත්වය, නුවණින් දැන සෘද්ධි අනුසස් හා ධර්මයේ හැසිරීමේ වටිනාකම, දැන ගන්නට සමත්වූ ඥානය විමංසා සෘද්ධියයි. |
| * එක් සෘද්ධියක් ඇත්තෙකුට වඩා සෘද්ධි දෙකක් ඇත්තෙකුට සසර කෙටි වේ. සෘද්ධි වැඩි වැඩි තරමට සසර මිදීම හෙවත් අර්හත් මාර්ග ඥානය පහළ කර ගැනීමේ කාලය ඉක්මන් වේ. | |

**ඒ ඒ සෘධි වඩා රහතන් වහන්සේලා වූවෝ**

1. චක්ඛුපාල මහරහතන් වහන්සේ - ඡන්දිද්ධිපාදය වඩා - රහත් වීමේ දැඩි කැමැත්ත වූ බැවින් රෝගී වූ දෙඇස් වලට කිසි ලෙස ප්‍රතිකාර නොකොට රහත්වීමට උත්සාහ කිරීම තුලින්ම රහත්වීම. (රහත් වීමත් ඇස් අන්ධ වීමත් එකවර සිදුවිය.)
2. සෝණ මහරහතන් වහන්සේ - විරියිද්ධිපාදය වඩා - යටි පතුල්හි රෝම වැඩීමට තරම් සියුම් සැප සම්පත් ළඟට ලැබුණද සසර බිය දැක සක්මනින් දැඩි වීර්යය කොට රහත් වීම. (ගවයෙකු මරන ස්ථානයක් මෙන් පතුල් පැලී ලේ වැගිරෙන තරමට සක්මන් කොට බුදුන් වහන්සේගේ උපදෙස් අනුව රහත් වීම.)
3. සම්භූත මහරහතන් වහන්සේ - චිත්තිද්ධිපාදය වඩා - සතර සතිපට්ඨානය අනුව (කායානු, වේදනානු, චිත්තානු, ධම්මානු යන සතර අනු පස්සනා වල) සිත පවත්වා ගැනීම. (සීත වනයේ හුදකලාව සිත එකඟ කර ගැනීම තුලින් රහත් වීම)
4. මෝඝරාජ මහරහතන් වහන්සේ - විමංසිද්ධිපාදය වඩා - සසර පැවැත්ම පිළිබඳව කරුණු කාරණා විමසා බලා සංසාරේ භයානකත්වය, අපායික දුකෙහි විශාලත්වය මෙනෙහි කොට රහත්වීම. (බුදුන් වහන්සේ දේශනා කළ ගාථාවක් මෙනෙහි කිරීම තුලින්)

**සෘද්ධි දියුණු වීම සඳහා** — සෘද්ධි දියුණු කර ගත්තවුන්ගේ චරිත මෙනෙහි කිරීම, සෘද්ධිපාද ඇත්තාවූ සත් පුරුෂයන් සේවනය කිරීම, සෘද්ධිපාද ඇතිවීමට හේතු වන ධර්ම දේශනා ඇසීම, ඒ ඒ චරිතාපදාන කියවීම, විදර්ශනා භාවනා කිරීම ආදිය.

**චරිත කිහිපයක්**

* සත් වසක් නොනිදා දාසය වසක් ගත පච්චා ගතවත පුරා රහත් වූයේ → මහා නාග තෙරුන් වහන්සේ
* විසි වසරක් ගත පච්චා ගතවත පුරා රහතන් වහන්සේ කෙනෙකු වූයේ → ඵුස්ස තෙරුන් වහන්සේ
* පයින් සක්මන් කිරීමට අපහසු වූ විට දණින් සක්මන් කර පසුව රහත් වූයේ → පීතිමල්ල තෙරුන් වහන්සේ
* නිදිමත කල්හි දියෙහි පා දමා, හිසෙහි පිදුරු බිස්සක් තෙමා තබා අනාගාමී වූයේ → මිලක්ඛ තෙරුන් වහන්සේ
* වසර දෙකක් තුල වචන දෙකක් පමණක් කථා කොට තුන්වන වසරේ රහත් වූයේ → ගංගා තෙරියි තෙරුන් වහන්සේ

(ගතපච්චාගතවත නම් පිණ්ඩපාත වැඩීමට පෙර සිතට ගත් භාවනා අරමුණින් බැහැර නොවී සිත පවත්වා ගෙනම ආපසු වැඩම වීමයි.)

**සත්තිස් (37) බෝධිපාක්ෂික ධර්ම** (ලෝකෝත්තර ඥාන පහළ වීමට වෙන් කර දක්වා ඇති උපකාරක ධර්ම)

| අංගය | කොටස |
|---|---|
| 1. කායානුපස්සනා<br>2. වේදනානුපස්සනා<br>3. චිත්තානුපස්සනා<br>4. ධම්මානුපස්සනා | සතිපට්ඨාන 04 |
| 5. නූපන් අකුසල් නූපදීම<br>6. උපන් අකුසල් දුරු කිරීම<br>7. නූපන් කුසල් උපදවා ලීම<br>8. උපන් කුසල් දියුණු කිරීම | සම්‍යක් ප්‍රධාන 04 |
| 9. ඡන්දිද්ධිපාද ①<br>10. විරියිද්ධිපාද ②<br>11. චිත්තිද්ධිපාද ③<br>12. විමංසිද්ධිපාද ④ | සෘද්ධිපාද 04 |
| 13. සද්ධින්ද්‍රිය<br>14. විරියින්ද්‍රිය<br>15. සතින්ද්‍රිය<br>16. සමාධින්ද්‍රිය<br>17. පඤ්ඤින්ද්‍රිය | ඉන්ද්‍රිය ධර්ම 05 |
| 18. සද්ධා බලය<br>19. විරිය බලය<br>20. සති බලය<br>21. සමාධි බලය<br>22. පඤ්ඤා බලය | බල ධර්ම 05 |
| 23. සති<br>24. ධම්මවිචය<br>25. විරිය<br>26. පීති<br>27. පස්සද්ධි<br>28. සමාධි<br>29. උපේක්ඛා | බොජ්ඣංග ධර්ම 07 |
| 30. සම්මා දිට්ඨි<br>31. සම්මා සංකප්ප<br>32. සම්මා වාචා<br>33. සම්මා කම්මන්ත<br>34. සම්මා ආජීව<br>35. සම්මා වායාම<br>36. සම්මා සති<br>37. සම්මා සමාධි | ආර්ය අෂ්ටාංගික මාර්ග 08 |

**විශේෂ කරුණු**

* බුදු රජාණන් වහන්සේ ආයුසංස්කාර හරණයට පෙර ආනන්ද හාමුදුරුවන්ට වදාළේ සතර සෘද්ධිපාද වැඩූ තැනැත්තෙකුට කල්පයක් හෝ ඊට වැඩි කාලයක් සිටිය හැකි බවයි. (තුන්වරක් වදාළ සේක.)
* ප්‍රතිසන්ධි විපාක සිත දීර්ඝ ආයුෂ ඇති බලවත් විපාක සිතක් නම් උපදින කාලයේ පරම ආයුෂ ඉක්මවා අවුරුදු දහස් ගණනක් ජීවත් විය හැකිය. ඒ සඳහා සතර සෘද්ධි පාද වැඩිය යුතුය. අදටත් ඉන්දියාවේ දීර්ඝ ආයුෂ ඇත්තවුන් ජීවත් වන බව සඳහන්ව ඇත. එහෙත් නියමිත ආයු කාලය මෙන් එම ශරීරය වෙනත් කටයුතු වල යෙදිය නොහැක.

---

**පුණ්‍යානුමෝදනය :-** බු.ව.2552 ඇසළ පුන් පොහෝ දින ධර්ම දානය වශයෙන් මෙම දහම් පත්‍රිකාව සකස් කොට (කඩවත ගුණානන්ද හිමි) වන අප විසින් වැලිගම්පිටියේ පදිංචි සත්ගුණවත් කාරියප්පෙරුම මහතා එම මහත්මියගේ ධන පරිත්‍යාගයෙන් මුද්‍රණය කරන ලදී. මෙම පිංකම එතුමා ඇතුළු ඔබ සැමටම 'නිර්වාණ අවබෝධය පිණිස හේතු වේවා' යි ප්‍රාර්ථනා කරමි.

**උපකාරක පොත් :-** බෝධි පාක්ෂික ධර්ම විස්තරය, අභිධර්ම මාර්ගය(රේරුකානේ හිමි රචිත)

තෙරුවන් සරණයි !

3 මනෝ දුශ්චරිතය

4 පිළුණුවූ සිතුවිලි

1 බුද්ධ විෂය — ධර්ම විෂය 2

## පඤ්ච ඉන්ද්‍රිය ධර්ම

| | ඉන්ද්‍රිය ධර්ම | කෙටි විස්තරය |
|---|---|---|
| ① | සද්ධා ඉන්ද්‍රිය | සෑම පිංකමක්ම උසස් පිංකමක් ලෙස සිදුකර ගැනීමට තුණුරුවන් කෙරෙහි පැහැදුණු බවත් විශ්වාසයත් තිබිය යුතුය. එසේම සද්ධා ඉන්ද්‍රියක් ලෙස ගැනීමේදී යම් භාවනාවක් තමනට ප්‍රිය වීමට, ආශ්වාදයක් ගෙන දීමට කරම් යෙදීමට තුණුරුවන් කෙරෙහි සද්ධාව තිබිය යුතුය. සිතෙහි සද්ධා නමැති චෛතසිකය බලවත් වී අන් චෛතසික යන්ගේ බලය ඒතුලින් පැවැත්වීම සද්ධා ඉන්ද්‍රියයි. |
| ② | විරිය ඉන්ද්‍රිය | සෑම කටයුත්තක්ම කිරීමට වීර්ය තිබිය යුතුය. කායික, මානසික වශයෙන් වීර්ය දෙයාකාර වේ. මෙහි සඳහන් වීර්ය මානසික වීර්යයි. එයද ප්‍රධාන වීර්ය, භාවනාමය වීර්ය වශයෙන් ප්‍රභේදයක් ඇති අතර වීර්ය ඉන්ද්‍රියයක් ලෙස දක්වන්නේ භාවනාවක ප්‍රතිඵලයක් ලැබෙන තුරු අඛණ්ඩව යෙදිය හැකි මනසේ බලවත් වූ වීර්යයයි. |
| ③ | සති ඉන්ද්‍රිය | පෘථග්ජන සත්වයාගේ සිත ස්වභාවයෙන්ම අකුසලයට බරව පවතින බැවින් එය කුසල පසෙකට හරවා ගැනීමට යම්කිසි මානසික බලයක් තිබිය යුතුය. එයට සතිය යයි කියනු ලැබේ. ඒ චෛතසික ධර්මය තමා හා යුක්ත වන චිත්ත චෛතසිකයන් තමාට අනුකූල කර වන්නා වූ බැවින් සති ඉන්ද්‍රියක් වශයෙන් දක්වයි. |
| ④ | සමාධි ඉන්ද්‍රිය | සිතේ ස්වභාවය අරමුණු ගැනීමයි. එක් අරමුණක් වුවද විවිධ ආකාරයෙන් බැලීමෙන් මුලින අරමුණ වූ ආකාරයට වඩා වෙනස් බව වැටහේ. එක් අරමුණක එක් ආකාරයට සිත් පරම්පරාව පැවැත්වීමේ සිතේ ඇති ඒකග්ගතාව චෛතසික(සමාධි) හා බැඳී පවත්නා චිත්ත චෛතසික ධර්ම ස්වභාවය මෙහි සමාධි ඉන්ද්‍රිය ලෙස දක්වයි. එහි ප්‍රභේද ඛණික, පරිකම්, උපචාර, අර්පණා වශයෙනි. |
| ⑤ | පඤ්ඤා ඉන්ද්‍රිය | අරමුණු නිවැරදිව දැන ගන්නා සිතේ ස්වභාවය ප්‍රඥාවයි. සාමාන්‍ය පුද්ගලයන් තුළද විටින් විට ඇති වුවද එය විදර්ශනා භාවනාවක් තුළින් පහළ කර ගන්නා ප්‍රඥාව තරම් බලවත් නොවේ. ලෝකයේ පරම සත්‍ය අවබෝධ වීමට අරමුණු නිවැරදිව වටහා ගැනීමට උපකාර ධර්මයක්වන සේ යෙදීමෙන් පහළ වන ප්‍රඥාව පඤ්ඤා ඉන්ද්‍රියයි. |

**ඉන්ද්‍රිය ධර්ම වැඩෙන අයුරු**

ඉන්ද්‍රිය ධර්ම වැඩීම කළ යුත්තේ සද්ධා ඉන්ද්‍රියයේ පටන්ය. බුදුරජාණන් වහන්සේගේ නව අරහාදි බුදුගුණ අනුව සිහිමෙන් මහත් වූ සද්ධාවක්, ගෞරවයක් බුදුරජාණන් වහන්සේ කෙරෙහි ඇති වන්නේය. එම නිසා උන් වහන්සේ වදාළ ධර්මය පිළිපදින්නට සිතට වීර්ය වැඩෙන්නේය. එබැවින් අකුසල් නොකිරීම කුසල් වැඩීමේ කැමැත්ත නිතර පවතින බැවින් සිහිය දියුණු වන්නේය. සිහිය යනු සති චෛතසික ප්‍රධාන කොට පවතින සතර සතිපට්ඨාන යයි. එය තුළින් සමාධිය වැඩෙන්නේය. දියුණු වූ සිතේ ඒකාග්‍ර බව නිසා සංසාරයේ භයානකත්වය, ස්ථිර නැති දීර්ඝ පැවැත්මක් බවත්, පැවැත්මේ නපුරත් යනාදී ගැඹුරු නුවණ පහළ වේ. ඒ තුළින් නිර්වාණය අවබෝධය පිණිස සමත් වූ පඤ්ඤාව පහළ වන්නේය.

( සද්ධාව ⟶ වීර්යය ⟶ සති ⟶ සමාධිය ⟶ පඤ්ඤාව ⟶ මාර්ග · ඵල )

**කුසීත වස්තු අට**

| ★ | දුබල වීර්යය ඉන්ද්‍රිය ඇති යෝගාවචරයා භාවනාවේ පසු බසින ආකාර | ☆ | දියුණු වීර්යය ඉන්ද්‍රිය ඇති යෝගාවචරයා භාවනාවේ පිළිපදින අයුරු |
|---|---|---|---|
| 1. | අද වැඩක් කොට මහන්සි වන්නට තිබෙනවා යැයිද | 1. | ඉදිරියේ වැඩක් කිරීමට, ගමනක් යාමට ඇති බැවින් එට පුරම භාවනාවේ යෙදෙන්නේය. |
| 2. | වැඩක් කොට මහන්සි වී සිටින බැවින්ද | 2. | වැඩක් කොට අවසන් වූ විට, ගමනක් ගොස් පැමිණීමෙන් අනතුරු වූ කාලයේ භාවනාවේ යෙදෙන්නේය. |
| 3. | ගමනක් ගොස් මහන්සි වන්නට තිබෙනවා යැයිද | 3 | ආහාර මඳ වූ විට ශරීරය සැහැල්ලු බැවින්ද, ආහාර වැඩි වූ විට ශක්තිය වැඩි බැවින්ද සිත වැඩිපුර භාවනාවේ යෙදෙයි. |
| 4. | ගමනක් ගොස් මහන්සි වී සිටින බැවින්ද | 4. | රෝගී තත්වය වැඩි වුවහොත් භාවනාව අනතුරෙන බැවින්ද, සුව වූ රෝගය නැවත හටගතහොත් භාවනාව අනතුරෙන බැවින් සිත භාවනාවේ යෙදෙන්නේය. |
| 5. | අද ප්‍රමාණවත් ආහාරයක් නොලත් බැවින්ද | | |
| 6. | අද ආහාර වැඩියෙන් ගත් බැවින්ද | | |
| 7. | සුළු රෝගයක් වැලඳී ඇති බැවින්ද | | |
| 8. | රෝගය සුව වූ විගස බැවින්ද, යලුවෙන් යෝග කර්මයේ නොයෙදී සිටියි.(අන් කටයුතු වලද මෙසේම කුසීත වේ.) | | |

**වීර්යයේ අනුහස්**

කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ ශාසනය පිරිහීම දැක සංවේගයට පත් භික්ෂූන් වහන්සේලා සත් නමක් මහ වනයට වැද කැණිය නොහැකි පර්වතයකට ඉණිමගක් බැඳ ජීවිතාශාව අත්හැර වීර්යයෙන් මහණ දම් පිරීමට පර්වතයට නැග ඉණිමග පෙරලා දැමිය. පළමු දින මහළු තෙරුන් වහන්සේ රහත් වූ අතර දෙවන දින අනෙක් තෙරුන් වහන්සේ අනාගාමි බවට පත්විය. අනෙක් භික්ෂූන් වහන්සේලා පස් නම පෘථග්ජන භාවයෙන් කළුරිය කොට දෙව්ලොව ඉපිද අප බුදුරජාණන් වහන්සේගේ ශාසනයේදී ධර්මය අවබෝධ කළහ. උන් වහන්සේලා මෙසේ ධර්මය අවබෝධ කර ගත්හ.

1. කුමාර කස්සප තෙරුන් වහන්සේ - දෙව්යෙකු යොමුකළ ප්‍රශ්න බුදුරජුන් විසඳුම් කෙළවර රහත් භාවයට පත්විය.
2. දබ්බමල්ලපුත්ත තෙරුන් වහන්සේ - සත් හැවිරිදි වියේදීම රහත් භාවයට පත්විය.(ආසන පනවන්නන්ගේ අග්‍රස්ථානය විය)
3. සභිය පරිබ්‍රාජක තෙරුන් වහන්සේ - බුදුන් වහන්සේගේ පළමු හමුවේදීම ප්‍රශ්න විචාරා අවසන රහත්ව පැවිදි බවට පත්විය.
4. දාරුචීරිය නම් ශ්‍රාවක තුමා - බුදුන් වහන්සේ පිණ්ඩපාතය වඩින අවස්ථාවේ දෙසුව කෙටි ධර්මය අසා තිබියදීම රහත්විය.
5. පුක්කුසාති රජතුමා - බුදුරජුන් පළමු හමුවේදීම ධර්මය ශ්‍රවණය කොට අනාගාමි බවට පත්විය.

**ඉන්ද්‍රිය ධර්ම බලවත් නම්**

ඉන්ද්‍රිය ධර්ම සම්පූර්ණ වැඩීමෙන් **රහත් වීමද**, එට වඩා මෘදු වූ විට **අනාගාමි වීමද**, එට වඩා මෘදු වූ විට **සකෘදාගාමි** වීමද, එට වඩා මෘදු වූ විට **සෝවාන්ද** වෙයි. ඒවාට වඩා මෘදු වූ විට **ධම්මානුසාරි සෝවාන් පුද්ගලයෙක්ද**, එට වඩා මෘදු වූ විට **සද්ධානුසාරි සෝවාන් පුද්ගලයෙකු** වන බව බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක.

---

පුණ්‍යානුමෝදනය :- බු.ව.2552 නිකිණි පුන් පොහෝ දින ධර්ම දානය වශයෙන් මෙම දහම් පත්‍රිකාව සකස් කොට (තටවත ගුණානන්ද හිමි) විසින් අප විසින් මුද්‍රණය කර පරිත්‍යාග කරන ලදී.
මෙම පිංකම් සියලු සැමටම 'නිර්වාණය අවබෝධය පිණිස හේතු වේවා' යි ප්‍රාර්ථනා කරමි.

උපකාරක පොත් :- බෝධි පාක්ෂිකධර්ම විස්තරය, අභිධර්ම මාර්ගය, බුද්ධ නීති සංග්‍රහය(වේරගොඩගේ ශාන්ති රචිත), අපදාන පාළිය

තෙරුවන් සරණයි !

3 කර්ම විපාකය — ලෝක විෂය 4

# කර්ම චතුෂ්කය

## ① කර්මයෙන් සිදු කරන කාර්යය

| | |
|---|---|
| 1. ජනක කර්මය → | අභිනව භවයක් ඇති කිරීම, උපන් භවයෙහි ප්‍රවෘත්ති විපාක සිත් හා රූප උපද්දවීම සිදු කරයි. |
| 2. උපස්ථම්භක කර්මය → | කුසලාකුසල කර්මයෙන් උපන් සත්වයාට අන්තරායකින් තොරව චිරාත් වීමට උපකාර සිදු කරයි. |
| 3. උප පීඩක කර්මය → | කුසලාකුසල කර්මයෙන් උපන් සත්වයාට වරින් වර හිරිහැර, පීඩා, දුක් කරදරයන් ඇති කිරීම සිදු කරයි. |
| 4. උප ඝාතක කර්මය → | උපන් සත්වයාට සියළු ආයුෂ භුක්ති විඳීමට නොදී අතරමග ජීවිතය නැසීම සිදු කරයි. |

## ② කර්ම විපාක දෙන පිළිවෙල

| | |
|---|---|
| 1. ගරුක කර්මය → | මරණින් මතු ඊනන්තරයෙන් විපාක දෙන කුසලාකුසල කර්ම (ධ්‍යාන කුසල විපාක හා පංචවිධ ආනන්තරිය අකුසල විපාක) |
| 1. ආසන්න කර්මය → | මරණාසන්න මොහොතේදී සිදු කර ගන්නා කුසලාකුසල කර්ම (ගරුක කුසලාකුසල නැතිවිට මෙය ඉදිරියට එයි.) |
| 3. ආචිණ්ණක කර්මය → | දින, සති, මාස හෝ අවුරුදු ගණන් අඛණ්ඩව සිදුකර ගන්නා කුසලාකුසල කර්ම (කළ වූ කම් හෝ වූ කම් නිතර සිහි කොට සතුටු වීම, පසු තැවීම) |
| 4. කටත්තා කර්මය → | ගරුක, ආසන්න, ආචිණ්ණක, කුසලාකුසල කර්ම නැතිවිට ඉදිරියට සිදුකළ කුසලාකුසල කර්ම විපාක ගෙන දෙයි. |

## ③ කර්ම විපාක දෙන කාලය

| | |
|---|---|
| 1. දෘෂ්ටධම්ම වේදනීය කර්මය → | ජවන සිත් හතේ පළමු සිතේ විපාක කර්මය කළ භවයේ විපාක ගෙන දෙයි. |
| 2. උපපජ්ජවේදනීය කර්මය → | ජවන සිත් හතේ සත්වන සිතේ විපාක මතු භවයේදී විපාක ගෙන දෙයි. |
| 3. අපරාපරිය වේදනීය කර්මය → | ජවන සිත් හතේ මැද සිත් පහ මතු භවයට අනතුරු භවයන්හි සිට පිරිනිවන් පාන තෙක් විපාක ගෙන දෙයි. |
| 4. අහෝසි කර්මය → | පළමු,සත්වෙනි [redacted] සිත්හි විපාක වර්තමාන, අනාගත භවයේදී විපාක නොදීමෙන් අහෝසි වේ.අපරාපරිය කර්ම පිරිනිවීමෙන් අහෝසි කර්ම වේ. |

## ④ කර්ම විපාක දෙන ස්ථානය


| | |
|---|---|
| 1. සතර අපාය (04) → | දස අකුසල කර්ම විපාක |
| 2. මනුෂ්‍ය හා සදෙව් ලොව (01 + 06) | දස කුසල කර්ම විපාක |
| 3. රූපාවචර බ්‍රහ්ම ලෝක (16) | (1-5) කොට්ඨාසවලට ධ්‍යාන කුසල විපාක(මහද්ගත කුසල්) |
| 4. අරූපාවචර බ්‍රහ්ම ලෝක (04) | (1-4) කොට්ඨාසවලට අරූප ධ්‍යාන කුසල්(මහද්ගත කුසල්) |

* අකුසල සිත් සන්තානයේ පවතින අවස්ථා

| | |
|---|---|
| 1. අනුශය අවස්ථාව | - අකුසල චේතනාවන් සිතට මතු නොවී පවතින අවස්ථාව. |
| 2. පර්යුට්ඨාන අවස්ථාව | - අවස්ථාවක් ලැබීමට අකුසල චේතනා සහිත සිත් පහළ වීම. |
| 3. වීතික්කම අවස්ථාව | - අකුසල ජවන සිත් මගින් කායික, වාචසික ක්‍රියා සිදුකිරීම. |

බුදු රජුන් / කර්මය හා ප්‍රජාව / සම්බන්ධය / දැක්වීම

කම්මුනා වත්තති ලෝකෝ - කර්මයෙන් ලෝකය පවතී.
කම්මුනා වත්තති පජා - කර්මයෙන් ප්‍රජාව පවතී.
කම්මනිබන්ධනා සත්තා - කර්මය සත්වයෝ බැඳී කොට ඇත්තාහ.
රථස්සාණීව යායතෝ - යන්නාවූ කරත්තයේ රෝදය කඩ ඇණය නිසා පවතින්නාක් මෙනි.



* කුසල කම් සිදු කරන විට අකුසල සිත් පවතින ආකාර

| | |
|---|---|
| 1. සද්ධා අවස්ථාව | - යම් කුසලක් ක්‍රියාවක් සිදුකරන, සිතන විට අකුසල සිත් යටපත් වී පැවතීම. |
| 2. වික්ඛම්භන අවස්ථාව | - ධ්‍යානයක් උපදවා එම කම් වැඩ සිටින විට අකුසල සිත් යටපත් වී පැවතීම. |
| 3. සමුච්ඡේද අවස්ථාව | - සතර මාර්ග ඵලයන්ට පත් වීමේදී ඒ ඒ මාර්ගයෙන් අකුසල සිත් විනාශ වීම. |

**කර්ම ශක්තිය :-**
කර්ම විෂය යනු අචින්ත්‍ය විෂයන් ගෙන් එකකි. නමුත් අපට වටහා ගත හැකි තරමට එය තේරුම් ගෙන සිටීම ජීවිතයේ සාර්ථක භාවයට හේතු වේ. ලොව සියලු සිදුවීම් කර්මය තුළින් සිදුනොවන බවත් කර්මය ප්‍රධාන වන බව බුදු රජාණන් වහන්සේ දේශනා කළහ. ලොව වෙනස්වීම් ක්‍රියාකාරී වන්නේ අපගේ සිතයි. එම සිතේ ඇතිවන ජවන සිත් පරම්පරාවල් වල පළමු සිතේ විපාක (දිට්ඨ ධම්ම) මෙලොව මෙම ආත්ම භාවයේ ලැබේ. එට අමතරව පෙර ආත්ම භවයේ ඇතිවූ ජවන සිත් පරම්පරා වල සත්වන ජවන සිත් විපාක(උපපජ්ජ) මෙම ආත්මයට විපාක ගෙන දේ. එවිත් අමතරව පෙර ආත්ම භාවයට පූර්ව ආත්ම භාවවල (අනන්ත සංසාරේ) ඇතිවූ ජවන සිත් හතේ පරම්පරා වල මැද ජවන සිත් පහ [illegible] වූ සිත්හි විපාකද මෙම ආත්මයට විපාක ගෙන දේ. මෙසේ අපි දිට්ඨ ධම්ම, උපපජ්ජ, අපරාපරිය වශයෙන් කර්ම විපාක විඳිමින් අනාගත ආත්මයන්ටද විපාක රැස් කරයි. අපගේ කර්ම ශක්තිය [illegible] අපට බලපෑම් කරන්නේ, අපේ කර්ම විපාක වශයෙන් සෑම සත්ව-පුද්ගලයෙකුම ඔවුන්ගේ කර්ම ශක්තිය විපාක විඳියි. ඔවුනොවුන් කර්ම විපාක විඳින විට [illegible] අප අපට කර්මයේ [illegible] වශයෙන් [illegible], [illegible], ඇති කරයි. [illegible], [illegible], දුදන, [illegible], වශයෙන් [illegible], [illegible] වශයෙන්, [illegible] වශයෙන්, [illegible] වශයෙන් සියළු දෙනාගේ කම් ශක්තියේ විපාක විඳින විට [illegible] විපාක සැමට විඳවීම සිදුවේ. මෙසේ [illegible] සියළු ශක්තීන් අභිබවා කම් ශක්තිය බලවත් බව වටහා ගත හැක.

පුණ්‍යානුමෝදනය :- බු.ව.2551 වප් පුන් පොහෝ දින ධර්ම දානය වශයෙන් මෙම දහම් පත්‍රිකාව සකස් කොට (පවිත්‍ර ගුණානන්ද හිමි) විසින් අප විසින් පරිත්‍යාග කරන ලදී. මෙම පින්කම් අනුමෝදනයෙන් සැම සැමට නිවන් සැප පිණිස හේතු වේවා !

උපකාරක පොත් :- අභිධර්ම මාර්ගය, සූවිසි මහා ගුණ, (රේරුකානේ චන්දවිමල හිමි) හා වෙනත් - දින පොත

තෙරුවන් සරණයි !

1 පරියාය

2 සිහින

" සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, ආහුනෙය්‍යො, පාහුනෙය්‍යො, දක්ඛිණෙය්‍යො, අඤ්ජලිකරණීයො, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති "

නවාකාර මහා සඟ ගුණ

| | සඟ ගුණ | ශ්‍රාවක සඞ්ඝරත්නයේ ගුණයන්හි කෙටි විස්තරය |
|---|---|---|
| ① | සුපටිපන්න | ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ රත්නය අධිශීල, අධිචිත්ත, අධි ප්‍රඥාවෙන්ද සුන්දර ප්‍රතිපත්තියෙන්ද යුක්ත වූ බැවින් සුපටිපන්න ගුණයෙන් යුක්තයි. |
| ② | උජුපටිපන්න | ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ රත්නය අධිශීල, අධිචිත්ත, අධි ප්‍රඥාවෙන්ද සෘජු වූ ප්‍රතිපත්තියෙන්ද යුක්ත වූ බැවින් උජුපටිපන්න ගුණයෙන් යුක්තයි. |
| ③ | ඤායපටිපන්න | ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ රත්නය අධිශීල, අධිචිත්ත, අධි ප්‍රඥාවෙන් හා නිවන දකින ප්‍රතිපත්තියෙන්ද යුක්ත වූ බැවින් ඤායපටිපන්න ගුණයෙන් යුක්තයි. |
| ④ | සාමීචිපටිපන්න | ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ රත්නය අධිශීල, අධිචිත්ත, අධි ප්‍රඥාවෙන් හා ගරුකළ යුතු ප්‍රතිපත්තියෙන්ද යුක්ත වූ බැවින් සාමීචිපටිපන්න ගුණයෙන් යුක්තයි. |
| ⑤ | ආහුනෙය්‍ය | යුගල වශයෙන් සතරක් වූ පුද්ගල වශයෙන් අටක් වූ මහා සඞ්ඝ රත්නයට ඉතා දුර සිට ගෙනෙන සිව්පසයෙන් පුදන්නට සුදුසු වූ බැවින් සඞ්ඝ රත්නය ආහුනෙය්‍ය ගුණයෙන් යුක්තයි. |
| ⑥ | පාහුනෙය්‍ය | අෂ්ටායාර්ය පුද්ගල මහා සඞ්ඝ රත්නයට ඉතා දුර සිටද පැමිණෙන ආගන්තුකයන්ට පිළියෙළ කළ ආහාර පානයෙන්ද පුදන්නට සුදුසු වූ බැවින් පාහුනෙය්‍ය ගුණයෙන් යුක්තයි. |
| ⑦ | දක්ඛිණෙය්‍ය | යහ කරන පින්හය, මරණින් මතු උපදින ජීවිත, සසරෙන් තර කැමති උදෙසා කරන සියළු පූජාවන් පිළිගැනීමට සුදුසු වන බැවින් මහා සඞ්ඝ රත්නය දක්ඛිණෙය්‍ය ගුණයෙන් යුක්තයි. |
| ⑧ | අඤ්ජලිකරණීය | දෑතිලි බැඳ ගෞරව කරන වන්දනාවන් පිළිගැනීමට සුදුසු වන බැවින් මහා සඞ්ඝ රත්නය අඤ්ජලිකරණීය ගුණයෙන් යුක්තයි. |
| ⑨ | අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං | පිං සිදු කර ගැනීමට කැමති සැදැහැවතුන්ට උතුම් වූ පිං කෙතක් හෙවත් පුණ්‍යක්ෂේත්‍රයක් වූ බැවින් සඞ්ඝ රත්නය අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ගුණයෙන් යුක්තයි. |

" ඉමෙහි නවහි ගුණෙහි සමන්නාගතං සඞ්ඝ රතනං සරණං ගච්ඡාමි, සඞ්ඝ රතනං සිරසා නමාමි."

**ශ්‍රාවක සඞ්ඝ රත්නය** } ශ්‍රාවක යනු අසන්නා හෙවත් අනුශාසනා පිළිපදින්නා යන්නයි. එබැවින් ශ්‍රාවක සඞ්ඝ රත්නය අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥා යන ත්‍රි ශික්ෂාවෙන් යුක්තයි. උපාසක, උපාසිකා හෝ දෙවි, බඹුන් ලෙස සිට මාර්ග ඵලයන්ට පත්වීමේදී අධිචිත්ත, අධිප්‍රඥා වශයෙන් සඞ්ඝ රත්නයට සමාන විය හැකි වුවද අධි ශීලයට අසමාන වෙති. ඊට හේතු නම් උපසම්පදා ශීලය නමැති ශික්ෂාවන් හෙවත් බුද්ධ අවවාද පිළිපැදීමට ඔවුන්ට නොහැකි බැවිනය. එම නිසා අෂ්ටායාර්ය ශ්‍රාවක සඞ්ඝ රත්නයට කරන පූජාව මහත්ඵල මහානිසංස වේ. පෘථග්ජන භික්ෂූන් පමණක් නොව පෘථග්ජන සාමණේර නාහිමිවරුන් වහන්සේලාද අධිශීල ප්‍රතිපත්තියට ගමන් කරන පිරිසක් හෙයින් අෂ්ටායාර්ය මහා සඞ්ඝ රත්නයට කරන පූජා පිළිගැනීමට සුදුසු බව දක්වේ.

| | | | |
|---|---|---|---|
| **භික්ෂුවකගේ චතුපාරිශුද්ධි ශීලය** | 1. ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය | - | බුදුන් වහන්සේ පැනවූ විනය ශික්ෂාපදයන්ට අනුව කය-වචනය සංවර කර ගැනීම. |
| | 2. ඉන්ද්‍රිය සංවර ශීලය | - | ඇස,කන,නාසය,දිව,ශරීරය හා මනස මඟින් ගන්නා අරමුණු වලදී සංවර සිත පවත්වාගැනීම. |
| | 3. ආජීව පාරිශුද්ධි ශීලය | - | දිවි පැවැත්ම උදෙසා නොමනා කටයුතු කර දිවීමෙන් වැළකීම. |
| | 4. ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය | - | ලබන සිව්පසය ගැන ප්‍රයෝජනය සලකා බැලීමෙන් ප්‍රත්‍යවේක්ෂා කර පරිභෝජනය කිරීම. |
| **සිව්පසය පරිභෝජන කරන භික්ෂුව ඉන්ද්‍රිය භාවය** | 1. ඍණ පරිභෝජනය | - | සිව්පස දෙන අයට මහත්ඵල වීමට අනුරූපෙණෙන් වත් සමෙලිය නොවී පරිභෝජනය ණයකරුවකු ලෙසද |
| | 2. ථෙය්‍ය පරිභෝජනය | - | සිව්පස ප්‍රත්‍යවේක්ෂා නොවන් ප්‍රයෝජනය බෙහෙති නොකර පරිභෝජනය සොරකු ලෙසද |
| | 3. දායජ්ජ පරිභෝජනය | - | සෝවාන්, සකදාගාමී, අනාගාමී ඵලයන්ට පත්වූ සෙඛයන් බවට පත්ව පරිභෝජනය දායාද ලෙසද |
| | 4. සාමි පරිභෝජනය | - | රහත් භාවයට පත්ව සිව්පස පරිභෝජනය ස්වාමියෙකු ලෙස කරන පරිභෝජනය ලෙසද හඳුන්වේ. |
| **උපසම්පදා ශීලයේ භාවිත පිහිටුවිය නොහැකි කරුණු** | 1. මෛථුන්‍ය සේවනය | - | අමූ සත්වයන් හෝ පවත් මිනිසෙක් සිටියත් සමඟ වුවද මෛථුන්‍ය සේවනය කිරීම. |
| | 2. සොරකම් කිරීම | - | කොටුන් අත් සතු වස්තුවක් සොර සිතින් ගැනීම. |
| | 3. මිනිස් ජීවිතයක් තොරකිරීම | - | මිනිස් ජීවිතයක් නැති කිරීම, අන් අයෙකු ලවා කරවීම හෝ මරණයට දිරි ගැන්වීම. |
| | 4. නැති උතුරු මිනිස් ධර්මප්‍රකාශය | - | ධ්‍යාන හෝ මාර්ග ඵල වලට නමක් පත්ව නැතිව එසේ පත්ව ඇති බව ප්‍රකාශ කිරීම. (සිතා පද සතර ගැන සැකෙවින් දක්වා ඇත.) |

**දුශ්ශීල භාවය සෙවීම** } දුශ්ශීල භාවය යනු රකින ශීලය බිඳීමයි. ගිහි, සාමණේර ශීලයන් බිඳීමෙන් නැවත සමාදන් විය හැක. උපසම්පදා ශීලය යනු බුද්ධ අඥාවක් පරිදි කරන විනය කර්මයකි. එය කෝටියක් සංවර ශීලයේ පිහිටුවීම ලෙස හඳුන්වයි. එනමුත් සිතා පද හිමුනද මුල්ම සිතා පද සතරින් එකක් හෝ බිඳීමෙන් උපසම්පදාව අවසන් වේ. නැවත මේ ජීවිතය තුළ උපසම්පදා විය නොහැක. සාමණේර ශීලය සමාදන්ව ධර්ම මාර්ගයේ ගමන් කළ හැකිය. භික්ෂුත්වය විනාශ වීම බිඳෝරකම හා සිහුමිව සිඳුවන කරුණකි. එබැවින් ඒ ගැන පරික්ෂා කිරීම වෙනත් අයෙකුට තබා එම භික්ෂුවටද දුෂ්කර කරුණකි. තීරණය කිරීමට කරුණු බොහෝ ඇතත් අවසාන තීරණය වශයෙන් දක්වා ඇත්තේ භාවනාවක යෙදී තමන්ම තීරණය කර ගත යුතු බවයි.

**බුදුරජුන්ගේ සිහි ගැන්වීම** } 1.බුද්ධෝත්පාද දුර්ලභය 2.මනුෂ්‍යත්වය දුර්ලභය 3.ශ්‍රද්ධා සම්පත්තිය දුර්ලභය 4.ප්‍රව්‍රජ්‍යාව දුර්ලභය 5.සද්ධර්ම ශ්‍රවණය දුර්ලභය

**විශේෂ කරුණු** }
* ප්‍රතිවේධ ධර්මය වර්ෂ පන්දහසක් පවතින බව මනෝරථපූරණී අටුවාවේ සඳහන් අයුරු
* පැවිදි රූපයෙන් ලෝකයේ පෙනී සිටීමද පූජාවට භාජනය විය යුතු කරුණකි.
* පැවිදි රූපයක් කෙරෙහි සිත පහදා ගැනීම දිගු කලක් දෙව්-මිනිස් සැපයටත් නිර්වාණ පත්‍රා ලැබීමටත් හේතුවන මහත් වූ පිං කමකි.(සතර පෙර කිමින්නයි.)
* මැණිකක් වටා තොතරම් ගල් බොරලු එකතු වුවත් කිසිදා මැණිකේ අගය අඩු නොවන්නා සේ සඟ ගුණ කිසිදා නිඟ නොවේ.

| | |
|---|---|
| පළමු වර්ෂ 1000 | - සිව් පිළි සිඹියාවන් මහරහත් බව |
| දෙවන වර්ෂ 1000 | - මහරහත් බව |
| තුන්වන වර්ෂ 1000 | - අනාගාමී බව * |
| හතරවන වර්ෂ 1000 | - සකදාගාමී |
| පස්වන වර්ෂ 1000 | - සෝවාන් බවට ද, පත්විය හැකි බව දැක්වේ. |

පුණ්‍යානුමෝදනය :- බු.ව.2551 මැදින් පුන් පොහෝ දින ධර්ම දානය වශයෙන් මෙම දහම් පත්‍රිකාව සකස් කොට (ගාවර ගුණානන්ද හිමි) වන අප විසින් පරිත්‍යාග කරන ලදී. මෙම පින්කම අනුමෝදනයෙන් ඔබ සැමට නිවන් සැප පිණිස හේතු වේවා ! පනම්.

උපකාරක පොත් :- සුවිසි මහා ගුණ, ශාසනාවතරණය, උපසම්පදා ශීලය, උභය ප්‍රාතිමෝක්ෂය (රේරුකානේ නාහිමි රචිත)

තෙරුවන් සරණයි !

3 භික්ෂුව


රජ් කුමරා 4

www.aathaapi.org සංස්කරණය : 5.0

# සක්වල විභංගය

වැඩි විස්තර සඳහා ✆ 0777 772 556, 0777 484 529

## එක් සම්මා සම්බුදුවරයකුගේ ආඥා ක්ෂේත්‍රයකට මෙවැනි සක්වල කෝටි ලක්ෂයක් අයත්වේ



**නව මහා විදර්ශනා ඥාන**

| | විදර්ශනා ඥාන | කෙටි විස්තරය |
|---|---|---|
| ① | උදයව්‍යය ඥානය | විදර්ශනා භාවනාවේ යෙදෙන යෝගියා ක්‍රමානුකූලව සප්ත විශුද්ධීන්ගේ මාර්ගාමාර්ග ඥාන දර්ශන විශුද්ධිය දක්වා කර ගැනීමෙන් අනතුරුව නාම රූප ධර්ම උත්පාද ක්ෂණයටත් භංග ක්ෂණයටත් නාම රූපයන් ක්ෂණයක් පාසා ඉපදීමත් නැතිවීමත් ඉතා ප්‍රකටව පෙනෙන්නට වන ඥානය පහළ වීම උදයව්‍යය ඥානයයි. |
| ② | භංග ඥානය | නාම රූපයන්ගේ ඉපදීමත් නැතිවීමත් නිවැරදිව විමසුම් නුවණින් බලන යෝගියාට සියලු සංස්කාරයන්ගේ විනාශ වීම පමණක් ක්ෂණික මරණය බිඳුවැටීම දැනෙන ඥානය පහළ වීම භංග ඥානයයි. |
| ③ | භය ඥානය | යෝගාවචරයාට නාම රූපයන්ගේ ඉපදීම් බිඳීම් දෙක තිබී පිහිටීමට පවා නොපෙනී වේගයෙන් ක්ෂණිකව විනාශ වීම පෙනෙන්නට වන්නේය. තමාගේ, අනාගත යයි තත් මෙම නාම රූප විශ්‍රෙෂ් යේ ඇතිවීම මහත් භයක්, උවදුරක් ලෙස වැටහීමේ ඥානය පහළ වීම භය ඥානයයි. |
| ④ | ආදීනව ඥානය | නාම රූප හෙවත් සංස්කාර ධර්මයන්ගේ බිඳීයාම නිතිපතා සහිත උපාදානයන්ට නොවටිනා නිසා, සියලු බිඳීමෙන් පිළිකුල් සහිත සංස්කාරයන්ගේ අසාර බව දක්නා ඥානය පහළ වීම ආදීනව ඥානයයි. |
| ⑤ | නිබ්බිදා ඥානය | සංස්කාර ධර්මයන්ගේ අසාර බව අවබෝධ කරගත් යෝගාවචරයාට සංස්කාරයන්ගේ පැවැත්ම එපා වන්නේය. එසේ නාම රූප ධර්මයන් ගැන කලකිරීම් ඇතිවීමේ ඥානය පහළ වීම නිබ්බිදා ඥානයයි. |
| ⑥ | මුඤ්චිතුකම්‍යතා ඥානය | නාම රූපයන් කෙරෙහි කලකිරුණු යෝගාවචරයාට 'මෙයින් මිදෙනෙම්' යැයිද අසංඛත ධාතුව හෙවත් නිර්වාණ ධර්මයේ පිහිටමි. යයි කැමැත්ත පහළ වීමේ ඥානය මුඤ්චිතුකම්‍යතා ඥානයයි. |
| ⑦ | පටිසංඛානුපස්සනා ඥානය | සංස්කාරයන්ගෙන් මිදීමට කැමති යෝගාවචරයා නැවත නැවතත් අනිත්‍යාදියෙන් සංස්කාර ස්වභාවය පිරික්සන්නට සමත් වෙයි. එසේ පරීක්ෂා කරන යෝගාවචරයාට පෙරට වඩා ත්‍රිලක්ෂණයෙන් සංස්කාරයන්ගේ ස්වභාවය ප්‍රකටව දක්නා ඥානය පහළ වීම පටිසංඛානුපස්සනා ඥානයයි. |
| ⑧ | සංඛාරුපෙක්ඛා ඥානය | සංස්කාරයන්ගේ භය ආදීනව දැක සංස්කාරයන්ගෙන් මිදීමේ උත්සාහ කරන් එම මාර්ගය දැක ගමන සඵල කරගැනීම සඳහා සංස්කාර විමසීමේ බලවත් උත්සාහය අනතුරු සංස්කාරයන් කෙරෙහි පවත්වන උපේක්ෂා සහගතවීම විදර්ශනා ඥානය පහළ වීම සංඛාරුපෙක්ඛා ඥානයයි. |
| ⑨ | අනුලෝම ඥානය | සංඛාරුපෙක්ඛා ඥානය මුහුකුරා ගිය ලෝකෝත්තර ඥාන පහළ වන්නට ආසන්න කාලයේදී ලෝකෝත්තර මාර්ග ඥානයට අනුකූලව පවත්නා විදර්ශනා ඥානය පහළ වීම අනුලෝම ඥානයයි.(අනුලෝම ඥානයට අනතුරුව අතරක් නොසිට මාර්ග ඥානය පහළ වීම සිදුවේ.) |

** නව මහා විදර්ශනා ඥාන පහළ වීම සප්ත විශුද්ධි ඥාන දර්ශන ක්‍රමානුකූලව මුහුකුරා යැමේ තුළින්ම සිදුවේ. මෙම නව මහා විදර්ශනා ඥාන පහළ වීම සිදුවන්නේ සප්ත විශුද්ධීන්ගේ සයවැනි විශුද්ධිය වන ප්‍රතිපදා ඥාන දර්ශන විශුද්ධිය තුළිනි. විදර්ශනා ඥාන කරා එක් එක් මාර්ගයට පත් වීමට පෙර වඩ වඩාත් බලවත්ව ඇතිවීම තුළින් ඒ ඒ මාර්ග ඵලයට පත්වීම සිදු වේ.සිව්වන දක්නා විට නිර්වාණ ධර්ම විශේෂිත වශයෙන් පරතේ වී පවතී. කෙලෙස් බලවත් හඬ සිට වඩ වඩාත් පහෙළිපිට සිව්ව දැකීම තුළින් අවස්ථා සතරේදී සියලු කෙලෙස් සම්පූර්ණයෙන් නැසේ. එසේ ඇතිවන නිර්වෘද ඥානය, ඥාන දර්ශන විශුද්ධියයි. විදින සුපාන සෝතාපන්න නිවන් දුටුවෝයි. පිරිනිවීමෙන් අනුපාදිශේෂ නිවන් දුටුවෝයි.*

**භංග හා භය උපමා වශයෙන් දැක්වීම** — නාම රූප,අරූප ලෝකයෙහි සංස්කාරයෝ කළගෙන අව පුපුරන්නාක් මෙන්ද, වැසි වසින විට ජලයෙහි මතුවන දිය බුබුළු බිඳී බිඳී යන්නාක් මෙන්ද, මිත් කෑලියක ගෙන බුබුළු ඉපිද ඉපිද බිඳී බිඳී යන්නාක් මෙන්ද, සංස්කාර ධර්මයන් ඇතිවී නැතිවී යාම නිරන්තරයෙන්ම සිදුවේ. මෙම සංස්කාර ස්වභාවය දක්නා ඥානය පහළ වූ විට ලුවට ගින්නකට හසුවූ භාවිතා මෙන් මහත් බියක් සංස්කාරයේ පැවැත්ම කෙරෙහි ඇති වන්නේය. බියක් දැනීමේ උකුම් බව වැටහෙන්නේය.

**සෝවාන් මාර්ග-ඵලයට පත්වීම** — සංස්කාරයන් ත්‍රිලක්ෂණයන්ට අනුව බැලීමෙන් පහළ වන නව මහා විදර්ශනා ඥානයන්ගේ අන්තිම ඥානය වන අනුලෝම ඥානයට අනතුරුව අතරක් නොමැතිව ලෞකික භවය ඉක්මවා ලෝකෝත්තර අවස්ථාවට සිත් පරිවර්තනය පැමිණීම පිණිස එසෙයක් අරමුණු කළ සංස්කාර ධර්ම අනාගාර එකෙනෙහි නිවන් අරමුණෙහි එල්බෙමින් ගෝත්‍රභූ ඥානය පහළ වේ. ඒ සමගම නිවන අරමුණු කරමින් සෝතාපත්ති මාර්ග සිත ඇතිවේ. එම මාර්ග සිත ක්ෂණයෙන් නිරුද්ධ වීමත් සමග ඒ හා සමාන අංග වලින් යුත් ඵල සිත් දෙකක් හෝ තුනක් පහළ වී නිරුද්ධ වේ. මෙය සෝවාන් ඵලයට පත්වීමයි.

**සකෘදාගාමි මාර්ග-ඵලයට පත්වීම** — සංස්කාර උදයව්‍යය ඥානයේ පටන් අනුලෝම ඥානය අවසන් කොට ඇති නව මහා විදර්ශනා ඥාන වැඩීම තුළින් පළමු වරට වඩා බලවත්ව සංස්කාරයන්ගේ ත්‍රිලක්ෂණයෙන් එක් ලක්ෂණයක් ප්‍රකට වී අනුලෝම ඥානය අනතුරුව නිවන් අරමුණෙහි එල්බ සිටින අරමුණු කරමින් සකෘදාගාමි මාර්ග සිත ඇතිවේ. එම මාර්ග සිත ක්ෂණයෙන් නිරුද්ධ වීමත් සමග ඵල සිත් දෙකක් හෝ තුනක් පහළ වී නිරුද්ධ වේ. මෙය සකෘදාගාමි ඵලයට පත්වීමයි. (සකෘදාගාමි ඵලයට පත්වීම සිලයේ උපරිම අවස්ථාවයි.)

**අනාගාමි මාර්ග-ඵලයට පත්වීම** — සංස්කාර උදයව්‍යය ඥානයේ පටන් අනුලෝම ඥානය අවසන් කොට ඇති නව මහා විදර්ශනා ඥාන වැඩීම තුළින් දෙවන වරට වඩා බලවත්ව සංස්කාරයන්ගේ ත්‍රිලක්ෂණයෙන් එක් ලක්ෂණයක් ප්‍රකට වී අනුලෝම ඥානය අනතුරුව නිවන් අරමුණෙහි එල්බ සිටින අරමුණු කරමින් අනාගාමි මාර්ග සිත ඇතිවේ. එම මාර්ග සිත ක්ෂණයෙන් නිරුද්ධ වීමත් සමග ඵල සිත් දෙකක් හෝ තුනක් පහළ වී නිරුද්ධ වේ. මෙය අනාගාමි ඵලයට පත්වීමයි. (අනාගාමි ඵලයට පත්වීම සමාධියේ උපරිම අවස්ථාවයි.)

**අර්හත් මාර්ග ඵලයකට පත්වීම** — සංස්කාර උදයව්‍යය ඥානයේ පටන් අනුලෝම ඥානය අවසන් කොට ඇති නව මහා විදර්ශනා ඥාන වැඩීම තුළින් තෙවන වරට වඩා බලවත්ව සංස්කාරයන්ගේ ත්‍රි ලක්ෂණයෙන් වඩාත් ප්‍රකට එක් ලක්ෂණයකින් ප්‍රකට වී අනුලෝම ඥානයට අනතුරුව නිවන් අරමුණෙහි එල්බ සිටින අරමුණු කරමින් අර්හත් මාර්ග සිත ඇති වේ. එම මාර්ග සිත ක්ෂණයෙන් නිරුද්ධ වීමත් සමග ඵල සිත් දෙකක් හෝ තුනක් ඇතිවී නිරුද්ධ වේ. මෙම අවස්ථාව අර්හත් භාවයට පත්වීමයි.(අර්හත්වයට පත්වීම ප්‍රඥාවේ උපරිම අවස්ථාවයි.)

**මාර්ග සිත් පහළ වීම සමග සිදුවන පොදු කාර්යයන් සතර**

1. සංස්කාරයන්ගේ දුක (අනිත්‍ය/අනාත්ම) ස්වභාවය තතු සේ දැකීම.
2. සමුදය ප්‍රහාණය හෙවත් අවිද්‍යා තෘෂ්ණා දෙකෙන් යුත් කෙලෙස් මුල් සුන් කිරීම(සුන් කිරීම)
3. නිරෝධය ප්‍රත්‍යක්ෂවීම හෙවත් නිවන දැකීම.
4. මාර්ගය සම්පූර්ණ වීම හෙවත් අෂ්ටාංගික මාර්ග අංග එක සිතක පහළ වීම.

**සැලකිය යුතුයි :-** ඒ ඒ මාර්ග ඵලයන්ට පත්වීමත් සමග කාමච්ඡන්දාදි නිවරණ ධර්ම විෂ්කම්භන වශයෙන් යටපත් වීම නිසා ධ්‍යාන නොවැඩුවද මාර්ග ඵලයකට පත්වන විට ස්වභාවයෙන්ම ප්‍රථම ධ්‍යානයෙන් යුක්ත වේ.

**විශේෂ කරුණු :-** මාර්ග ඵලයකට පත්වන අවස්ථා පසක් සඳහන් වන අතර ඒ හැම අවස්ථාවකම නව මහා විදර්ශනා ඥාන පහළ වීම තුළින් මාර්ග ඵලයන්ට පත්වේ. සිතේ ක්‍රියාකාරි බව ඉතා වේගවත් වන බැවින් මාර්ග ඵල චිත්ත වීථි යනර එකම ඉරියව්වකදී හෝ එම භවයේ අවස්ථා සතරේදී හැන්නම් ආත්මභාව කිහිපයක් තුළදී ඇති වේ.(සෝවාන් වීමෙන් ආත්ම හත් තුළදීය.)

| * මාර්ග ඵල චිත්ත වීථි මෙසේය |
|---|
| 1 ◦ භවාංග චලන සිත |
| 2 ◦ භවාංග උපච්ඡේද සිත |
| 3 ◦ මනෝද්වාරාවර්ජන සිත |
| 4 ◦ පරිකර්ම සිත |
| 5 ◦ උපචාර සිත |
| 6 ◦ අනුලෝම සිත |
| 7 ◦ ගෝත්‍රභූ/වෝදාන සිත |
| 8 ◦ මාර්ග(සෝවාන්,සකෘදාගාමි,අනාගාමි,අර්හත්) |
| 9 ◦ ඵල සිත |
| 10 ◦ ඵල සිත |
| 11 ◦ (ඵල සිත) |
| 12 ◦ භවාංග සිත |

**පුණ්‍යානුමෝදනය :-** බු.ව. 2552 නවම් පුන් පොහෝ දින ධර්ම දානය ලෙස මෙම දහම් පත්‍රිකාව (නවමහ ගුණානන්ද හිමි) වන අප විසින් සකස් කොට හොරණ පදිංචි සැදැහැවත් දායකයක මහතාගේ ධන පරිත්‍යාගයෙන් මුද්‍රණය කොට බෙදා දෙන ලදී. මෙම ධර්ම දානය එතුමා ඇතුළු සැමට නිවන් අවබෝධය පිණිස හේතුවේවායි ප්‍රාර්ථනා කරමි !

**උපකාරක පොත් :-** විදර්ශනා භාවනා ක්‍රමය,සතිපට්ඨාන භාවනා ක්‍රමය, අභිධර්ම මාර්ගය(රේරුකානේ චන්දවිමල හිමි රචිත), ආනාපාන සති භාවනා (බලන්ගොඩ ආනන්ද මෛත්‍රීය හිමි රචිත)

තෙරුවන් සරණයි !

1 ගති සම්පත්ති (උසස් ආත්මභාවය)

උපධි සම්පත්ති (රූපවත් බව) 2

## සප්ත බෝධ්‍යංග ධර්ම

| | බෝධ්‍යංග | කෙටි විස්තරය |
|---|---|---|
| ① | සති | කාය, වේදනා, චිත්ත හා ධම්ම (සතර සති පට්ඨාන) යන අරමුණු සිතට මතුපර දිමින් එහි සිහිය පිහිටුවා සිත කුසල පක්ෂයේ ගමන් කරවීම සිදු කරන නිසා සති සම්බොජ්ඣංගයයි. සිහියෙන් තොර සත්වයාගේ සිත අකුසලයේ ගමන් කරන බැවින් සතිය මාර්ගඥාන උපදවීමට උපකාර බෝධ්‍යංගයයි. |
| ② | ධම්මවිචය | දුකෙන සඳහන් ධම්ම ආරම්මණයේදි ස්කන්ධ, ධාතු, ආයතන, ඉන්ද්‍රිය, චතුරාර්ය සත්‍යය, පටිච්ච සමුප්පාදය යනාදී ධර්ම මනාව විචෙනිම ධම්මවිචය සම්බොජ්ඣංගයයි. මෙසේ වැටහුණු නුවණ තුලින් සංස්කාරයන්ගේ නිස්සාරය අවබෝධ වේ. එබැවින් ධම්මවිචය මාර්ගඥාන පහළ වීමට උපකාර බෝධ්‍යංග ධර්මයකි. |
| ③ | විරිය | අලස නිවන්, පසු බැසීමක් නැතිව හොඳින් භාවනාවක් කළ හැකි බව විරිය සම්බොජ්ඣංගයයි. සතර සම්යක් ප්‍රධානයේ දැක්වෙන උපන් අකුසල් දුරු කිරීම ආදි විරිය තුලින් විශ්වාසට ප්‍රතිපක්ෂ කෙලෙස් දුරු කොට ලෝකෝත්තර මාර්ග ඥාන පහළ වීමට විරිය උපකාර බෝධ්‍යංග ධර්මයකි. |
| ④ | පීති | භාවනාවේ යෙදීමේදි එය පිළිබඳව ලබන ආස්වාදය, සතුට, පීති සම්බොජ්ඣංගයයි. ප්‍රීතියක් ඇතිවන ආකාරයට භාවනාවේ යෙදීම දුෂ්කර වන බැවින් බොහෝ දෙනා භාවනාව අතරමග දමන්නේය. ප්‍රීතියක් ඇතිවන සේ කරන භාවනාවක් තුලින් භාවනාවේ අරතිය දුරුකර මාර්ග ඥාන උපදවීමට උපකාර වේ. එබැවින් පීතිය බෝධ්‍යංග ධර්මයකි. |
| ⑤ | පස්සද්ධි | වෙහෙසක් නැතිව, පීඩාවක් නැතිව, සුවසේ භාවනාවක් කළ හැකි ස්වභාවය පස්සද්ධි සම්බොජ්ඣංගයයි. සමාධි සිතක් ඇති කිරීමට ප්‍රතිපක්ෂ කෙලෙස් මගින් සිත-කය වෙහෙස කිරීම, දැවීම, තැවීම ඇති කරයි. පස්සද්ධි චෛතසිකය යෙදෙන සිත් මගින් එම ස්වභාවය දුරු කොට මාර්ගඥාන උපදවීමට උපකාරී බෝධ්‍යංගයයි. |
| ⑥ | සමාධි | භාවනාරම්මණයෙහි සිත මනා කොට පිහිටන, නොවිසිරෙන, නොසැලෙන ස්වභාවය සමාධි සම්බොජ්ඣංගයයි. එසේ බලවත් වූ සමාධි සිතේ කාමච්ඡන්ද ආදි නීවරණ යටපත් වී ඇති බැවින් සංස්කාරයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, ලක්ෂණ ප්‍රකටවී මාර්ග ඥාන උපදවීමට උපකාරී වේ. එබැවින් සමාධිය බෝධ්‍යංග ධර්මයකි . |
| ⑦ | උපේක්ෂා | විරියය සමාධිය සම කරගෙන නිරුත්සාහයෙන් මෙන් භාවනාව කරගෙන යා හැකි ස්වභාවය උපේක්ෂා සම්බොජ්ඣංගයයි. චිත්තයාගේ හැකිලෙන බව හා සැලෙන බවද විවාට පත්‍ර ක්ලේශයන් දුරු කොට සිත සමව පවත්වා මාර්ගඥාන උපදවීමට උපකාරක බෝධ්‍යංගයයි උපේක්ෂාව. |

*✱ බෝධ්‍යංග යනු 'බෝධි' හා 'අංග' යන වචන දෙකෙහි එකතුවකි. නිර්වාණය අවබෝධ කරන්නාගේ අංගයෝ වන බැවින් මෙම ධර්ම සමූහයට 'බොජ්ඣංග' යැයි ව්‍යවහාර කරයි. අඳුර නසන ආලෝකය මෙන් නිර්වාණයට ප්‍රතිපක්ෂ ක්ලේශ ධර්ම යටපත් කොට නිර්වාණ පසක් කිරීම පිණිස උපකාර වීම බෝධ්‍යංග ධර්ම සිදු කරයි. එබැවින් ලෞකික-ලෝකෝත්තර උභය සුව බොජ්ඣංග ධර්ම තුලින් ලබා ගත හැකි.*

**බෝධ්‍යංග ධර්ම වැඩීමට හේතු කරුණු (අටුවාවේ සඳහන් පරිදි)**

1. සිහියෙන් තොර පුද්ගලයන් වර්ජනය කරන බව, සිහි ඇත්තවුන් සේවනය කරන බව (තවත් කරුණු 02 ක් ඇත.)
2. ස්කන්ධ ආදි ධර්මයන් පිළිබඳ ප්‍රශ්න විචාරන බව, නුවණැතියන් සේවනය කිරීමය. (තවත් කරුණු 03 ක් ඇත.)
3. අපාය භය ගැන නිතර සිතන බව, වීර්යයේ අනුසස් දක්නා බව (තවත් කරුණු 09 ක් ඇත.)
4. බුදුගුණ ආදිය භාවනා මෙනෙහි කරන බව, තමාගේ සීලයේ ගුණ නිතර සිහි කිරීම (තවත් කරුණු 09 ක් ඇත.)
5. සතප ඇති සත්‍ය ගුණය සේවනය කිරීම, මධ්‍යස්ථ ප්‍රයෝග ඇති බව (තවත් කරුණු 05 ක් ඇත.)
6. සමාධියක් ඇති පුද්ගලයන් සේවනය කිරීම, ධ්‍යාන මාර්ගඵල ධර්ම මෙනෙහි කිරීම (තවත් කරුණු 09 ක් ඇත.)
7. සත්වයන් කෙරෙහි මැදහත් බව පැවැත්වීම,සංස්කාරයන් කෙරෙහි මැදහත් බව (තවත් කරුණු 03 ක් ඇත.)

**බෝධ්‍යංග සමාන කොට දැක්වීම**

| සප්ත බොජ්ඣංග | | සප්ත රත්නය |
|---|---|---|
| ✱ සති සම්බොජ්ඣංග | = | ✱ චක්‍ර රත්නය |
| ✱ ධම්මවිචය සම්බොජ්ඣංග | | ✱ හස්ති රත්නය |
| ✱ විරිය සම්බොජ්ඣංග | | ✱ අශ්ව රත්නය |
| ✱ පීති සම්බොජ්ඣංග | | ✱ මාණික්‍ය රත්නය |
| ✱ පස්සද්ධි සම්බොජ්ඣංග | | ✱ ස්ත්‍රී රත්නය |
| ✱ සමාධි සම්බොජ්ඣංග | | ✱ ගෘහපති රත්නය |
| ✱ උපේක්ෂා සම්බොජ්ඣංග | | ✱ පරිනායක රත්නය(පුත්‍ර) |

*✱ සක්විති රජෙකුට පුරා මහ පොළොවටම රජ වීමට පහළ වන සප්ත රත්නය මෙලොව ඇති උසස්ම ලෞකික සැපයයි. ඒ සඳහා වීර්ය තුලින් උපකාර කළ යුත්තේ සප්ත බෝධ්‍යංග ධර්මයටය. එසේත් බෝධ්‍යංග ධර්ම වඩවා ගත් යෝගාවචරයෙකු විඳින සුවය සක්විති රජකු විඳින සුවයට වඩා අති මහත් සුවයකි. බුදුරජාණන් වහන්සේ ධර්මයේ උතුම් බව "සබ්බ රසං ධම්ම රසො ජිනාති " යි දිනක් සක් දෙව් රජුට වදාළ සේක.*

**සසර සංවේගය උපදින කරුණු**

1. ජාතිය ය, 2. ජරාව ය, 3.ව්‍යාධිය ය, 4. මරණය ය, 5. අපායොත්පත්තිය ය, 6. අතීත සංසාර දුක්ඛ ය,
7.අනාගත සංසාර දුක්ඛ ය, 8. ආහාර සෙවීමේ දුක්ඛ ය, යන කරුණු අට මෙනෙහි කිරීමෙනි.
(භාවනාවේ අරතිය දුරු කිරීමට, සසරින් එතර වීමට කරන වීර්ය දියුණු වීමටත් උපකාරී වේ.)

**විශේෂ කරුණු**

✱ යාම, හිඳීම, සිටීම, නිදීම යන සතර ඉරියව්වෙන් සත්වයා පවතින්නා මෙන් සීලය මත බෝධ්‍යංග වැඩෙන්නේය.
✱ සීලය, කල්‍යාණ මිත්‍ර සේවනය, යෝනිසෝ මනසිකාරය, බොජ්ඣංග ධර්මයට ප්‍රධාන නිශ්‍රය ධර්ම වේ.
✱ බෝධ්‍යංග ධර්ම වඩන්නා දිළින්දෙකු නොවේ.(බෝධ්‍යංග ධර්ම එකිනෙකට සම වන අයුරින් වැඩීම කළ යුතුය.)
✱ බෝධ්‍යංග වැඩීම යනු කුසල පාක්ෂික චෛතසික ඒ ඒ අවස්ථානුකූලව සිත්හි බලවත්ව පැවැත්වීමට පුහුණු කිරීමයි.

**සැලකිය යුතුයි**

බොජ්ඣංග ධර්ම මෙනෙහි කිරීම තුලින් රෝග සුව වීමේ (මානසික මෙන්ම කායික) විශේෂ ශක්තියක් ඇත. එය මනාව පැහැදිලි වන්නේ රෝගී වූ බුදුරජාණන් වහන්සේ මෙන්ම මහා කාශ්‍යප මහරහතන් වහන්සේ, මුගලන් මහරහතන් වහන්සේලාද මෙම ධර්මය ශ්‍රවණය කිරීමෙන් නිරෝගී බවට පත්වී ඇති බැවිනි. (ඒ දෙසු බොජ්ඣංග පිරිත් ධර්ම සංයුක්ත නිකායට ඇතුලත්ව සඳහන් වේ.)

---

පුණ්‍යානුමෝදනය :- බු.ව.2552 වර් පුන් පොහෝ දින ධර්ම දානය වශයෙන් මෙම දහම් පත්‍රිකාව සකස් කොට (කඩවත ගුණානන්ද හිමි) වන අප විසින් මුද්‍රණය කර පරිත්‍යාග කරන ලදී.
මෙම පිංකම සිව් සැමටම 'නිර්වාණය අවබෝධය පිණිස හේතු වේවා' යි ප්‍රාර්ථනා කරමි.

උපකාරක පොත් :-බෝධි පාක්ෂිකධර්ම විස්තරය,බුද්ධ චරිතය
(රේරුකානේ චන්දවිමල හිමි, බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය හිමි රචිත)

තෙරුවන් සරණයි !

3 කාල සම්පත්ති (කාලයේ ශාසනේ වීම)

ප්‍රයෝග සම්පත්ති (කුසල් කිරීමට උත්සාහය) 4

මෛත්‍රී මුදිතා

සතර බ්‍රහ්ම විහරණ

**ද ස පු ණ්‍ය ක්‍රි යා ව ස් තු**

| | පුණ්‍ය ක්‍රියාව | අර්ථය | කෙටි විස්තරය |
|---|---|---|---|
| 1 | දානය | තමන් සතු වස්තුව අන් සත්ව, පුද්ගලයින්ගේ යහපත උදෙසා දීම. | 1.ආමිස දානය 2.අභය දානය 3.ධර්ම දානය වශයෙන් දානය ත්‍රිවිධ වේ. වස්තූන් දන් දීමෙන් ඒ කෙරෙහි ඇති ලෝභය දුරු වේ. ප්‍රාර්ථනාවෙන් තොර අනුත්තර විපාක ලැබේ.නිර්වාණ ප්‍රාර්ථනය උතුම් වේ. |
| 2 | සීලය | කය-වචනයෙන් තමන්ටත්, අන් සත්වයන්ටත් පීඩාවක් නොවන පරිදි සංවර වීම. | 1.පඤ්ච සීලය 2.අෂ්ටාංග සීලය 3.නවාංග සීලය 4. දස සීලය 5.සාමණේර දස සීලය 6.උපසම්පදා සීලය ආරක්ෂා කරගැනීම |
| 3 | භාවනාව | සමාධිය හෝ ප්‍රඥාව දියුණු වන සුදුසු අරමුණක සිත මනා කොට හැසිරවීම. | 1.සමථ භාවනා (දස කසිණ ආදී) විසිරුණු සිත සමාධි ගත කිරීම. 2.විදර්ශනා භාවනා (ත්‍රිලක්ෂණාදී) ප්‍රඥාව දියුණු කිරීමට භාවනා කිරීම. |
| 4 | අපචායන | පිදිය යුතු උතුමන් පිදීම. | පිදිය යුතු උතුමන් ඇති තැන නැති තැන 1.කයෙන් වන්දනා කිරීම 2.ස්තුති කිරීම (ස්තුති ගාථා කීම) 3.ගුණ මෙනෙහි කිරීම පිංකමකි. |
| 5 | වෙය්‍යාවච්ච | පිදිය යුතු උතුමන්ට හා පූජනීය වස්තූන්ට වත් පිළිවෙත් කිරීම. | තුනුරුවනට,මව්පිය,ගුරු උතුමන්ට හා චෛත්‍ය,බෝමළු,විහාර මන්දිර,පූජනීය භූමීන් පිළිවෙත් සිදු කිරීම පිංකමකි. |
| 6 | ප්‍රාප්තිදානය | තමන් විසින් කරගත් පිංකම්, පිං බලාපොරොත්තුව සිටින අයගේ යහපත පිණිස අනුමෝදන් කිරීම. | දෙවියන්ට, මළගිය ඥාතීන්ට,සියළු සත්වයන්ට හා ජීවත්ව සිටින අයට වුවද අප මෙවැනි පිංකමක් කළා ඔබත් ඒ ගැන සතුටු වන්නයි කියා අනුමෝදන් කිරීම පිංකමකි. |
| 7 | පත්තානුමෝදනය | තවත් අයකු කරන පිංකම් දැක අසා සිත සතුටු කර ගැනීම. | යමෙකු කළ පිංකමක් ගැන අසා දැක ඒ ගැන සිත පහදා ගැනීම. |
| 8 | ධර්ම ශ්‍රවණය | ලෝකයේ සත්‍යාවබෝධය පිණිස දහම් ඇසීම | සිත, කය, වචනයෙන් කළ යුත්ත නොකළ යුත්ත දැන වැරදි මග හරවා ගනිමින් නිර්වාණ මාර්ගයේ ගමන් කිරීම පිණිස දහම් ශ්‍රවණය මහා පිං කමකි. |
| 9 | ධර්ම දේශනය | ලාභ,කීර්ති,ප්‍රසංසා ආදී බලාපොරොත්තු රහිතව කරුණා-මෛත්‍රී සිතින් දහම් දෙසීම හෝ දේශනා කරවීම. | ධර්ම දේශනා කිරීම,කරවීම, දහම් පොත් පත් ආදී මුද්‍රණය කරවීම ධර්ම දේශනා පිං කමකි. |
| 10 | දිට්ඨිජුකම්මය | බුදු රජාණන් වහන්සේගේ ධර්මය පිළිබඳ නිවැරදි වැටහීමක් ඇති කර ගැනීම. (සම්මා දෘෂ්ටිය) | කර්මය, කර්ම ඵලය, පටිච්ච සමුප්පාදය චතුරාර්ය සත්‍යය, සත්තිස්බෝධිපාක්ෂික ධර්ම ආදියෙහි සැක හැරදැන ගැනීම පිං කමකි. |

සැලකිය යුතු කරුණු :- * පුණ්‍ය කර්ම මනා අවබෝධයෙන් කිරීමෙන් (මෝහය දුරුවීමෙන්) බලවත් වේ.

* දාන පිංකම් (ආමිස) ප්‍රබල වීමට නම්, වස්තුව ධාර්මිකව උපයාගෙන තිබීම, ප්‍රතිග්‍රාහක පක්ෂය සිල්වත් වීම, තමන්ගේ සිල්වත් භාවය, පූජා කිරීමට පෙර, පූජා කරන අවස්ථාව, පූජා කිරීමෙන් පසු ඇතිවන සතුට හා කර්මය කර්ම ඵල විශ්වාසය යන අංගයන් සම්පූර්ණ විය යුතුය.
* පුණ්‍ය කර්ම විපාක ප්‍රාර්ථනාවෙන් තොරව සසර ගමන සැප ලැබීම (වට්ටගාමී) න් පිංකම් නිවන් ප්‍රාර්ථනා කරගනිමින් කිරීමෙන් සැප විපාක ලබමින් නිර්වාණ අවබෝධයට හේතුවන (විවට්ටගාමී) කුසල කර්ම වේ.

දස පුණ්‍යකර්මයෝම කරගත හැකි පිංකම් :- * පිරිත් පිංකම්, සාංඝික දාන පිංකම්, ගිලන්පස බෝධිපූජා පිංකම්, (විමසා බලනු)

සිතක ආයුෂ :- * කුඩා ක්ෂණ තුනකි.(චිත්තක්ෂණයකි) උත්පාද,ස්ථිති,භංග,ලෙසය.

වර්තමාන කාලය

උපදින කාලය ← ↑ → විනාශ වන කාලය

| ..................... 1 | 2 3 4 5 6 | 7 ..................... |
|---|---|---|
| දිට්ඨ ධම්ම වේදනීය | අපරාපරියවේදනීය | උපපජ්ජවේදනීය |

කරුණා උපේක්ෂා

1 ඒකාන්ත දුක්ඛය - නරකය

ඒකාන්ත සුඛය - දෙව්ලොව 2

**සිව්පස ප්‍රත්‍යවේක්ෂාව**

| | සිව්පසය | ප්‍රතිකූල ප්‍රත්‍යවේක්ෂාව |
|---|---|---|
| ① | චීවර (වස්ත්‍ර) | "මහා සිදුරු නවයකින් හා බොහෝ කුඩා සිදුරු විලින්(ශරීරයේ රෝමකූප 99000 ක් පමණ වන අතර සෑම රෝම කූපයකින්ම ශරීරය තුළට සිදුරු ඇති බව දන්නේවේ.) මළ මූත්‍ර, කෙළ, සෙම් සොටු වැනිදිය උතුරන වැගිරෙන මේ ශරීරයට පැමිණීමෙන් පවිත්‍ර වූ මේ චීවරය (වස්ත්‍රය) අපවිත්‍ර වී පිළිකුල් බවට පැමිණෙන්නේය." |
| ② | පිණ්ඩපාත (ආහාර) | "දැකුම්කලු වූ ද, පවිත්‍ර වූ ද, මේ ආහාරය ආමාශයට පැමිණි කල්හි කෙළ, සෙම් හා මිශ්‍ර වී බලු වමනයක ස්වභාවයට පැමිණෙන්නේය. තව දුරටත් පසුබුණු කල්හි අසූචි භාවයටට පැමිණ පරම ප්‍රතිකූල ස්වභාවයට පැමිණෙන්නේය." |
| ③ | සේනාසන (නිවාස) | "සිතර ලේ සැරව,දියර වැගිරෙන කුෂ්ඨ රෝගියෙකු විසූ ගෙය අපවිත්‍ර වී පිළිකුල් බවට පැමිණෙන්නාක් මෙන් සෙම්, සොටු, දහඩිය ආදී අපවිත්‍ර දෑ උතුරන වැගිරෙන මේ ශරීරයෙන් පරිභෝග කිරීමෙන් පවිත්‍ර වූ මේ සෙනසුන අපවිත්‍ර වී පිළිකුල් බවට පත් වන්නේය." ( වහලුන් යටට පිවිසෙන වාරයක් වාරයක් පාසා සිහි කිරීම සුදුසුය.) |
| ④ | ගිලානපච්චය (බෙහෙත්) | "පැසවූ වණයකට දැමූ බෙහෙත ලේ සැරව සැරව් වශයෙන්ම පිළිකුල් බවට පත් වන්නාක් මෙන් මේ ශරීරයට ඇතුළු කරන මේ බෙහෙත ද කෙළ, සෙම් ආදිය හා මිශ්‍ර වීමෙන් වහා පිළිකුල් බවට පැමිණෙන්නේය." (බොහෝ පැන් කරේ අන් සියළු පාන වර්ග වලත් ප්‍රත්‍යවේක්ෂා කළ යුතුය.) |

** සිව්පස පාරිභෝජනය කරන මොහොතේම ප්‍රයෝජනය සලකා ප්‍රත්‍යවේක්ෂා කිරීම හෝ ප්‍රතිකූල වශයෙන් ප්‍රත්‍යවේක්ෂා කළ හැකිය. ධාතු වශයෙන් ප්‍රත්‍යවේක්ෂාව ගැඹුරු අර්ථයෙන් යුක්ත බැවින් ප්‍රතිකූල වශයෙන් ප්‍රත්‍යවේක්ෂාව සරල වැටහෙන අර්ථයෙන් යුක්තය. භික්ෂූන් උදෙසා වදාළ මෙම ප්‍රත්‍යවේක්ෂාව සිල් සමාදන්ව ගුණ ධර්ම වඩන සැදැහැවතුන්ටද එදිනෙන්ම පුහුණු වීම තුළින් සසර ඇලීම දුරු කර ගැනීමට මහත් උපකාරයක් වන්නේය.*

**භික්ෂුවකගේ සතරවිධ පරිභෝග** — සැදැහැවතුන් පූජා කරන සිව්පසයට රහතන්වහන්සේ ස්වාමි වෙමින්ද, අන් මාර්ග ඵල ලාභී භික්ෂූන් දායාද වශයෙන් ද හිමිකම් ලබයි. සීලවන්ත භික්ෂූන් ප්‍රත්‍යවේක්ෂාවෙන් සිව්පස පරිභෝග කිරීමෙන් ණයකාර බවින් මිදෙන්නේය. එසේ නොකොට පරිභෝග කිරීමෙන් සොරකු ලෙස සිව්පස පරිභෝග කිරීමක් බව තථාගතයන් වහන්සේ වදාළ සේක. (දිනයක් දිනයක් පාසා අරුණෝදයට පෙර ප්‍රත්‍යවේක්ෂාව කිරීමෙන් ඉණ,ථෙය්‍ය පරිභෝගයට හසුවීමෙන් මිදිය හැක.)

**උතුරු සළුව භාවිතා කිරීමේ ආනිසංස** — උපාසක, උපාසිකාවන් ගුණ ධර්ම වඩන දිනයන්හි දී (පොහොය දින ආදී) භාවිතා කරන උතුරු සළුව තුළින් ලැබෙන ආනිසංස මෙසේ දැක්විය හැකිය. 1. කයේ සංවරය ඇති කිරීමට හේතු වේ. 2.සිල්වත් පිහිටා සිටින බව යළි යළිත් සිහි ගන්වයි. 3.ඉවසීමේ ගුණය දියුණුවට හේතු වේ. 4.උතුරුසළුව ගැලවෙන විට චීවර(වස්ත්‍ර) ප්‍රත්‍යවේක්ෂා නුවණින් හැඳින පැළඳින පොරවන වාරයක් පාසා විදසුන් නුවණ පහළ වේ. 5.මෙම භවයේ හෝ අන් භවයක චීවරයක් දරා සිටීමේ පුහුණුවක් ඇති කරයි. (මේ අනුව සාටු ආදී භාවිතා කොට උතුරු සළු භාවිතා කිරීම කුඩා දරුවන්ට හැර වැඩිහිටියන්ට සුදුසු නොවේ.)

**පුත්‍ර මාංශ උපමාවට අනුව ආහාර ගැනීම** — කාන්තාරයක් හරහා ගමන් කරන මව්පිය දෙපළට ආහාර අවසන්වීමෙන් තමන් කැටිව ගොස් මළ කුඩා පුතණුවන්ගේ මාංශය අනුභවය කිරීමට සිදු වූවහොත් ඒ පිළිබඳව උපදින අප්‍රිය සංඥා නවාකාරයකි. එනම්

1. තමන්ගේ ජාතියේ කෙනෙකුගේ මස් නිසා ද අප්‍රිය ය.
2. ඥාතියෙකුගේ මස් නිසා ද අප්‍රිය ය.
3. පුතාගේ මස් නිසා ද අප්‍රිය ය.
4. ප්‍රිය පුතාගේ මස් නිසා ද අප්‍රිය ය.
5. ළදරු මස් නිසා ද අප්‍රිය ය.
6. අමු මස් නිසා ද අප්‍රිය ය.
7. නොකන මස් නිසා ද අප්‍රිය ය.
8. ලුණු නැති නිසා ද අප්‍රිය ය.
9. දුරු මිරිස් නැති නිසා ද අප්‍රිය ය. මේ අනුව සියළු ආහාර ප්‍රත්‍යවේක්ෂා නුවණින් පරිභෝජනය කරන්නේනම් ආහාරය පිළිබඳ රස තෘෂ්ණාව දුරු කර ගත හැක. (විශේෂ දිනයන්හි පුහුණු කිරීමෙන් සංසිඳීම පිහිට පිණිස පවතී.)

**ත්‍රිකෝටික පාරිශුද්ධ මාංශය** — 1. නො දැකීම. 2. නො ඇසීම. 3. සැක පහළ නොවීම. යන කරුණු තුනෙන් පිරිසිදු වූ මාංශය භික්ෂූන්ට කැප බව තථාගතයන් වහන්සේ වදාළහ. මුල් කරුණු දෙකෙන් තොරව ලැබූ මාංශයක් ගැන සැකයක් ඇති වූයේ නම් දායකයාගෙන් තා වෙනුවෙන් මරා මාංශයක් ද යන බව විමසා භික්ෂූන් උදෙසා නොවේ යැයි ප්‍රකාශ කළේ නම් එය කැප මාංශයක් බව දැක්වේ. (මත්ස්‍ය මාංශය හෙවත් මාළු මෙයට අයත් වේ)

**අකප්පිය දස මාංශය** — 1. මිනී මස් 2. ඇත් මස් 3. අස් මස් 4. බලු මස් 5. සර්ප මස් 6. සිංහ මස් 7. ව්‍යාඝ්‍ර මස් 8. දිවි මස් 9. වලස් මස් 10. තරස් මස්(කළු කින් වලස් මස්) යන මාංශයන් ප්‍රතික්ෂේපිත මාංශ වේ.මෙම මාංශ දැන හෝ නොදැන වැළඳුවහොත් ඇවැත් සිදුවන බව දැක්වේ.මාංශ වැළඳීමට පෙර විමසා පිළිගත යුතු බවද සඳහන් වේ.

**විශේෂ කරුණු**

* භික්ෂූන් වහන්සේලා පොරවන චීවරය මෙන් එක් දිගට හැඳින පැළඳින පොරවන සරල වස්ත්‍රයක් හෝ ඇඳුමක් ලොව තවත් නැත්තේය.
* යමෙකු මාංශ අනුභවයෙන් වැළකී මාංශය අනුභව කිරීමේ ආශාව අත් හරිද එයද, එය නෛෂ්ක්‍රම්‍යයකි.
* බෞද්ධයන් පමණක් නොව ලෝක වාසීන් 'සම්මා ආජීවය' තුළ පිහිටයිද? එදාට මාංශ ආහාර නැති වන්නේය.
* අධ්‍යාත්මික ජීවිතයකට ඇතුළුවීමේ ප්‍රධාන දොරටුව බුදුන් වහන්සේ වදාළ පංච ශීල ප්‍රතිපදාවම බව විශේෂයෙන් මතක තබා ගත යුතු විශේෂ කරුණකි.

පුණ්‍යානුමෝදනය :- බු.ව. 2553 නවම් පුන් පොහෝ දින ධර්ම දානය ලෙස මෙම දහම් පත්‍රිකාව (නාඋයන ගුණානන්ද හිමි) වන අප විසින් සකස් කොට ඉංගිරියේ පදිංචි පී. පී. පියසීලි මහත්මියගේ ධන පරිත්‍යාගයෙන් මුද්‍රණය කොට බෙදා දෙන ලදී. මෙම ධර්ම දානය එතුමියගේ සහෝදරිය වන පරලොසැපත් පී.පී. චන්ද්‍රලතා මහත්මිය,ඇතුළු සිම සැමට නිවන් අවබෝධය පිණිස හේතු වේවායි ප්‍රාර්ථනා කරමි.

උපකාරක පොත් :- ශාසනාවතරණය, උපසම්පදා ශීලය, (රේරුකානේ චන්දවිමල නාහිමි රචිත)
බුද්ධ චරිතය (බලංගොඩ ආනන්ද මෛත්‍රී නාහිමි රචිත)
පූජාවලිය, මහා වංශය, ධම්මපදය, බෞද්ධ ශබ්දකෝෂය

තෙරුවන් සරණයි !

3 දුක බහුල - ප්‍රේතය

සුඛ බහුල - මනුලොව 4

1 බුදුන් උපන් තැන

බුද්ධ වූ තැන 2

" ඉතිපි සෝ භගවා අරහං, සම්මා සම්බුද්ධෝ, විජ්ජාචරණ සම්පන්නෝ, සුගතෝ, ලෝකවිදූ, අනුත්තරෝ පුරිසදම්ම සාරථි, සත්ථා දේව මනුස්සානං, බුද්ධෝ, භගවා, ති ".

නව අරහාදී බුදු ගුණ

| | බුදුගුණ | බුදුගුණ ගැන කෙටි විස්තරය |
|---|---|---|
| ① | අරහං | තුන් ලෝ වාසීන්ගේ, දෙවි,මිනිස්,බ්‍රහ්මයන්ගේ ආමිස පූජා - ප්‍රතිපත්ති පූජාසහ-චතුර සංවරය හෙවත් සීලයක පිහිටීම පිළිගැනීමට සුදුසු වූ බැවින් අරහං වන සේක. |
| ② | සම්මා සම්බුද්ධෝ | ලෞකික සැප,දෙව්,මිනිස්,බ්‍රහ්ම සැප හා ලෝකෝත්තර සැප, නිවන් සැප ලබන අයුරු කිසිවකුගේ උපකාරයක් නොමැතිව අවබෝධ කොට දෙසූ බැවින් සම්මා සම්බුද්ධ වන සේක. |
| ③ | විජ්ජාචරණ සම්පන්නෝ | අෂ්ට විද්‍යා -පසළොස් චරණ ධර්මයන්ගෙන් තුන් ලොවට අග්‍රප්‍රාප්ත වූ බැවින් විජ්ජාචරණ සම්පන්න වන සේක. |
| ④ | සුගතෝ | යහපත් මාර්ගයෙන් මධ්‍යම ප්‍රතිපදාවෙන් පරම සුන්දර නිර්වාණ ධර්මය අවබෝධ කර ගත් බැවින් සුගත නම් වන සේක. |
| ⑤ | ලෝකවිදූ | ලෝකසත්‍යම පිළිබඳව එහි ආරම්භය, පවතින කාලය, විනාශය, විනාශ වන අයුරු, එහි සැප ආදී සියළුම දේ පිළිබඳ මනා සේ වදාළ බැවින් ලෝකවිදූ නම් වන සේක. |
| ⑥ | අනුත්තරෝ පුරිසදම්ම සාරථි | ලෝකතුයේම කිසිවෙකු කාය හා සෑදිටි බලයෙන් මත්වූ දමනය කළ නොහැකි පුද්ගලයින් දමනය කිරීමට හැකිවූ බැවින් අනුත්තරෝ පුරිස දම්මසාරථි නම් වන සේක. |
| ⑦ | සත්ථාදෙව මනුස්සානං | බ්‍රහ්මයන් ඇතුළු සියළු දෙවි, මිනිසුන්ට ශාස්තෘ වහන්සේ වන බැවින් සත්ථා දේව මනුස්සානං වන සේක. |
| ⑧ | බුද්ධෝ | දුක, දුකට හේතුව,දුක නැති කිරීමෙන් ලබන සැපය නිවන, හා එයට මාර්ගය තමන් වහන්සේ අවබෝධ කොට අන් අයට දෙසූ බැවින් බුද්ධෝ නම් වන සේක. |
| ⑨ | භගවා | දෙවි, මිනිසුන්, බ්‍රහ්මයන් ලෝක හිත බුදුන් කමාගෙන කරන සියළු වන්දනාවන් පිළිගැනීමට තුන් ලොවට අග්‍ර වූ බැවින් භගවා නම්වන සේක. |
| | " ඉමේහි නවහි ගුණෙහි සමන් නාගතං,සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. සම්මා සම්බුද්ධං සිරසා නමාමි." | |

අෂ්ට විද්‍යා :-
1. විදර්ශනා ඥානය - හේතුඵල දක්නා නුවණ හෙවත් සංස්කාරයන්ගේ යථාර්ථය දැකීම
2. මනෝමය ඥානය - තම රූපය මෙන් රූපයන් මවා දැක්වීමට හැකි නුවණ
3. සෘද්ධි විධ ඥානය - නොයෙක් ප්‍රාතිහාර්ය කිරීමට සමත් නුවණ
4. දිව්‍ය ශ්‍රෝත ඥානය- ඈත සත්වයන්ගේ පවා ශබ්ද ඇසීමට ඇති හැකියාව(දෙවි,බ්‍රහ්ම ආදී)
5. පරචිත්ත විජානන ඥානය - අන් අයගේ සිත් දැන ගැනීමේ නුවණ
6. පූර්වේනිවාසානුස්සති ඥානය- තමන් හා අන් අයගේ පෙර භවය දක්නා නුවණ
7. දිව්‍ය චක්ෂු ඥානය - ඒ ඒ සුගති,දුගති භව වලින් චුතවන උපදින සත්වයින් දක්නා නුවණ
8. ආසවක්ෂය ඥානය - කෙලෙස් නසන්නට සමත් නුවණ (අර්හත් මාර්ග ඥානය)

පසළොස් චරණ ධර්ම :-
1. ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය (බුදුන් වහන්සේ පැනවූ විනයට අනුව හැසිරීම)
2. ඉන්ද්‍රිය සංවර ශීලය (ඉන්ද්‍රියන්ගේ අරමුණු මගින් කෙලෙස් නොවැඩීම)
3. ආහාරයේ පමණ දැනීම (ශරීරයට අවශ්‍ය ප්‍රමාණ ආහාර ගැනීම)
4. ජාගරියානුයෝගය / නිදිවර්ජිත වීම (භාවනා කිරීමට සඳහා පමණක් නිදීම)
5. ශ්‍රද්ධාව
6. පාපයට ලජ්ජා වීම (පව් කිරීමට පසුබෑම ලජ්ජා)
7. පාපයට බිය වීම (පාපයේ විපාකයට ඇති බිය)
8. බහුශ්‍රැත වීම (බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව)
9. උට්ඨාන වීර්යය (කයින්, මනසින් කරන උත්සාහය)
10. මනා සිහිය
11. තීක්ෂණ ප්‍රඥාව
12. ප්‍රථම ධ්‍යානය
13. ද්විතීය ධ්‍යානය
14. තෘතීය ධ්‍යානය
15. චතුර්ථ ධ්‍යානය

බුදුන් වහන්සේගේ බුද්ධ ක්ෂේත්‍ර :-
1. ජාති ක්ෂේත්‍රය - සක්වල දසදහසයි. (බුදුන් වහන්සේගේ ජීවිතයේ විශේෂ අවස්ථා වලදී කම්පා වන ක්ෂේත්‍රය)
2. ආඥා ක්ෂේත්‍රය - සක්වල කෝටි ලක්ෂයයි. (බුදුන් වහන්සේ වදාළ පිරිත් සූත්‍ර ආදියෙහි ආඥා පවතින ක්ෂේත්‍රය)
3. විෂය ක්ෂේත්‍රය - සක්වල කෝටි ලක්ෂයෙන් ඔබ්බට සැමති ප්‍රාතිහාර්යයන් කළ හැකි ක්ෂේත්‍රය)

(එක බුදු සක්වළක් ආලෝක වන සතර අපාය, මනුෂ්‍ය ලෝකය, දිව්‍ය ලෝක 06, බ්‍රහ්ම ලෝක 16 - 04 යන ලෝක 31 එක් සක්වළකි.

බෝධිසත්වයන් ඉපිද මොහොතකට පසු පැවසූ අභීත සිංහ නාදය:

" අග්ගෝහමස්මි ලෝකස්ස, ජෙට්ඨෝහමස්මි ලෝකස්ස, සෙට්ඨෝහමස්මි ලෝකස්ස, අයමන්තිමා ජාති නත්ථි දානි පුනබ්භවෝ "

බුදු වීමෙන් මොහොතකට පසු පහළ වූ සිතිවිල්ල:

අනේක ජාති සංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං, ගහකාරකං ගවේසන්තෝ දුක්ඛා ජාති පුනප්පුනං. ගහකාරක දිට්ඨෝසි පුන ගේහං න කාහසි, සබ්බා තේ ඵාසුකා භග්ගා ගහකූටං විසංඛිතං, විසංඛාරගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා.

පිරිනිවීමට මොහොතකට පෙර දෙසූ අවවාදය:

" හන්දදානි භික්ඛවේ, ආමන්තයාමි වෝ, වයධම්මා සංඛාරා, අප්පමාදේන සම්පාදේථ "

වැදගත් කරුණු :-
* බුදු ගුණ යම් පමණකට හෝ දැන කරන පූජාවත් මහත් ආනිසංස ලබා කර ගැනීමට හේතු වේ.
* බුදු ගුණ ලියා හෝ සිතා අවසන් නොකළ හැකි තරම්ය.
* විද්‍යුත් නුවණ දියුණු නොකර සිටින්නෙකු, බුදුන් දුටුවත් නිවන් දැකිය නොහැක.
* බුදුගුණ සිහි කිරීම භාවනා ආරම්භයටත් සද්ධාව රැක ගැනීමටත් විශේෂ වූ වැදගත් තරමකි.

පුණ්‍යානුමෝදනය :- බු.ව.2551 දුරුතු පුන් පොහෝ දින ධර්ම දානය වශයෙන් මෙම දහම් පත්‍රිකාව සකස් කොට (කඩවත ගුණානන්ද හිමි) වන අප විසින් පරිත්‍යාග කරන ලදී. මෙම පින්කම සැම සැමට නිවන් සැප පිණිස හේතු වේවායි ! අනුමෝදනය කරමි.

උපකාරක පොත් :- සූවිසි මහා ගුණ, බෞද්ධයාගේ අත්පොත,ධර්ම විනිශ්චය හා බුද්ධ වංශය, පූජාවලිය, මිලින්ද ප්‍රශ්නය, බෞද්ධ ශබ්ද කෝෂය, දළදා ඉතිහාසය හා සංස්කෘතිය

තෙරුවන් සරණයි !

3 දම්සක් පැවැත්වූ තැන

පිරිනිවන් පෑ තැන 4

(1) ආධි කෙලෙස් ඇතිව ඒ බව තත්වූ පරිදි නොදත් පුද්ගලයා (හීන පුද්ගලයා)

(2) ආධි කෙලෙස් ඇතිව ඒ බව තත්වූ පරිදි දත් පුද්ගලයා (ශ්‍රේෂ්ඨ පුද්ගලයා)

**අෂ්ටාකාර විචිකිච්ඡාව**

| | විචිකිච්ඡාව | කෙටි විස්තරය |
|---|---|---|
| ① | සත්ථරි කංඛති (ශාස්තෘන් ගැන සැකය) | දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණ හා රශ්මි මාලාවන් ඇති, සියල්ල දන්නා නුවණ ඇති පුද්ගලයෙකු සිටිය හැකිදැයි ? ශාස්තෘන් වහන්සේ ගැන සැක ඇති වීම. |
| ② | ධම්මේ කංඛති (ධර්මය ගැන සැකය) | කෙලෙස් ප්‍රහාණයට ආර්ය මාර්ග සතරක් හා කෙලෙස් සංසිඳ වූ ඵල ධර්ම සතරක්ද සියළු දුක් නිවන නිර්වාණයක් ඇතද? නැතද? නව ලෝකෝත්තර ධර්මය ගැන සැක ඇති වීම. |
| ③ | සංඝෙ කංඛති (සංඝරත්නය ගැන සැකය) | සතර මාර්ග ඵලයන්හි ආර්ය සංඝරත්නය ඇත්තේද ? සංඝයා සුපුටිපන්නද ? නැතද? සංඝරත්නයට දන් දීමේ විපාකයක් ඇතිද? නැතිද? කියා සංඝයා කෙරෙහි සැක ඇති වීම. |
| ④ | සික්ඛාය කංඛති (ශික්ෂාවන් ගැන සැකය) | සිඳෙරින් සංවර වීම කියා ත්‍රි ශික්ෂාවක් සත්‍යම වශයෙන් ඇත්තේද? ඒ ශික්ෂාවන් රැකීමෙන් ප්‍රතිඵලයක් ඇත්තේද? නැත්තේද? කියා ශික්ෂාවන් කෙරෙහි සැක ඇති වීම. |
| ⑤ | පුබ්බන්තේ කංඛති (පෙර භවයන් ගැන සැකය) | අතීත නොයෙක් භවයන් ලබමින් භව පරම්පරාවක් පැවති ගෙන ආවේද? නැද්ද? කියා අතීත ස්කන්ධයන් කෙරෙහි සැකය ඇති වීම. |
| ⑥ | අපරන්තේ කංඛති (අනාගත භව ගැන සැකය) | මරණින් මතු භව පරම්පරාවක් ඇත්තේද? නැත්තේද? කියා අනාගත භව ගැන හෙවත් ස්කන්ධ පරම්පරාව පැවැත්ම ගැන සැක ඇතිවීම. |
| ⑦ | පුබ්බා පරන්තේ කංඛති (අතීතානාගත භව ගැන සැකය) | අතීත භවයන් හා අනාගත භවයන් යන දෙක කෙරෙහි ස්කන්ධ පරම්පරාවක් පවත්නාගෙන යන්නේද? කියා භවයන් දෙක කෙරෙහිම සැක ඇතිවීම. |
| ⑧ | ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නේසු ධම්මේසු කංඛති (හේතු-ඵල ගැන සැකය) | මෙම සියළු සත්වයින්ගේ පැවැත්ම හේතු-ඵල පරම්පරාවක්ද? නැතිනම් ඉබේ ඇති වූවක්ද? නැතිනම් කෙනෙකු විසින් මවන ලද්දක්ද? කියා පටිච්චසමුප්පාද ධර්මය ගැන සැක ඇතිවීම. අතීත හේතු පස ⟶ වර්තමාන ඵල පස ⟶ වර්තමාන හේතු පස (තණ්හා, උපාදාන, භව, අවිජ්ජා, සංඛාර) ⟶ අනාගත ඵල පස යනාදී සැක ඇතිවීම. |

** විචිකිච්ඡාව හෙවත් සැකය යනු දෙනාටම ඇතිවන ධර්ම ස්වභාවයකි. මෙහි දක්වන විචිකිච්ඡාව නිවන් මාර්ගයට බාධක වන (නීවරණ ) ප්‍රධාන සැකයෝය. බුද්ධාදී අට තැන්හි සැකය ලෙස දක්වන්නේද ඉහත කරුණුමය. අභිධර්ම දේශනාවට අනුව මෙම අටාකාර විචිකිච්ඡාව දක්වා ඇත. මෙම සැකයන් දුරුවීම පළමු මාර්ග ඵලයට පත්වීම තුලින් (ලෝකෝත්තර සම්මා දිට්ඨියට පත්වීම) සිදුවනු ලබයි. යමෙකුට ධර්මය දැන ඉගෙනීම තුලින් අත්ථ, පාරත්ත්‍ර ඕඝවලින් මිදී කල්‍යාණ පාරත්ත්‍ර ආර්යට පත්ව ඉන්මතින් සැට්ක් මිදීමට හැකිවේ.*

බුදුන් වහන්සේ විදාළ හොසිනිය යුතු කෙලෙස් වඩන සොළොස් කරුණු

| * අතීත භවය ගැන | * අනාගත භවය ගැන | * වර්තමාන භවය ගැන |
|---|---|---|
| 1. මම අතීතයේ වූයෙම්ද? | 1. මම මරණින් මතු ඇත්තෙම්ද? | 1. මෙම පඤ්චස්කන්ධය මම වන්නෙම්ද? |
| 2. නොවූයෙම්ද? | 2. නැත්තෙම්ද? | 2. මම නොවෙම්ද? |
| 3. කවරෙකු වූයෙම්ද? | 3. කවරෙකු වන්නෙම්ද? | 3. මම කවරෙක්ද? |
| 4. කෙසේ වූයෙම්ද? | 4. කෙසේ වන්නෙම්ද? | 4. මාගේ සැටි කෙසේ වන්නේද? |
| 5. කවරෙකුව ඉඳ කවරෙකු වූයෙම්ද? | 5. කවරෙකු වී කවරෙකු වන්නෙම්ද? | 5. මම කොහි සිට මෙම භවයට ආවේද? |
| | | 6. මම මෙයින් කොහි යන්නේද? |

කෙලෙස් පහ කළ යුතු ආකාර සත (මජ්ඣිම නිකාය සබ්බාසව සූත්‍රය බලන්න.)

1. දර්ශනයෙන් ⟶
2. සංවරයෙන් .......
3. පටි සේවනයෙන් .......
4. පරිහරණයෙන් .......
5. ඉවසීමෙන් .......
6. වර්ජනයෙන් .......
7. භාවනාවෙන් .......

* පහ කළ යුතු කෙලෙස් ධර්මයෝ නම් කාමාසව, භවාසව, සහ අවිජ්ජාසව වේ. යමක් මෙනෙහි කිරීමෙන් නූපන්, උපන් කාමාසව, භවාසව, අවිජ්ජාසව පහවෙයිද එය මෙනෙහි කළ යුතුය. ඉහත දැක්වූ සොළොස් ආකාර සැක කරුණු මෙනෙහි කිරීමෙන් ආශ්‍රවයන් වැඩීමට හේතුවන බැවින් නොසිතිය යුතුයි දක්වා ඇත. මේ දුකය, දුකට හේතුවය, දුක නැති කිරීමෙන් ලබන සැපයය. එම සැපය ලබන මාර්ගය යන සත්‍යය සතරද, පටිච්ච සමුප්පාද ධර්මය ආදී මෙනෙහි කළ යුතු කරුණු මෙනෙහි කිරීමෙන් ආශ්‍රව නූපදී. ඒ තුලින් සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස යන සංයෝජන තුනී වීම සිදුවේ. මෙය දර්ශනයෙන් පහකළ යුතු සංයෝජන කෙලෙස් ධර්මයෝය.

සැලකිය යුතුයි :- * අරමුණු කරන දෙය පිළිබඳ විනිශ්චයක් නැති බව, අවිශ්වාසය හෙවත් සැකය විචිකිච්ඡාවයි. නීවරණ වන, නොවන බව අනුව සැකය දෙයාකාරයි. නොදන්නා කරුණු ගැන එසේද? මෙසේද? කෙසේද? ආදී වශයෙන් පහළ වන සැකය අනීවරණ විචිකිච්ඡාවයි. නීවරණ විචිකිච්ඡාවට මිත්‍යාදෘෂ්ටික අදහස් ඇත්තන් ආශ්‍රය හේතු වන බැවින් නීවරණ විචිකිච්ඡාවෙන් මිදීමට වඩාත්ම උපකාරක කරුණ වන කල්‍යාණ මිත්‍ර සේවනය හේතු වන බව සැලකිය යුතුය.

* සද්ධා චරිතයාට තුනුරුවන් කෙරෙහි කිසිදු සැක ඇති බව නොපෙනේ. එය අමූලික සද්ධාව විය හැකිය. තෙරුවන් කෙරෙහි කරුණු කාරණා මනාව දැන ඇති කර ගන්නා ආකාරවති සද්ධාව ධර්ම අවබෝධයට හේතු වන සද්ධාව වේ.

විශේෂ කරුණු :- * විචිකිච්ඡාව, උද්ධච්චය, යන චෛතසික දෙකේ වෙනස නම් උද්ධච්චය අනෙකක අපේක්ෂාවක් නොමැතිව එක අරමුණක පැළීමත්, විචිකිච්ඡාව එසේද? මෙසේද? මෙය දැයි අනාරම්මණයන් අපේක්ෂා කරමින් පැළීමත්ය.

---

පුණ්‍යානුමෝදනය :- බු.ව. 2553 වස් පුන් පොහෝ දින ධර්ම දානය ලෙස මෙම දහම් පත්‍රිකාව (තඹවත ගුණානන්ද හිමි) වන අප විසින් සකස් කොට හොරණ, ශ්‍රේෂ්ලක්ෂ්මි වත්තේ පදිංචි විශ්‍රාමලත් හෙදි සොයුරිය සෝමා පෙරේරා මහත්මියගේ ධන පරිත්‍යාගයෙන් මුද්‍රණය කොට පරිත්‍යාග කරන ලදී. මෙම පිංකම් එතුමිය ඇතුළු ඔබ සියළු දෙනාටත් නිවන් අවබෝධය පිණිස හේතුවේවායි ! ප්‍රාර්ථනා කරමි.

උපකාරක පොත් :- කෙලෙස් එක්දහස් පන්සියය, අභිධර්මයේ මූලික කරුණු (රේරුකානේ නාහිමි රචිත)
බුද්ධ චරිතය (බලන්ගොඩ ආනන්ද මෛත්‍රී නාහිමි රචිත)
මහාවග්ග පාලිය (විනය පිටකය, ත්‍රිපිටක බුද්ධ ජයන්තිය)

තෙරුවන් සරණයි !

(3) ආධි කෙලෙස් රහිතව ඒ බව තත්වූ පරිදි දත් පුද්ගලයා (ශ්‍රේෂ්ඨ පුද්ගලයා)

(4) ආධි කෙලෙස් රහිතව ඒ බව තත්වූ පරිදි නොදත් පුද්ගලයා (හීන පුද්ගලයා, සැමවිට කෙලෙස් ඇති බව දත යුතු නොවීම)

1 සම සද්ධා

සම සතය 2

| | | නීවරණ ධම් | කෙටි නිවරණ විස්තරය |
|---|---|---|---|
| පංච නීවරණ ධම් | ① | කාමච්ඡන්දය | සිත-කය දෙකට සැපය ගෙන දෙන පංච ඉන්ද්‍රියන් මගින් සිත පිනවන රූප, ශබ්ද, ගන්ධ,රස, ස්පර්ශ ද ලාභ, යශස,කීර්ති, ප්‍රශංසා, සාන්ත, මාන්ත, යන මනෝ ද්වාර ඇසිවන යහපත් අරමුණු පිළිබඳ තිතෘෂ්ණ,ආදරය, ආශාව, ලෝභය, රාගය ආදිය කාමච්ඡන්දයයි. |
| | ② | ව්‍යාපාදය | රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශයන්ගෙන් ලැබෙන අයහපත් අරමුණුවලද අලාභ, අයශ, නින්දා ආදී මනෝ ද්වාර අරමුණු වල විරුද්ධ බව, අසතුට, භය, ද්වේෂය, පිළිකුල, ප්‍රතිඝෝෂ කරන බව යන මානසික ස්වභාවය ව්‍යාපාදයයි. |
| | ③ | ථීන-මිද්ධ | - ථීන යනු සිත දුබල කරන, පණ නැති කරන, හකුළුවන, ක්‍රියාවන ඉදිරියට ගෙන යන්නට නොදී එක තැන නතර කරවන්වන මානසික ස්වභාවයයි.<br>- මිද්ධ යනු සිත සමග යෙදෙන චෛතසික ධර්මයන්ගේ ඉහත සඳහන් සිතේ ඇති සියලු තත්වයන් මිද්ධයයි. |
| | ④ | උද්ධච්ච-කුක්කුච්ච | - උද්ධච්ච යනු යම් අරමුණක මනාවින් සිත නොපිහිටන ස්වභාවය හෙවත් සිතේ සැලෙන ස්වභාවයයි.<br>- කුක්කුච්චය යනු කළ පව් හා කුසල් නොකළ සිතන්නේ පසු තැවෙන මානසික ස්වභාවයයි. |
| | ⑤ | විචිකිච්ඡා | විචිකිච්ඡාව බොහෝ කරුණු නිසා ඇතිවන අකුසල චෛතසික ධර්මයකි. නිවරණයක් ලෙස ක්‍රියාත්මක වීමේදී බුදුන්වහන්සේ ගැන, ධර්මරත්නය ගැන, සංඝරත්නය ගැන සැකය ඇතිවීම හෙවත් විශ්වාසය නැතිකම (ශ්‍රද්ධාව දුබල වීම) නිසා ඇතිවන ස්වභාවය විචිකිච්ඡා නිවරණ යයි. |

නිවරණ දුරු කිරීම }
1. කාම වස්තූන්ගේ අශුභත්වය මෙනෙහි කිරීම, කාමයන්ට දැඩි ඇල්මේ විපාක සිහි කිරීම.
2. නිරන්තරයෙන් මෛත්‍රී සහගත සිතින් වාසය කිරීම,ද්වේෂයේ ආදීනව මෙනෙහි කිරීම.
3. වීර්යයේ අනුසස් මෙනෙහි කිරීම, ප්‍රමාදයේ ආදීනව මෙනෙහි කිරීම.
4. සන්තානයේ පහළවෙන අරමුණු ධර්මානුකූලව නිරණය කිරීම, අල්පේච්ඡ ජීවිතයකට හුරු වීම.
5. තෙරුවන් ගුණ මෙනෙහි කිරීම, කල්‍යාණ මිත්‍ර ඇසුර යනාදී කරුණු නිවරණ දුරු කළ හැකිය.

* තුන් ඉරියව්වෙන් පමණක් විදින කළ උත්සාහයෝ (ඇවිදීම)
* සැරියුත්, මුගලන් තෙරුන් - 30
* අනුරුද්ධ තෙරුන් - 50
* බක්කුල තෙරුන් - 80
* රාහුල,රට්ඨපාල තෙරුන් - 12
* ආනන්ද තෙරුන් - 15
* කාලපා තෙරුන් පරිනිර්වාණය තෙක්

අකුසල චෛතසික තුදුස අකුසල සිත් දොළොසේ යෙදෙන විට }

| ලෝභ, ද්වේෂ, මෝහ සිත් සමග | ලෝභ සිත් සමග | ද්වේෂ සිත් සමග | මෝහ සිත් සමග |
|---|---|---|---|
| 1. මෝහය | 5. ලෝභය | 8. දෝෂය | 12. ථීන |
| 2. අහිරිකය | 6. දිට්ඨිය | 9. ඉස්සාව | 13. මිද්ධය |
| 3. අනෝත්තප්පය | 7. මානය | 10. මච්ඡරිය | 14. විචිකිච්ඡාව |
| 4. උද්ධච්චය | | 11. කුක්කුච්චය | |

* අකුසල සිත් දොළොසේම යෙදෙන අකුසල චෛතසික සතරයි.
* මෝහය නිසාම ලෝභයත්, ද්වේෂයත් ඇතිවේ.(එක සිතේ නොයෙදේ.)
* මෝහය සෑම අකුසල සිතකම යෙදේ.
* අකුසල චෛතසික කුසල් සිතේ නොයෙදේ.-

මානය
→ සෙයස මානය → අන් අයට වඩා තමන් උසස් යැයි සිතා කටයුතු කිරීම
→ සදිස මානය → අන් අය හා තමන් සමාන යැයි සිතා කටයුතු කිරීම
→ හීන මානය → අන් අයට වඩා තමන් පහත් යැයි සිතා කටයුතු කිරීම

★ රූපයෙන්, උගත්කමින්, පොහොසත්,දුප්පත්, දුබලකමින් , හැකියාවන්ගෙන්, කුලයෙන් රැකියාවෙන්,නෑදෑ පිරිසගෙන්, සීලයෙන් ආදී කරුණු හේතුකොට විවිධ වූ මානය ඇතිවේ.

නිහතමානී බව :- තමාට සුදුසු ලෙස කායික ක්‍රියා හා වචන පිරිසිදු මානසිකත්වයෙන් පැවැත්වීම. පිදිය යුත්තන් පිදීම. ගෞරව කළ යුත්තන්ට ගෞරව කිරීම. වැඩිහිටියන්ට සැලකීම, වැඩිහිටි අවවාද පිළිගැනීම. ගුණකම් ඉටු කිරීම. අසරණයන්ට පිහිට වීම. යනාදී කටයුතු උස් පහත් නොතකා මෛත්‍රී, මුදිතා, කරුණා, උපේක්ෂාවෙන් කටයුතු කිරීම.

මමත්වය දුරුවීම උපමා කොට දැක්වීම } ගමේ වටිනා මැණිකක් යැයි වර්ණවත් විදුරු කැබැල්ලක් අහුලා තමාගෙන තමන් ළඟ වටිනා මැණිකක් ඇතැයි මහත් වූ සතුටින් කාලය ගත කරයි. කළණ මිතුරෙකු මේ බව දැන එහි ඇති ගුණෙණ ප්‍රකාශ කර වටිනා දෙයක් නොවන බව පැහැදිලි කරයි. යහළුවා කෙරෙහි ඇති විශ්වාසභාවය නිසාම ඔහුගේ ප්‍රකාශයට අනුව මැණික පරීක්ෂාකර බලා සැබැවින්ම විදුරු කැබැල්ලක් බව දැන එය වීසි කර දමන්නේය. මේ ලෙස සෝතාපන්න හෝ පංචස්කන්ධය පිළිබඳ වැටහීම ඇති කර ගන්නපසු දැඩි මමත්වය දුරු කර ගෙන නිහතමානීව කටයුතු කළ හැක. මමත්වය සම්පූර්ණයෙන් සෝවාන් මාර්ගයෙන්ද, මානය අර්හත් මාර්ගයෙන්ද දුරු වේ.

සැලකිය යුතු කරුණු }
★ නිවන් දැකීමේ ප්‍රධාන කාර්යය වන්නේ නිවරණ ධර්ම යටපත් කර සිත එකඟ කර ගැනීමයි.
★ දශපාරමිතා පිරීම තුළින් සිතේ එකඟ බව හෙවත් සමාධිය දියුණු වී ප්‍රඥාව පහළ වීමට හේතු වේ.
★ සතර ඉරියව් සිහියෙන් යුතුව පැවැත්වීම(සතර සතිපට්ඨානය) නිවරණ නසා මාර්ග ඵලයන්ට පත්වීමේ මාර්ගයයි.
★ ආත්ම ගණනක් පෙරුම් දම් පිරුවද නිවන් දකින්න ගතවන කාලය එක් චිත්තක්ෂණයයි.(එක් මාර්ග ඵලයකට පත්වන කාලයයි.)
★ නොනැගෙ උත්සාහ කළ යුත්තේ තමන් මාර්ග ඵලයකට පත්වී ඇත්දැයි සෙවීමට නොව ඇතිවන අකුසල් සිත් නැති කිරීමයි.
★ මමත්වය නැතිවීම පළමු මාර්ග ඵලයෙන් සිදුවේ. එමැඩින් අර්ය පුද්ගලයා තමා විශේෂ පුද්ගලයෙක් බව හුවා නොදක්වයි.
★ මානය නිසා පුණ්‍යයන් විද සෙයස මානය නිසා පවුරන් විද උපදින බව දැක්වේ.

---

පුණ්‍යානුමෝදනය :- බු.ව.2552 වෙසක් පුන් පොහෝ දින ධර්ම දානය වශයෙන් මෙම දහම් පත්‍රිකාව සකස් කොට (කඩවත ගුණානන්ද හිමි) එක අප විසින් වැලිගම්පිටියේ පදිංචි සත් ගුණවත් කාරියප්පෙරුම මහතාගේ ධන පරිත්‍යාගයෙන් මුද්‍රණය කරවා පරිත්‍යාග ලදි. මෙම ධර්ම දානමය පිංකම් එතුමා ඇතුළු සියලු සැමටම 'නිවන් සැප පිණිස හේතු වේවා' යි ප්‍රාර්ථනා කරමි.

උපකාරක පොත් :- විදර්ශනා භාවනා ක්‍රමය, චත්තාලීසාකාර මහා විපස්සනා භාවනාව, නිර්වාණ විනිශ්චය(රේරුකානේ චන්දවිමල හිමි රචිත)

තෙරුවන් සරණයි !

3 සම සීල

සම ප්‍රඥා 4

1 අලස වූ කාම භෝගී ගිහියා

සත්සිඳුවන් හෙළා වූ පැවිද්දා 2

**දස වැදෑරුම් දුක්ඛයෝ**

| | දුක්ඛයෝ | කෙටි විස්තරය |
|---|---|---|
| ① | දරුණු වේදනා (ඵරුසං වේදනං) | අත් - පා කැඩීම්, කැඩීම් වශයෙන් සිරුරෙහි හට ගන්නා තදබල දුක්ඛ වේදනාද, හත් -හාත්, ශිර්ෂ රෝග ආදියෙන් උපන් කායික තදබල දුක්ඛ වේදනා හට ගැනීම. |
| ② | ධන හානිය (ජානිං) | අඩි-වියදම් නොකළ සේවා කම් කිරීමෙන්ද, වෙළදාම්, සී සෑම් ආදී රැකියාවන්හි යෙදී උපයා-සපයා ගත් ධාර්මික ධන සම්පත් විනාශ වී යාම. |
| ③ | සිරුර බිඳීම (සරීරස්ස භේදනං) | හිස පැලීම්, අත්-පා සිඳීම්, වෙඩි වැදීම්, ආදී මෙවැනි දේ මගින් සිරුරේ වන හැකිලීය. උස් තැන්වලින් ඇද වැටීම්, විශ අහසුරු වලුව හානිය වීමෙන් සිරුරේ බිඳීම මෙහි ලා ගැනේ. |
| ④ | දරුණු රෝග (ගරුකං ආබාධං) | බලවත් වූ බවුනොවුන් නියතවන දරුණු රෝග හට ගැනීම, මෙහි ලා ගැනෙන්නේ පිළිකා, ලාදුරු, කුෂ්ඨ, පක්ෂඝාත, ඇදුම ආදී රෝගයන්ට භාජනය වීමයි. |
| ⑤ | උමතු බව (චිත්තක්ඛේපං) | අමනුෂ්‍යයන් සිරුරට ආරූඪ වීමෙන් හෝ චිත්ත කිපීමෙන් වන මළුබාදයන්ට හෝ පත්වීම.(අතීත භවයන්හිදී කළ කර්ම විපාක වශයෙන් උපතින්ම උමතුවන් සිටිය හැක.) |
| ⑥ | රජුන්ගෙන් වන උවදුරු (රාජතොර උපස්සග්ගං) | තනතුරු වලින් පහ කිරීමෙන්ද, ධනය රජයට ගැනීමෙන්ද, වතුපිටි, ඉඩකඩම්, ගේ දොර ආදිය රාජ සන්තක කිරීමෙන්ද වශයෙන් සිදුවන උවදුරය. |
| ⑦ | බොරු දෝෂාරෝපන (දාරුණං අබ්භක්ඛානං) | දරුණු බොරු දොස් නගා සිටිය, තමා නොඇසූ, නොසිතූ, නොදුටු බලුගතු අපරාධයක් තමා විසින් කළා සේ දොස් නැගීම් අසන්නට සිදු වීම මෙහිලා ගැනේ. |
| ⑧ | නෑයන්ගේ විනාශය (ඤාතීනං පරික්ඛයං) | විපතේදී පිහිට වන, සැපතේදී සතුටුවන නෑයන්ගේ වියෝවය. දුක සැප දෙකෙහිම එකසේ පිහිට වන නෑයන්ගේ නැතිවීම ජීවිතයේ දියුණුවට බාධාවන කරුණක් වේයි. |
| ⑨ | වස්තු විනාශය (භොගානං පභංගුරං) | සම්පත්තියන්ගේ වැනසීමය. මතු ප්‍රයෝජනය සඳහා රැස්කොට තැබූ රන්-රිදී, මුතු-මැණික්, ආදී විනාශ වීමය. වස්ත්‍රාභරණ ආදී උපභෝගද දැසි-දස් ආදී, ගව-මහිෂාදී පරිභෝගද විනාශ වීම. |
| ⑩ | සිය ගෙය ගිනි ගැනීම (අගාරානි අග්ගි ඩහති) | ජීවත්ව සිටින ගේ ගිනි ගෙන ඇවිළී විනාශ වීම. අත් ගින්නක් නැතිනම් හෙණ ගින්නෙන් හෝ ඉඩෙම් කැබී සිටින ගින්නකින් හෝ මහතට වරක් හෝ කීපිප වරක් විනාශ වීම. |

** හේතු-ඵල ධර්මය මත පවතින සංසාර ගමන තුළදී අපට දුක් ඇසුට විඳීමට සිදුවේ. ඒ අතර මෙලොවදී හා අතීත සංසාර ගමනේදී ගුණ උතුමන් හට සිදුකර ඇති නොමැරුදුනු ක්‍රියා නිසා මෙවැනි දසවිධ දුක්ඛයන්ගෙන් එකකට හෝ පැමිණේ. මරණින් මතු අපායක වේ. මිනසා දණ්ඩිත ගුරු කර පමණක් දාන්ට යෙන අකුසලයන්ට ප්‍රතිවිරුද්ධ කුසල කම් වල යෙදීමෙන් බොහෝ දුක්ඛයෝ දුරුකර ගත හැකිය. එයද සමහරක් දාන්ටිත බෝදියාන්ට පමණක් ඇති කාරනයකි.*

ශ්‍රේෂ්ඨ බව :-
- මනුෂ්‍යයා → තිරිසනාට වඩා
- පුරුෂ රත්නය → ස්ත්‍රී රත්නයට වඩා
- අනගාරික (පැවිද්දා) → අගාරික (ගෘහස්ථ රජුට) වඩා
- අපේක්ෂා (රහත්) → සේඛ (සෝවාන්, සකදාගාමී, අනාගාමී) වඩා
- පටිසම්භිදා ඇති → නොම පටිසම්භිදා අයෙකුට වඩා
- අභිනිහාර සම්පන්න → නොම අභිනිහාර සම්පන්නාට වඩා
- බුද්ධ රත්නය → ශ්‍රාවක රත්නයට වඩා
- සම්මා සම්බුද්ධ උතුමා → පච්චේක බුදුන්ට වඩා

උතුමන් පෙළීම බුදුරජුන් වදාල අවස්ථාවක්

" යො දණ්ඩෙන අදණ්ඩෙසු
අප්ප දුට්ඨෙසු දුස්සති
දසන්න මඤ්ඤතරං ඨානං
ඛිප්පමෙව නිගච්ඡති "

අදහස :- කාය දණ්ඩාදී දණ්ඩනයට නොහිමි වූ කිසිවකුට ද්‍රෝහි නොවූ හෙවත් වරදක් නොකළ උතුමකු කෙරෙහි යම් පුද්ගලයෙක් කාය දණ්ඩාදියෙන් අපරාධ කෙරේද හෙවත් හිංසා කෙරේද හෙතෙම දසවිධ වූ දුක්ඛ කාරණයන් අතුරෙන් එක්තරා දුකකට වහාම පැමිණේ.(මුගලන් තෙරුන් අරභයා වදාළ ගාථාවකි.)

මුගලන් මහ රහතන් වහන්සේ | අග්‍ර ශ්‍රාවක වූ මුගලන් මහ රහතන් වහන්සේට පිරිනිවීමට සිදුවූයේ සොරු පිරිසක් පහරදී උන් වහන්සේගේ ශරීරය බිඳීම හේතුවෙනි.එය උපච්ඡේදක කර්මයක් බවින් ඊට හේතු වූයේ අනන්ත සංසාරයේ එක් භවයක බිරිඳගේ ඉල්ලීම මත අඳ මව්-පිය දෙපළ ලූ ප්‍රපාතයකට දමා ජීවිතක්ෂයට පත් කිරීමේ පාපයයි. එයට අනාදිමත් කාලයක් අවීචියේ පැසී පුරුදු වූ විපාක වශයෙන් අන්තිම අත්භවයේ විපාක විඳීම වශයෙන් තෙරුන්ගේ සතර දීමට ලක්විය.)

දෙව්දත් තෙරුන් සසරින් මිදීම | දෙව්දත් තෙරුන් බුදුරජාණන් වහන්සේට නොයෙක් උපද්‍රවද සංඝ භේදයද සිදු කළහ. සංඝ භේදය හේතුවෙන් පොළොව විවර වී අවීචියට යන මොහොතකට පෙර බුදුන් සරණ ගියේය. පාපයෙන් කල්පයක් අවීචියේ පැසුනද අවසානයේ අට්ඨිස්සර නමින් පසේ බුදු කෙනෙකුන් වන බව මිලින්ද රජුට නාගසේන රහතන් වහන්සේ දක්වා ඇත. එසේ බුදු රජාණන් වහන්සේ සම්මුඛ නොවුනා නම් කල්ප කෝටි ගණනින් අපා දුක් විඳින්නට සිදුවන බව දක්වා ඇත.

ආනන්තර්‍ය කර්මය දුබල වූ අවස්ථාවක් | අජාසත්ත රජතුමා දෙව්දත් තෙරුන් අනුශාසනා නිසා පිය රජතුමා මැරවීමට පෙළඹුනහ. එම ආනන්තර්‍ය පාපකර්මය හේතුවෙන් මරණින් මතු අවීචියේ ඉපදීම නියමිත වුවද තුණුරුවන් කෙරෙහි සද්ධාවෙන් සිදුකළ කුසලකර්ම හේතුවෙන් මරණින් මතු ලෝහකුම්භී නරකයක උපදින බව දක්වා ඇත.(නරකයට වඩා බොහෝ දුක් අඩු අපායෙකි.)

මනුෂ්‍යයා මැරීම:- දුටුගැමුණු මහ රජතුමා යුද්ධයේදී සිදුවූ මහා මිනිස් සංහාරය ගැන පසුතැවිලි වූහ. එතුමාගෙන් සිදුවූ මනුෂ්‍ය ඝාතනය දැක්වූ රහතන් වහන්සේලා දේශනා කළේ තිසරණ සරණ ගිය එක් පුද්ගලයෙකු සිටි බැවින් එක් මනුෂ්‍ය ඝාතනයක්ද, පංච සීලය රැක්ක එක් අයෙකු සිටි බැවින් මනුෂ්‍ය ජීවිත භාගයක් ජීවිතක්ෂයට පත්ව ඇති බවයි.

සැලකිය යුතුයි:-
* අභිනිහාර නම් බුදු කෙනෙකුන් හමුවේ සිදුකරන ප්‍රථම ප්‍රාර්ථනාව,(බුද්ධත්වය, අග්‍රශ්‍රාවක ආදී උතුම් පදවි සඳහන්.)
* දසවිධ දුක්ඛ වේදනා එකක් හෝ කිහිපයක් සමහර අයෙකුට විඳීමට සිදුවේ. එය පාරමිතා ගුණ ඇතිකිරීමට උපකාර වේ.
* ගුණ උතුමෝ සොයා බලා ගරු සත්කාර කිරීම දුෂ්කර බැවින් සමාජ පිළිගැනීමට පූද සත්කාර කළ යුතුය.

පුණ්‍යානුමෝදනය :- බු.ව. 2552 වෙසක් පුන් පොහෝ දින ධර්ම දානය ලෙස මෙම දහම් පත්‍රිකාව (සංවිධාන ගුණානන්ද හිමි) වන අප විසින් සකස් කොට වැලිගම්පිටියේ පදිංචි සද්ගුණවත් හාර්යාප්පෙරුම් මහතාගේ සහ විදාගම්අනුලා විජේමාන්න උපාසිකා මාතාවගේ ධන පරිත්‍යාගයෙන් මුද්‍රණය කොට බෙදා දෙන ලදී. මෙම ධර්ම දානය සියළු දෙනාටම නිවන් අවබෝධය පිණිස හේතුවේවායි ප්‍රාර්ථනා කරමි.....!

උපකාරක පොත් :- පාරමිතා ප්‍රකරණය,බුද්ධ නීති සංග්‍රහය(වේරගොඩ චන්දවිමල හාමිම රචිත)
පූජාවලිය, මිලින්ද ප්‍රශ්නය හා හාලියගේ අරියධම්ම හාමිම දේශනා

තෙරුවන් සරණයි !

3 නො විමසා ක්‍රියා කරන රජ

ක්‍රෝධ කරන(කිපෙන) පණ්ඩිතයා 4

ද ස පා ර මි තා ධ ර් ම

| | පාරමිතා (බෝධිසත්ව පාරමී පිරිමයකි) | සරල පදනම | කෙටි විස්තරය |
|---|---|---|---|
| 1 | දාන පාරමිතා (වෙස්සන්තර ජාතකය) | නිවන් පතා පූජා කිරීම, පරිත්‍යාග කිරීම | පූජාවක් ලෙස හෝ අනුග්‍රහයක් වශයෙන් දෙන එම වස්තුව කෙරෙහි ලෝභය දුරු කර දීමෙන් සතුටුව නිවන් පිණිස වේවායි පතන කල්හි දාන පාරමිතාවයි. |
| 2 | ශීල පාරමිතා (භූරිදත්ත ජාතකය) | නිවන් පතා කය, වචනය, සංවර කිරීම | සම්බෝධිය පිණිස රත්නාවූ ශීලය කෙලෙස් වලින් කිලිටි නොවන සේ අඛණ්ඩව කුසල බලයෙන් පවත්වන ශීලය ශීල පාරමිතාව වේ. |
| 3 | නෛෂ්ක්‍රම්‍ය පාරමිතා (මහා ජනක ජාතකය) | කම් සැප හා භවයන් කෙරෙන් වෙන්වීමේ කැමැත්ත | නුවණින් යුක්තව කාමයන්ගේ සහ භවයන්ගේ ආදීනව දැක කාමයන් කෙරෙන් හා භවයන් කෙරෙන් නික්මෙන්නා සිතේ ඇති කැමැත්ත (නිර්වාණ අවබෝධය) |
| 4 | ප්‍රඥා පාරමිතා (විදුර ජාතකය) | නිවන් පිණිස නුවණින් කුසල් රැස්කර ගැනීම | සම්බෝධිය පිණිස විදර්ශනා ඥානය දියුණු කර ගැනීමට දහම් ශ්‍රවණය, දේශනා කිරීම, තිලක්ෂණ මෙනෙහි කිරීම යනාදී ප්‍රඥාවෙන් කටයුතු කිරීම |
| 5 | වීර්ය පාරමිතා (අපණ්ණක ජාතකය) | නිවන් දක්නා මොහොත දක්වා උත්සාහයෙන් කටයුතු කිරීම | නිවන් දැකීම පිණිස පවත්වන ආමිස, ප්‍රතිපත්ති අනයන්ට යහපත සිදු කිරීම ආදී නුවණින් යුක්තව කුසල් වැඩි වීමට කරන වීර්යය පාරමිතාවයි |
| 6 | ක්ෂාන්ති පාරමිතා (මහා කපි ජාතකය) | අකුසල කම් සිදුනොවන ලෙස ඉවසීමෙන් කටයුතු කිරීම | සම්බෝධියට පැමිණීම සඳහා, ඇතිවන සා-පිපාසා ලෙඩ රෝග ආදී දුක්ද, මනුෂ්‍ය තිරශ්චීන සත්වයන්ගෙන් වන පීඩා ආදිය ඉවසීම පාරමිතාවයි |
| 7 | සත්‍ය පාරමිතා (මහා සුතසෝම ජාතකය) | නිවන් පිණිස සත්‍යය රකිමියි කල කී දෑ ඒ ආකාරයෙන් කිම | අනුන් නොරැවටීම, පොරොන්දු කඩ නොකිරීම ආදියෙන් සත්‍යයෙහි පිහිටා නිවන් පිණිස සත්‍යය රකිමියි කටයුතු කිරීම සත්‍ය පාරමිතාවයි |
| 8 | අධිෂ්ඨාන පාරමිතා (තේමිය ජාතකය) | නිවන් පිණිස නුවණින් සිතූ පරිදි කිරීම හෝ නොකිරීම | යත් ක්‍රියාවන් සිදු කිරීමට සිතූ පරිදි එම දින වකවානු වලදී වෙනස් නොකොට නොඅඩුව සිතූ පරිදි කිරීම අධිෂ්ඨාන පාරමිතාවයි |
| 9 | මෛත්‍රී පරමිතා (චූල්ල ධම්මපාල ජාතකය) | නිවන් පිණිස සියළුම සත්වයන් කෙරෙහි මිත්‍රත්වය පැවැත්වීම | සම්බෝධිය පිණිස සතුරු මිතුරු මැදහත් සැමදෙනා කෙරෙහි පවත්වන මිතුරු බව මෛත්‍රී පාරමිතාවයි |
| 10 | උපේක්ෂා පාරමිතා (ලෝමහංස ජාතකය) | නුවණින් යුක්තව අටලෝදහමේ කම්පා නොවීම | සම්බෝධිය පිණිස සියළු සත්ව සංස්කාරයන් කෙරෙහි මැදහත්ව සිටීම, කටයුතු කිරීම උපේක්ෂා පාරමිතාවයි |

සැලකිය යුතුයි :-

* ප්‍රාර්ථනා කරන බෝධියකින් නිර්වාණය අවබෝධය පිණිස අවශ්‍යම ගුණ ධර්ම දස පාරමිතා ධර්මයි. එබැවින් නුවණින් පාරමී ගුණ ධර්ම පිරිය යුතුයි. කරන, කියන, සිතන සියළු යහපත් ක්‍රියාවන් නිවන් පිණිස හේතු වේවායි ප්‍රාර්ථනා කළ යුතුයි.
* ප්‍රාර්ථනා පිරීමට පිළිවෙලක් නැත. එක් පාරමිතාවක් පිරීමට කටයුතු කරන විට ඒ හා සම්බන්ධව තවත් පාරමී ගුණ ධර්ම වර්ධනය වේ.
* ශ්‍රාවක බෝධියෙන් නිවන් ප්‍රාර්ථනා කරන්නා හට පාරමිතා (තමන්සතු වස්තු අපේක්ෂාවෙන් තොර) වශයෙන් පුරුදු කර ගැනීම ප්‍රමාණවත් වේ. පාරමිතා පූරණ කාලයක්ද සඳහන්ව නැත. නුවණින් යුක්ත තැනැත්තාට එක භවයක් තුල බොහෝ පාරමී පුහුණු විය හැක.
* සිත් ඇතිවීම ඉන්ද්‍රියන්ට ගැටෙන අරමුණු තුලින් බොහෝ විට සිදුවේ. ලෝකය තුල පවිත්‍රඥානක, අවිඥානක සත්ව, පුද්ගල, වස්තු කෙරෙහි ඇලීම (ලෝභය) ගැටීම (ද්වේෂය) තොරව සිතක් පැවැත්මට (උපේක්ෂා) මෙම පාරමී ගුණ ධර්ම වඩවා තිබූ ප්‍රමාණයට පහසුය. එවැනි සිතක් සමාධි ගතවීම (උද්දච්චය අඩුවීම) ප්‍රඥාව දියුණු වීමට බොහෝ කොට හේතු වේ. මෙය පාරමිතා ධර්ම වැඩීම තුල සිදුවන ප්‍රධාන ලක්ෂණයයි.
* තම සතු වස්තුව පිළිබඳව නිරපේක්ෂව පාරමී පිරීම් - පාරමිතා<br>තම ශරීරයේ අංගයන් පිළිබඳව නිරපේක්ෂව පාරමී පිරීම් - උප පාරමිතා<br>තම ජීවිත පූජාවෙන් පාරමී පිරීම් - පරමත්ථ පාරමිතා වේ.

---

පුණ්‍යානුමෝදනය :- බු.ව.2551 ඇසළ පුන් පොහෝ දින ධර්ම දානය වශයෙන් මෙම දහම් පත්‍රිකාව සකස් කොට (කඩවත ගුණානන්ද හිමි) වන අප විසින් පරිත්‍යාග කරන ලදී. මෙම පින් අනුමෝදනයෙන් නිවන් සැප ප්‍රාර්ථනා කෙරේවා !

උපකාරක පොත් :- පාරමිතා ප්‍රකරණය, අභිධර්ම මාර්ගය(රේරුකානේ චන්ද්‍රවිමල නාහිමි රචිත)

තෙරුවන් සරණයි !

1 මාර්ගාමාර්ග ඥානය

2 ප්‍රතීත්‍යසමුත්පාද ඥානය

( ශමථ කර්මස්ථාන සතළිස )

| | කර්මස්ථාන ආරම්මණ | නිමිත්තට අනුව | | | සමාධියට අනුව | | | | | | | | භාවනා අනුව | | චරිත අනුව | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පරිකර්ම නිමිත්ත | උද්ග්‍රහ නිමිත්ත | ප්‍රතිභාග නිමිත්ත | පරිකර්ම භාවනාව | උපචාර භාවනාව | අර්පණා/I ධ්‍යානය | 2 වන ධ්‍යානය | 3 වන ධ්‍යානය | 4 වන ධ්‍යානය | 5 වන ධ්‍යානය | 1-4 අරූප ධ්‍යාන | විදර්ශනා / සමථ | සමථ / විදර්ශනා | රාග චරිත | ද්වේෂ චරිත | මෝහ චරිත | ශ්‍රද්ධා චරිත | බුද්ධි චරිත | විතර්ක චරිත | සියලුම චරිත |
| කසිණ (10) | පඨවි කසිණය | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | ✓ | | | | | | | ✓ |
| | ආපෝ " | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | ✓ | | | | | | | ✓ |
| | තේජෝ " | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | ✓ | | | | | | | ✓ |
| | වායෝ " | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | ✓ | | | | | | | ✓ |
| | නීල " | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | ✓ | | ✓ | | | | | |
| | පීත " | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | ✓ | | ✓ | | | | | |
| | ලෝහිත " | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | ✓ | | ✓ | | | | | |
| | ඕදාත " | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | ✓ | | ✓ | | | | | |
| | ආකාශ " | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | ✓ | | | | | | | ✓ |
| | ආලෝක " | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | ✓ | | | | | | | ✓ |
| අශුභ (10) | උද්ධුමාතකය | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | | | | ✓ | | ✓ | | | | | | |
| | විනීලකය | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | | | | ✓ | | ✓ | | | | | | |
| | විපුබ්බකය | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | | | | ✓ | | ✓ | | | | | | |
| | විච්ඡිද්දකය | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | | | | ✓ | | ✓ | | | | | | |
| | වික්ඛායිතකය | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | | | | ✓ | | ✓ | | | | | | |
| | වික්ඛිත්තකය | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | | | | ✓ | | ✓ | | | | | | |
| | හතවික්ඛිත්තකය | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | | | | ✓ | | ✓ | | | | | | |
| | ලෝහිතකය | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | | | | ✓ | | ✓ | | | | | | |
| | පුළුවකය | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | | | | ✓ | | ✓ | | | | | | |
| | අට්ඨිකය | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | | | | ✓ | | ✓ | | | | | | |
| අනුස්මෘති (10) | බුද්ධානුස්සති | ✓ | ✓ | | ✓ | ✓ | | | | | | | | ✓ | | | | ✓ | | | |
| | ධම්මානුස්සති | ✓ | ✓ | | ✓ | ✓ | | | | | | | | ✓ | | | | ✓ | | | |
| | සංඝානුස්සති | ✓ | ✓ | | ✓ | ✓ | | | | | | | | ✓ | | | | ✓ | | | |
| | සීලානුස්සති | ✓ | ✓ | | ✓ | ✓ | | | | | | | | ✓ | | | | ✓ | | | |
| | චාගානුස්සති | ✓ | ✓ | | ✓ | ✓ | | | | | | | | ✓ | | | | ✓ | | | |
| | දේවතානුස්සති | ✓ | ✓ | | ✓ | ✓ | | | | | | | | ✓ | | | | ✓ | | | |
| | උපසමානුස්සති | ✓ | ✓ | | ✓ | ✓ | | | | | | | | ✓ | | | | | ✓ | | |
| | මරණානුස්සති | ✓ | ✓ | | ✓ | ✓ | | | | | | | ✓ | | | | | | ✓ | | |
| | කායගතාසති | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | | | | ✓ | | ✓ | | | | | | |
| | ආනාපානසති | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | ✓ | ✓ | | | ✓ | | | ✓ | |
| අප්‍රමාණය (10) | මෛත්‍රිය | ✓ | ✓ | | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | | ✓ | | ✓ | | | | | |
| | කරුණාව | ✓ | ✓ | | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | | ✓ | | ✓ | | | | | |
| | මුදිතාව | ✓ | ✓ | | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | | ✓ | | ✓ | | | | | |
| | උපේක්ෂාව | ✓ | ✓ | | ✓ | | | | | | ✓ | | | ✓ | | ✓ | | | | | |
| ආරූප්‍ය (10) | අනන්තාකාශය | ✓ | ✓ | | ✓ | | | | | | | ✓ | | | | | | | | | ✓ |
| | ආකාශය පැතිරුණු සළ සිත | ✓ | ✓ | | ✓ | | | | | | | ✓ | | | | | | | | | ✓ |
| | විඥානයක් නැති බව | ✓ | ✓ | | ✓ | | | | | | | ✓ | | | | | | | | | ✓ |
| | සංඥාවෙන් ශාන්ත බව | ✓ | ✓ | | ✓ | | | | | | | ✓ | | | | | | | | | ✓ |
| සංඥාව (01) | ආහාරයේ පිළිකුල් බව | ✓ | ✓ | | ✓ | ✓ | | | | | | | ✓ | | | | | | ✓ | | |
| ව්‍යවස්ථාන (01) | ශරීරයේ සතර ධාතු සැලකීම | ✓ | ✓ | | ✓ | ✓ | | | | | | | ✓ | | | | | | ✓ | | |

* චරිත හඳුනා ගැනීම සඳහා බොහෝ ලක්ෂණ ඇති අතර මෙහි එකක් පමණක් දක්වා ඇත.

1. රාග චරිතය
   හැකි ගුණ පසල පිරිම
2. ද්වේෂ චරිතය
   අනුන්ගේ හැකි ගුණ මැකීම
3. මෝහ චරිතය
   විපළුපර නොවත් පලුහැටිල්ලට පැමිණීම
4. ශ්‍රද්ධා චරිතය
   පැහැදිය යුතු තැන පහදින බව
5. බුද්ධි චරිතය
   සිහි නුවණ ඇති බව හා අප්‍රමාද බව
6. විතර්ක චරිතය
   කුසලානුයෝගයෙහි අනභිරතිය

කෙටි සටහන් :-

<u>පරිකර්ම නිමිත්ත</u>
භාවනා නිමිත්ත සිතට නගා ගන්නා අවස්ථාව

<u>උද්ග්‍රහ නිමිත්ත</u>
භාවනා නිමිත්ත සිතට පෙනීමට පටන් ගැනීම

<u>ප්‍රතිභාග නිමිත්ත</u>
භාවනා නිමිත්ත පිරිසිදුව සිතට පෙනෙන අවස්ථාව

<u>පරිකර්ම භාවනාව</u>
භාවනා නිමිත්ත සිතට ගැනීමට කරන භාවනාව

<u>උපචාර භාවනාව</u>
භාවනා ආරම්මණයේ පිහිටා පළමු ධ්‍යානයට පත්විත්ත ආසන්නම අවස්ථාව තෙක් කරන භාවනාව

<u>අර්පණා භාවනාව</u>
පළමු ධ්‍යානයට පැමිණි භාවනාව

විශේෂ සටහන් :- * සියලුම භාවනාවන්හි ධ්‍යානයට පෙර අවස්ථාවන්ට (පරිකර්ම, උපචාර) පැමිණිය හැක. ත්‍රි ලක්ෂණයට (අනිත්‍ය, දුක්ඛ, අනාත්ම) නගා ගැනීමෙන් විදර්ශනා භාවනා වැඩීම සිදුකර ගත හැක.

* පූර්වයෙන් සමථ භාවනාව වඩා, විදර්ශනා වැඩීම, පූර්වාංග සමථ විදර්ශනා ලෙසත් විදර්ශනා වඩා සමථයට පත්වූ විට (මාර්ග ඵල) පූර්වාංග විදර්ශනා සමථ ලෙසත් දක්වා ඇත. (මෙහි භාවනා අනුව තීරු දෙක අප විසින් දැක්වූ සටහනහි විමසා බලන්න)

---


පුණ්‍යානුමෝදනය :- බු.ව.2551 බිනර පුන් පොහෝ දින ධර්ම දානය වශයෙන් මෙම දහම් පත්‍රිකාව සකස් කොට (කඩවත ගුණානන්ද හිමි) වන අප විසින් පරිත්‍යාග කරන ලදී. මෙම පින්කම අනුමෝදනයෙන් ඔබ සැමට නිවන් සැප පිණිස හේතු වේවා !

උපකාරක පොත් :- අභිධර්ම මාර්ගය, බෝධි පාක්ෂික ධර්ම, (රේරුකානේ නාහිමි රචිත) හා වෙනත් - විශුද්ධි මාර්ගය

තෙරුවන් සරණයි !

3 ශ්‍රමණ සම්පත්තිය

4 සද්ධර්ම ප්‍රචාරය


10

# දක්ඛිණා විභංගය

වැඩි විස්තර සඳහා ✆ 0777 772 556, 0777 484 529

**1** වේලාම බ්‍රාහ්මණයාගේ දානය ✣

- රිදියෙන් පිරවූ 84,000 ක් **රන් පාත්‍ර**
- රනින් පිරවූ 84,000 ක් **රිදී පාත්‍ර**
- කහවනුවලින් පිරවූ 84,000 ක් **ලෝකඩ පාත්‍ර**
- රත්‍රන් ආභරණවලින් සැරසූ, රන් ධජ ඇති, රන් දැලින් වැසුණු 84,000 ක් **ඇතුන්**
- සිංහ සම්, ව්‍යාඝ්‍ර සම්, දිවි සම්, පඬු කම්බිලි ඇතිරූ රනින් අලංකාර කළ, රන් ධජ ඇති, රන් දැලින් වැසුණු 84,000 ක් **රථ**
- දුහුල් වස්ත්‍ර ඇති, රිදී කිරි බඳුන් ඇති 84,000 ක් **දෙනුන්**
- මිණි කොඬොල් පැළඳි 84,000 ක් **කන්‍යාවන්**
- කොළු ලොම් ඇතිරිලි ... ඇති 84,000 ක් **පළඟ**
- සියුම් කොමු පිළි, කෞශෙය පිළි, කම්බිලි, කපු පිළි ආදී 84,000 ක් **වස්ත්‍ර**
- ගංගාවක් මෙන් ගලා යන: **අන්නපාන, ඛාද්‍ය, භෝජ්‍ය, ලේහ්‍ය ආදිය**

**2** එක් සෝවාන් පුද්ගලයෙකුට වළඳවීම. → *වේලාම බ්‍රාහ්මණයාගේ දානයට වඩා මහත්ඵලයි.*

**3** එක් සකෘදාගාමී පුද්ගලයෙකුට වළඳවීම. → *සෝවාන් පුද්ගලයන් සියයකට වළඳවීමට වඩා මහත්ඵලයි.*

**4** එක් අනාගාමී පුද්ගලයෙකුට වළඳවීම. → *සකෘදාගාමීන් පුද්ගලයන් සියයකට වළඳවීමට වඩා මහත්ඵලයි.*

**5** එක් රහතන් වහන්සේ නමක් වළඳවීම. → *අනාගාමීන් පුද්ගලයන් සියයකට වළඳවීමට වඩා මහත්ඵලයි.*

**6** එක් පසේබුදුන් වහන්සේ නමක් වළඳවීම. → *රහතන් වහන්සේලා සියයකට වළඳවීමට වඩා මහත්ඵලයි.*

**7** එක් සම්මා සම්බුදුන් වහන්සේ නමක් වළඳවීම. → *පසේබුදුන් වහන්සේලා සියයකට වළඳවීමට වඩා මහත්ඵලයි.*

**8** සම්මා සම්බුදුන් වහන්සේ ප්‍රමුඛ භික්ෂු සංඝයා වළඳවීම. → *සම්මා සම්බුදුරජාණන් වහන්සේ වළඳවීමට වඩා මහත්ඵලයි.*

**9** සිව් දිසාවෙන් වඩින භික්ෂූන් වහන්සේලා උදෙසා විහාරයක් කරවීම. → *ඉහත දානයට වඩා මහත්ඵලයි.*

**10** පැහැදුණු සිතින් තිසරණයේ පිහිටීම. → *ඉහත දානයට වඩා මහත්ඵලයි.*

**11** පැහැදුණු සිතින් පංචශීලය සමාදන් වීම. → *ඉහත පුණ්‍යකර්මයට වඩා මහත්ඵලයි.*

**12** එළදෙනක් කිරි දොවන කාලයක් මෛත්‍රිය වැඩීම. → *ඉහත පුණ්‍යකර්මයට වඩා මහත්ඵලයි.*

**13** අසුරක් ගසන කාලයක් අනිත්‍ය සංඥාව වැඩීම. → *ඉහත පුණ්‍යකර්මයට වඩා මහත්ඵලයි.*

## පුද්ගලික වශයෙන් දියහැකි දානයන්

1. තිරිසනුන් වෙතයෙහි → *සියක් ගුණයක් ඇති දක්ෂිණාවක්* ✪
2. පෘථග්ජන දුස්සීලයන් වෙතයෙහි → *දහසක් ගුණයක් ඇති දක්ෂිණාවක්*
3. පෘථග්ජන සිල්වතුන් වෙතයෙහි → *සිය දහසක් ගුණයක් ඇති දක්ෂිණාවක්*
4. සාසනයෙන් පිටතවූ කාමයන්හි වීතරාගී තාපසයන් වෙතයෙහි → *කෙළ ලක්ෂයක් ගුණයක් ඇති දක්ෂිණාවක්*
5. සෝවාන් ඵල සාක්ෂාත් කරන්නට පිළිපන් තථාගත ශ්‍රාවකයා වෙතයෙහි → *අසංඛ්‍ය ගුණයක් ඇති දක්ෂිණාවක්*
6. සෝවාන් තථාගත ශ්‍රාවකයා වෙතයෙහි → *අසංඛ්‍ය අප්‍රමාණ ගුණයක් ඇති දක්ෂිණාවක් (කවර කතාද)*
7. සකෘදාගාමී ඵල සාක්ෂාත් කරන්නට පිළිපන් තථාගත ශ්‍රාවකයා වෙතයෙහි → »
8. සකෘදාගාමී තථාගත ශ්‍රාවකයා වෙතයෙහි → »
9. අනාගාමී ඵල සාක්ෂාත් කරන්නට පිළිපන් තථාගත ශ්‍රාවකයා වෙතයෙහි → »
10. අනාගාමී තථාගත ශ්‍රාවකයා වෙතයෙහි → »
11. රහත්ඵල සාක්ෂාත් කරන්නට පිළිපන් තථාගත ශ්‍රාවකයා වෙතයෙහි → »
12. අරහත් තථාගත ශ්‍රාවකයා වෙතයෙහි → »
13. පසේ බුදුරජුන් වෙතයෙහි → »
14. අරහත් තථාගත සම්මා සම්බුදුරජුන් වෙතයෙහි → »

## සාංඝික වශයෙන් දියහැකි දානයන්

1. තථාගතයන් වහන්සේ ප්‍රමුඛ උභතෝ සංඝයා වෙතයෙහි
2. තථාගතයන් වහන්සේ පිරිනිවීමෙන් පසු උභතෝ සංඝයා වෙතයෙහි
3. භික්ෂු සංඝයා වෙතයෙහි
4. භික්ෂුණී සංඝයා වෙතයෙහි
5. ප්‍රමාණ වශයෙන් භික්ෂු සහ භික්ෂුණී සංඝයා වෙතයෙහි
6. ප්‍රමාණ වශයෙන් භික්ෂු සංඝයා වෙතයෙහි
7. ප්‍රමාණ වශයෙන් භික්ෂුණී සංඝයා වෙතයෙහි

මූලාශ්‍ර - [illegible]
- ✣ අංගුත්තර නිකාය - 9.1.2.10 - වේලාම සූත්‍රය (පි.435)
- ✪ මජ්ඣිම නිකාය - 3.4.12 - දක්ඛිණාවිභංග සූත්‍රය (පි.520)
- ✱ අංගුත්තර නිකාය - 8.1.4.7 - සප්පුරිස දාන සූත්‍රය (පි.[illegible])
- ◈ අංගුත්තර නිකාය - 8.1.4.1 - දාන සූත්‍රය (පි.[illegible])

### සත්පුරුෂ දානය ✱

1. පිරිසිදු දේ දෙයි.
2. ප්‍රණීත දේ දෙයි.
3. සුදුසු කාලයේ දෙයි.
4. සරුප්පු දේ දෙයි.
5. විමසා බලා දෙයි.
6. නිතර දෙයි.
7. පහන් සිතින් දෙයි.
8. දී සතුටු වෙයි.

### අසත්පුරුෂ දානය ✣

ලූහ හෝ ප්‍රණීත හෝ වේවා,
සකස් නොකොට දීම,
ගරු නොකොට දීම,
සියතින් නොදීම,
ඉවතලන්නා සේ දීම,
කර්මඵල අදහා නොදීම.

[illegible] ඔහුගේ පුතුන්, අඹුවන්, දාසයන්, කම්කරුවන්, මෙහෙකරුවන් පවා ඔහුට කීකරු නොවෙති.

### දාන විශුද්ධීන්ගේ ප්‍රභේද ✪

1. දුස්සීල ප්‍රතිග්‍රාහකයාට සිල්වත් දායකයා දෙන දානය - පිරිසිදු වේ.
2. සිල්වත් ප්‍රතිග්‍රාහකයාට දුස්සීල දායකයා දෙන දානය - පිරිසිදු වේ.
3. දුස්සීල ප්‍රතිග්‍රාහකයාට දුස්සීල දායකයා දෙන දානය - පිරිසිදු නොවේ.
4. සිල්වත් ප්‍රතිග්‍රාහකයාට සිල්වත් දායකයා දෙන දානය - පිරිසිදු වේ.

### දාන හේතු ◈

1. ළඟට පැමිණ දෙයි.
2. බියෙන් දෙයි.
3. මට දුන්නේය යි සිතා දෙයි.
4. මට දෙන්නේය යි සිතා දෙයි.
5. දීම යහපත් යයි සිතා දෙයි.
6. මම පිසමි, මොව්හු නොපිසති. පිසින්නෝ නොපිසන්නන්ට නොදීම නුසුදුසුයයි සිතා දෙයි.
7. මේ දානය නිසා උසස් කීර්තියක් ලැබේ යැයි දෙයි.
8. සිතේ අලංකාරය පිණිස දෙයි.

## ස්වාක්ඛාතො භගවතා ධම්මො, සන්දිට්ඨිකො, අකාලිකො, ඒහිපස්සිකො, ඕපනයිකො, පච්චත්තං වේදිතබ්බො විඤ්ඤූහි. ඒ.



**ස ධා කා ර ද හ මි ගු ණ**

| | දහම් ගුණ | දහම් ගුණ වල සරල අර්ථය |
|---|---|---|
| 1 | ස්වාක්ඛාත | භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මුල-මැද-අග, යන තුන් තැනටම යහපත් වන පරිදි මනා කොට දේශනා කළ බැවින් බුදුන් වහන්සේගේ ධර්මය ස්වාක්ඛාත ගුණයෙන් යුක්ත වන සේක. |
| 2 | සන්දිට්ඨික | සතර මාර්ග - සතර ඵල, උතුම් නිවන, යන නව ලෝකෝත්තර ධර්මය තම තමා විසින්ම ප්‍රත්‍යක්ෂ කොට තම තමා විසින්ම දැකිය හැකි බැවින් සන්දිට්ඨික ගුණයෙන් යුක්ත වන සේක. |
| 3 | අකාලික | මෙම ධර්මයට අනුව ක්‍රියාත්මක වන අයට වර්ෂ ගණන්, මාස ගණන්, දින ගණන්, යන නොවී එවේලේම ඵලය ලැබෙන බැවින් අකාලික ගුණයෙන් යුක්ත වන සේක. |
| 4 | ඒහිපස්සික | සිතැති අයෙකුට විත් මෙම ධර්මය පරීක්ෂා කර බලන්නට කියන්නටද සුදුසුයි. බලාපොරොත්තුවෙන් හෝ මෙම ධර්ම මාර්ගයට යොමු කිරීමට සුදුසු වූ බැවින් ඒහි පස්සික ගුණයෙන් යුක්ත වන සේක. |
| 5 | ඕපනයික | අට ලෝ දහමින් කම්පා නොවී සිටීමට තම අන් සියළු කටයුතු වලට ප්‍රථම මෙම ධර්මය තම සන්තානයේ පහළ කර ගැනීමට සුදුසු වූ බැවින් ඕපනයික ගුණයෙන් යුක්ත වන සේක. |
| 6 | පච්චත්තං වේදිතබ්බ | මෙම ධර්මයට අනුව කටයුතු කරන්නා හට අන් කෙනෙකින් නොව තම සන්තානයෙන්ම අහෝ සැපයි, අහෝ සැපයි, යන සුවය දැනෙන බැවින් පච්චත්තං වේදිතබ්බ ගුණයෙන් යුක්ත වන සේක. |
| | "ඉමේහි ඡහි ගුණේහි සමන්නාගතං ධම්ම රතනං සරණං ගච්ඡාමි, ධම්ම රතනං සිරසා නමාමි." | |

**ධර්මය විකාශනය** — සියළුම සම්‍යදෘෂ්ටි-මිථ්‍යාදෘෂ්ටි, සත්ව-වස්තූන්ගේ ඇතිවීම, පැවැත්ම, නැතිවීම(විනාශය) යනු ලොව විවිධාකාරයෙන් බලන්නෙකුට පෙනෙන කරුණුය. එහෙත් එම කාරණයන්හි යථාර්ථය නිවැරදිව ප්‍රකාශ කිරීමට සමත් මනුෂ්‍යයෙකු හෝ දෙවියෙකු-බ්‍රහ්මයෙකුද නැත. එබැවින් නොයෙක් මිථ්‍යා මතවාද, වාද-විවාද ඇතිව නොයෙක් ආගම් වලින් විවිධ සාක්ෂි සපයනු ලැබේ. මෙවැනි පසුබිමක් තුළ සත්‍ය දැන ගැනීමේ අවශ්‍යතාවය වෙනුවෙන් බුද්ධිමත් පිරිසක් වීතරාගී වූ කල සම්මා සම්බුද්ධවරයෙකු පහළ වීම ලොව ධර්මතාවයකි. තමන් වහන්සේ ධර්මය අවබෝධ කරගෙන නිත්‍යලාභී වී ලෝ තුළ දේශනා කරන බැවින් එම ධර්ම රත්නයෙහි අගු කෙනෙක් හෝ ලොවේ කෙනෙක් පෙන්වීමට සමත්වෙද නැත. එම නිසා සෑම බුදුවරයෙකුම තමන් වහන්සේගේ ගුරුවරයා හැටියට ලෝකයේ පරම සත්‍ය දෙසන ධර්ම රත්නය ගුරුවරයා කොට තබා ගනී. ගෞතම බුදු රජාණන් වහන්සේද භාවනාවෙන් තොර වූ නිසා වැසී තිබූ ලොව සත්‍ය ධර්මය අවබෝධ කොට පන්සාළිස් වසරක් එම සත්‍ය ලොවට දේශනා කළ සේක. බුදුන් වහන්සේගේ පිරිනිවීමෙන් දෙසූ උතුම් ධර්මය සංගායනා ලොව ශාසනය පවත්වාගෙන එයි.

**බුදුන්වහන්සේ පන්සාළිස් පස් වසරේ දෙසූ ධර්මය**

- ප්‍රථම බුද්ධ වචනය (අනේක ජාති සංසාරං ...)
- මධ්‍යම බුද්ධ වචනය → ධර්මය → සූත්‍ර (21000), අභිධර්මය (42000) → ත්‍රිපිටකය (84000); විනය (21000)
- පශ්චිම බුද්ධ වචනය (හන්දදානි භික්ඛවෙ ...)

☆ ප්‍රථම ධර්ම සංගායනාවෙන් පසු ධර්ම සූත්‍ර-අභිධර්ම ලෙස වර්ගීකරණය කරගැනීමට පහසු වන ලෙස පෙළ ගස්වා ඇත.
☆ බුදු පිරිනිවී 2000 ක් පමණ ඉක්ම ගියවිට ලංකාවේ දී පාලි භාෂාවෙන් පොත් වල ලියා ආරක්ෂා කරන ලදී. (ත්‍රිපිටකය අටුවා ගොඩ සහිත ලෙස පොත්වල ලියවන ලදී)
☆ ත්‍රිපිටක ධර්ම පාලියෙන් තිබූ නිසා එය සිංහල භාෂාවට පරිවර්තනය කළේය. ආදිය → විනය → පිටක ආදී වශයෙන් දක්වයි.

**සංක්ෂිප්ත ධර්ම කරුණු කිහිපයක්**

| ☆ | ධර්මයේ ගමන් කළ යුතු පිළිවෙල | ☆ | ධර්ම අවබෝධයට පහසුම භාවනා (සතර සතිපට්ඨානය) | ☆ | මාර්ග ඵල ලැබිය හැකි අවස්ථා |
|---|---|---|---|---|---|
| 1. | පරියත්ති ධර්මය(ධර්මය දැන උගැනීම) ↓ | 1. | ශරීරයේ සියළු ඉරියව් පැවැත්වීමේදී එහි සිහිය පවත්වා ගැනීම කායානුපස්සනාවයි. | 1. | ධර්මය ශ්‍රවණය කිරීමේදී |
| 2. | ප්‍රතිපත්ති ධර්මය(ධර්ම-විනයේ හැසිරීම) ↓ | 2. | ශරීරයේ ඇතිවන සියළු වේදනා ආකාර සිහියෙන් දැන ගැනීම වේදනානුපස්සනාවයි. | 2. | ධර්ම දේශනා කිරීමේදී |
| 3. | ප්‍රතිවේධ ධර්මය(මාර්ග ඵල අවබෝධය) | 3. | සිතේ පහළ වන කුසල්, අකුසල් සිත් දැන හඳුනාගෙන සිත මෙහෙයවීම චිත්තානුපස්සනාවයි. | 3. | ධර්ම සජ්ඣායනා කිරීමේදී |
| | | 4. | නීවරණ ධර්ම, බොජ්ඣංග ධර්ම ආදී දැන හඳුනාගෙන සිත පවත්වාලීම ධම්මානුපස්සනාවයි. | 4. | ධර්මය මෙනෙහි කිරීමේදී |
| | | | | 5. | භාවනා කිරීමේදී (ත්‍රිලක්ෂණය වැටහෙන භාවනාවක් තුළින්) |

**ආර්යයන් පුද්ගලයින් තුළ පැහැ නැති දස සංයෝජන ධර්ම**

| ඵලස්ථ පුද්ගලයා / මාර්ගස්ථ පුද්ගලයා | | සක්කාය දිට්ඨි | විචිකිච්ඡා | සීලබ්බතපරාමාස | කාමරාග | පටිඝ | රූපරාග | අරූපරාග | මාන | උද්ධච්ච | අවිජ්ජා | ඒ ඒ ඵලයන්ට පත්ව සිට කළුරිය කිරීමෙන් නැවත උපදින භව ගණන හා උපදින අවස්ථා |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සෝවාන් | " / " | × | × | × | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | * ආත්ම භාව සතකින් පිරිනිවීම(දෙව්, මිනිස් භව තුළ පිය සපා) |
| සකෘදාගාමී | " / " | × | × | × | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | * මිනිස්ලොව එක් වරක් උපදින සැකෙත්තා |
| අනාගාමී | " / " | × | × | × | × | × | ✓ | ✓ | ✓ | ✓ | ✓ | * පංච ශුද්ධාවාස බ්‍රහ්ම ලෝක වල ඉපදී එහි පිරිනිවීම |
| අර්හත් | " / " | × | × | × | × | × | × | × | × | × | × | * නැවත උපතක් නැත. පිරිනිවීම තෙවත් සදා ශාන්ත සුවය |

**විශේෂ කරුණු:**
* ධර්මයට අනුව කටයුතු කරන කෙනෙක් කිසිවකුට සැහැසීමක් ඇති කර ගත නොහැක.
* සසර, සසරයන් ලෙස දකින්නට බුද්ධියක් නම් ආගම් භේදයකින් තොරව සමගියෙන් කටයුතු කළ හැකිය.
* අපට සසර ගෙන යන අපේ සිතට වහල් නොවී ධර්මයට අනුව කටයුතු කළ හැකිනම් සසර ගමන නිම කළ හැකිය.
* කෙනෙකුගේ සතර අපා උත්පත්තිය සෝවාන් ඵලයට පත් වීමෙන් අවසන් වේ.

---

පුණ්‍යානුමෝදනාව :- බු.ව.2551 නවම් පුන් පොහෝ දින ධර්ම දානය වශයෙන් මෙම දහම් පත්‍රිකාව සකස් කොට (සද්වන ගුණානන්ද හිමි) එන අප විසින් පරිත්‍යාග කරන ලදී. මෙම පින්කම් අනුමෝදනාවෙන් සැමටම නිවන් සැප පිණිස හේතු වේවා !

උපකාරක පොත් :- බුද්ධ මහා ගුණ, සතිපට්ඨාන භාවනා ක්‍රමය, බෝධි පූජා (රේරුකානේ චන්දවිමල රචිත) පොතක් - මහා වංශය

තෙරුවන් සරණයි !

① බේබදු කමෙහි (සුරා පානයේ) යෙදවයි.      නො කල්හි වීථි සංචාරයේ යෙදවයි. ②

**පඤ්ච විධ සම්පත්තිය**


| | සම්පත් | කෙටි විස්තරය |
|---|---|---|
| ① | ඥාති සම්පත් | යමෙකුට දුක සැප දෙකෙහිම එකසේ ඉදිරිපත්ව කටයුතු කරන ඥාති සමූහයක් වේද, එය ඥාති සම්පත්තියක් වන්නේය. එසේ හොඳ ඥාති පිරිසක් ලැබීම පූර්ව කුසල කර්මයක විපාකයක්ද වන්නේය. යමෙක් ඥාතීන්ට ප්‍රිය අයෙකු වන්නේද සිල්වත් වීමේ ආනිසංස වශයෙනි. දස විධ ඥාතීන් පිරිසක් ධර්මයේ හඳුන්වා දී ඇත. |
| ② | භෝග සම්පත් | යමෙකුට ලැබූ භවය සුවසේ ගත කිරීමට හැකි පරිදි නිවැරදිව ලැබූ හෝ ලැබෙමින ධන භෝග ඇත්නම් ඔහුට එය භෝග සම්පතකි. කෙනෙකුට එම සම්පත අඩු වීම හෝ යම් යම් කාල කළ ලැබීම, නොලැබීම සිදුවිය හැක. එසේ වුවද ධන භෝග ප්‍රයෝජනයට ගැනීම නිසි ලෙස සිදු කරන්නේ නම් සෑම කල්හි භෝග සම්පත නොවිටිනී පවතින්නේය. |
| ③ | ආරෝග්‍ය සම්පත් | යමෙකුට කායික නිරෝගී බව, මානසික නිරෝගී බව(සැනසීම) තිබේ නම් ඔහුන්ට එය උසස්ම සම්පතකි. කායික නිරෝගී බව, මානසික නිරෝගී බවටත්, මානසික නිරෝගී බව කායික නිරෝගී බවටත් උපකාර වෙමින් එකිනෙක බැඳීම පවතී. ලෞකික දියුණුව මෙන්ම ලෝකෝත්තර සැප(නිවන) පිණිස හේතු වන බැවින් නිරෝගී බව පරම සම්පතකි. |
| ④ | ශීල සම්පත් | යමෙකු ශීලයක පිහිටා කායික, වාචසික, මානසික වශයෙන් කුසල ධර්ම සිදු කරයිද ඒ තුළින් ඔහුට මිගත් යහපත් විපාක ඇති කිරීමට හේතුවේ. එබැවින් ශීලය සම්පත්තියක් වන්නේය. එසේම දෙලොව යහපත පිණිසම දෙවියන් සහිත ලෝකයාගේ ගෞරවාදරයටත් සිල්වත් පුද්ගලයා පත් වන්නේය. සියළු ගුණ ධර්ම වැඩෙන මූල බීජය නිසාද ශීලය සම්පත්තියක් වන්නේය. |
| ⑤ | දෘෂ්ටි සම්පත් | යමෙකුට සසර පැවැත්මේ ස්වභාවය පිළිබඳ හේතු-ඵල වශයෙන් නිවැරදි දැකීමක් ඇත්ද, එය ඔහුට දෘෂ්ටි සම්පත්තිය වන්නේය. එසේ කර්මය හා කර්ම ඵලය ගැන විශ්වාසය ඇති වීම තුළින් නිවැරදිව කුසල කර්ම සිදු කිරීම, පව් කම් වලින් ඈතෙර වීම, සිදු වන බැවින් සම්‍යක් දෘෂ්ටිය ඇති බව උසස්ම සම්පත්තියක් වන්නේය. |

* *මෙම ඥාති, භෝග, ආරෝග්‍ය සම්පත් යම් කෙනෙකුට තිබුණද ඒ හේතුවෙන් මිදුන් මරණින් මතු සුගති අභිනව උත්පත්තියක් නොලබන අතර ශීල, දෘෂ්ටි සම්පත් ඇතිනම් සුගති අභිනවයට පැමිණේ. එසේම ලෞකිකව සම්පත් කෙනෙකුගේ ව්‍යසනයට පත් වීමෙන් ශීල, දෘෂ්ටි සම්පත් දෙකේ ව්‍යසනයක් වීම තුළින් පමණක් දුර්ගතියක උත්පත්තියකට පැමිණෙ ඊට හේතුව ශීල, දෘෂ්ටි, ව්‍යසනයන් අකුසල් වන බැවිනි. දෘෂ්ටියේ අපිරිසිදු බාර්ය මත සියර සත්වයන්ට සසරේ සැප සැරීමට සිදුව ඇති බවද සලකා ගත යුතුය.*

දසවිධ ඥාති :- 1.ජේෂ්ඨ භාතු (අයියා) 2.කණිෂ්ඨ භාතු(මල්ලී) 3.ජේෂ්ඨ භගිනි(අක්කා) 4.කණිෂ්ඨ භගිනි(නංගී)
5.චූල මාතු(පුංචම්මා) 6.මහා මාතු(මහ අම්මා) 7.චූල පිතු(පුංචිපියා) 8. මහා පිතු(මහ පියා) 9.පිතුච්ඡා(නැන්දා)
10. මාතුල (මාමා) (මෙම දස ඥාතීන්ට මවුපියන් සොහොයුරන් සොහොයුරියන් කිරීම තිසුළුන්ද වරදක් නොවන බව ධර්මයේ සඳහන්ව ඇත.)

ධන භෝග රැස් කිරීම හා ප්‍රයෝජනයට ගැනීම
" ඒකෙන භොගෙ භුඤ්ජෙය්‍ය
ද්වීහි කම්මං පයොජයෙ
චතුත්ථඤ්ච නිධාපෙය්‍ය
ආපදාසු භවිස්සති "

* බුදුන් වහන්සේ උපයන ධනය පරිභෝජනය කළ යුතු ආකාරය කොටස් සතරකට බෙදා දැක්වූ අයුරු




දිවි පැවැත්මට ධනය රැස් නොකළ යුතු වෙළඳාම්
1. මාරක ආයුධ වෙළඳාම.
2. මත්පැන් වෙළඳාම.
3. විෂ වෙළඳාම.
4. මස් පිණිස සතුන් විකිණීම හා මස් වෙළඳාම.
5. වහල් වෙළඳාම.
(අංගුත්තර නිකාය පංචක නිපාතය)

දීර්ඝායුෂ්ක නොවීමට හේතු
1. අසප්පාය භෝජන ආදිය ගැනීම.
2. සප්පාය භෝජනයෙහි පමණ නොදැනීම
3. පැසුනු නොවූ ආහාරය දිරවීමට පෙර ආහාර ගැනීම
4. නො කල්හි ඒ මේ අත(වීථි) ඇවිදීම.
5. බ්‍රහ්මචාරී නොවීම. යන කරුණු ආරෝග්‍ය බව විනාශ කරන අල්ප ආයුෂ්ක බවට පත් කරන කරුණු වන අතර මේ කරුණින් වැළකී කටයුතු කිරීමෙන් දීර්ඝායුෂ්ක වීමට හේතු වන බව දැක්වේ.(අංගු. පංචක නිපාතය.)

නිරෝගී බව රැකෙන සත්වයාගේ අනුසස් (අංගුත්තර නිකාය)
1. ශ්‍රද්ධාවෙහි පහසු (අද්ධානක්ඛම) වෙයි.
2. වීර්යයෙහි පහසු(පධානක්ඛම) වෙයි.
3. අල්පාබාධ(නිරෝගී) වෙයි.
4. කෑ බී දෑය මනාව දිරවයි.
5. සමාධිය චිරස්ථායි වෙයි.

ලෝකයෙහි දුර්ලභ කරුණු සතරක් (අංගුත්තර නිකාය)
1. ධර්මයෙන් භෝග සම්පත් උපයා ගැනීම.
2. ඥාතීන් මිත්‍රයින් සමග ධර්මයේ පරිවාර සම්පත් දියුණු වීම.
3. ඥාතීන්, මිත්‍රයින් සමග බොහෝ කල් ජීවත් වීම.
4. ගෑ හිත මිතුරන් සමග දැහැමින් බොහෝ කල් ජීවත්වීම. මරණින් මතු ස්වර්ගයෙහි ඉපදීම යන කරුණු ලෝකයේ දුර්ලභ බව දක්වා ඇත.

පුණ්‍යානුමෝදනය :- බු.ව. 2551 වෙසක් පුර පසළොස්වක පොහොය දින පටන් මෙම සදහම් පිටුව බු.ව. 2553 වන නැදින් පුර පසළොස්වක පොහොය දිනට 36 වන සදහම් පිටුව වශයෙන් මුද්‍රණය කරවා පරිත්‍යාග කරමි.මෙම සදහම් පිටුව මෙයින් නිමා කරන අතර මෙම ධර්ම දානය වර්ෂ තුනක් අඛණ්ඩව සිදු කිරීමට හැදෑහැකි පින්වත් ඔබ සැමගේ ආශිර්වාදයත් දිරි ගැන්වීමත් හේතු විය. එබැවින් පින්වත් ඔබ සියළු දෙනාටත් මෙම මුද්‍රණ කටයුතු මනාව සිදු කරදුන් පොලොන්නරුව ද්විශ ප්‍රින්ටර්ස් ආයතනයටත් සදහම් පිටුව බෙදාදීමේ කටයුතු සිදුකළ තුලිත පද්මංචි ලියනගේ මහතාටත් මීට හැර අදුරින් උපකාර කළ සියළු දෙනාටත් ගුරුදේව නායක ස්වාමීන් වහන්සේ ප්‍රධාන සියළු ස්වාමීන් වහන්සේලාටත් මාගේ පියාණන් මෑණියන් ප්‍රධාන සියළු ඥාති හිතමිත්‍රාදී සියළු දෙනාටත් උතුම් නිර්වාණාවබෝධය පිණිස මෙම උතුම් ධර්ම දානමය පින හේතුවේවායි ! ප්‍රාර්ථනා කරමි.

උපකාරක පොත් :- විදර්ශනා භාවනා, (රේරුකානේ චන්දවිමල නාහිමි රචිත) බුද්ධ චරිතය(බලංගොඩ නාහිමි රචිත)
සත් බුදු සිරිත(හා උයන්ගේ අරිය ධම්ම නාහිමි රචිත)
අංගුත්තර නිකාය III (බුද්ධ ජයන්ති ත්‍රිපිටකය)

තෙරුවන් සරණයි !

සවිවිම ඥානානන්ද හිමි

③ නාහාස ද්‍රව්‍යාදියෙහි පෙළඹවයි      සූදුවෙහි පොළඹවයි. ④

1 කුසල චේතනා

2 අකුසල චේතනා

ප ඤ් ච ස් ක න් ධ ය

| ස්කන්ධ ප්‍රභේද | ස්කන්ධ ගණන | ස්කන්ධයන්ගේ සරල විස්තරය |
|---|---|---|
| (1) රූප | 28 | රූපස්කන්ධය ප්‍රභේද විසි අටකින් යුක්ත වේ. රූප කලාප වශයෙන් මිස තනි තනිව පැවැත්මක් රූපයන්ට නැත. එක් රූප කලාපයක අඩුම රූප ගණන අටකි. රූපය ඇසට පෙනීම එහි වර්ණ ධාතුව නිසා සිදු වන්නකි. සතර මහා භූත රූපයන්ගේ මිශ්‍රව පැවැතීම අනුව ඒ ඒ නමින් හඳුන්වයි. |
| (2) වේදනා | 03 | වේදනාව චෛතසික ධර්මයකි. සිත හා චෛතසික ධර්ම එකට පැවැතීම නිසා සිතින් ගන්නා අරමුණු වල හොඳ, නරක, මධ්‍යස්ථ යන එක් ආකාරයකින් විඳීම වේදනාව ලෙස හැඳින්විය හැක. සෝමනස්ස, දෝමනස්ස, උපේක්ෂා යනුවෙන් වේදනාවේ ප්‍රභේද තුනකි. අරමුණු වල මධ්‍යස්ථ වීම උපේක්ෂාවයි. |
| (3) සංඥා | 06 | මේ ඉන්ද්‍රියන්ගෙන් අරමුණු ගැනීම සිදු කරයි. ආරම්මණ වල ආකාර වෙන් කර හඳුනා ගන්නා බව සංඥා චෛතසිකයෙන් සිදු කරයි. දැන උනත් නම් ඇති කර ගැනීම ඒ ඒ කරුණු ගැන සංඥාවක් විධිමත කර ගැනීමයි. රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම වශයෙන් සංඥා සයකි. |
| (4) සංස්කාර | 50 | චෛතසික පනස් දෙක අතුරින් වේදනා හා සංඥා චෛතසික දෙක හැර ඉතිරි චෛතසික පනස සංස්කාර යයි හඳුන්වයි. චිංතන් මිදුවීම සිතින් සිදු වුවද එම සිත් වල ඇතිවන චෛතසික ධර්ම අනුවම කුසලයින්, අකුසල් සිත් වශයෙන් නම් කරයි. |
| (5) විඥ්ඥාණ | 06 | සිත් අනූ එකකි. (121) එම සිත් විඥ්ඥාණ ස්කන්ධය ලෙස හඳුන්වයි. කුසලා කුසල සිත් අනුව සුදුසු චෛතසික යෙදී, හදය වස්තුව ආශ්‍රය කොට සිත් පහළ වුවත් අරමුණ ගන්නා ද්වාර අනුව චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මන වශයෙන් විඥ්ඥාණ ද්වාර සයෙන්ම පහළ වේ. |

නාම ස්කන්ධය

රූප ස්කන්ධය

නිෂ්පන්න රූප (18)

අනිෂ්පන්න රූප (10)

| | |
|---|---|
| 1. පඨවි 2. ආපෝ 3. තේජෝ 4. වායෝ යන සතර මහා භූත රූප | 04 |
| 5. චක්ඛු 6. සෝත 7. ඝාණ 8. ජිව්හා 9. කාය යන ප්‍රසාද රූප | 05 |
| 10. රූපය 11. ශබ්දය 12. ගන්ධය 13. රසය 14. ස්ප්‍රෂ්ඨව්‍යය යන ගෝචර රූප | 05 |
| 15. ඉත්ථි 16. පුරුෂ යන භාව රූප (ජීවත්ව සිටියදී පමණක් පවතී) | 02 |
| 17. හදය රූපය (මනෝ විඥානය පවතින. හදයේ ඇති ලේ ධාතුව ආශ්‍රය කොට පවතී) | 01 |
| 18. ජීවිතින්ද්‍රිය රූපය (කර්ම බලයෙන් උපදින රූප පරම්පරා වශයෙන් පවත්වන ශක්තිය) | 01 |
| 19. ආහාර රූපය (ගන්නා කෑම බීම වලින් උපදින රූප) | 01 |
| 20. ආකාශ ධාතුව (රූප කලාප අතර සිදුරු අවකාශය) | 01 |
| 21. කාය විඥ්ඥත්ති 22. වචී විඥ්ඥත්ති (කය වචන ක්‍රියා කරන විශේෂ වායුව) | 02 |
| 23. ලහුතා 24. මුදුතා 25. කම්මඤ්ඤතා (ශරීරයේ මුදු මොළොක් සැහැල්ලු බව) | 03 |
| 26. උපචය 27. සන්තති 28. ජරතා 29. අනිච්චතා (ලක්ෂණ රූප) | 04 |

* පඨවි, ආපෝ, තේජෝ යන රූප ස්පර්ශ වශයෙන් දක්වා ඇති බැවින් නිෂ්පන්න රූප ගණනය කිරීමේදී ස්පර්ශ අතහැර ගත යුතුය.
* සිතේ ආයුෂ ක්ෂුද්‍රක්ෂණ තුනකි. රූපයේ ආයුෂ ක්ෂුද්‍ර ක්ෂණ පනස් එකකි.

රූප උපද්දවන කරුණු සතර
1. කම්මජ රූප - අතීතයේ කළාවූ කුසලාකුසල කර්ම ශක්තියෙන් උපදවන රූප
2. චිත්තජ රූප - උත්පාද, ස්ථිති, භංග යන සිතේ ආයුෂ තුන් කොටසින් උත්පාදක්ෂණයේ උපදවන රූප
3. උතුජ රූප - රූප කලාපයක ආයුෂ පවතින ස්ථිති කාලයේ තේජෝ ධාතුවෙන් උපදවන රූප
4. ආහාරජ රූප - කෑම, බීම, ශරීරයේ ගෑල්වීම ආදී බාහිරින් ලබා දෙන රූප කොටස් ශරීරය තුළ ඇති කරන රූප කොටස් සමඟ එක්ව ඇති කරන රූප

ප්‍රත්‍යය සතරින් උපදවන රූප: පඨවි ධාතුවේ පටන් ආහාර රූපය දක්වා රූප අටළොස කර්මාදී ප්‍රත්‍යයන් විසින් උපදවන බැවින් ඒවා නිෂ්පන්න රූප වේ.

විශේෂ කරුණු
* ශරීරයේ ඉරියව් පැවැත්වීම චිත්තජ රූප බලයෙන් සිදු කරයි. එහෙත් භවාංග සිතෙන් උපදවන චිත්තජ රූප වලින් ශරීරය හැසිරවීම නොකළ හැකි බැවින් නිද්‍රාව වූ විට වැටීම, බෙල්ල පහත් වීම අතපය තත්වයට පත්වීම ආදිය සිදුවේ.
* පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන රූප සතරින් මහපොළව, ආකාශය, මහා සාගරය, ඉරහඳ වැනි මහා වස්තු නිර්මාණය වී ඇති බැවින් ඒවා මහා භූත රූප ලෙස හඳුන්වයි.
* පඤ්චස්කන්ධය මෙසේ බෙදා දැක්වීම තුළින් මමත්වය හෝ සත්වයා දිවිකිය උරගත ගැනීමට හෝ ස්ථිරව පවතින දෙයක් රූපයක් හෝ සිතක් නැති බව වටහා ගැනීමට සිතට උපකාරී වේ. ඒ තුළින් ප්‍රත්‍යය ඥානය, විපස්සනා ඥානය ඇති කරගෙන භාවනා ඥානය දියුණු කර ගෙන සසර ගමන කෙටි කර ගත හැකිය.

* සර්වචිත්ත සාධාරණ චෛතසික (07)

1. ඵස්ස
2. වේදනා ★
3. සඤ්ඤා ★
4. චේතනා
5. ඒකග්ගතා
6. ජීවිතින්ද්‍රිය
7. මනසිකාර

* ප්‍රකීර්ණක චෛතසික (06)

8. විතක්ක
9. විචාර
10. අධිමොක්ඛ
11. විරිය
12. පීති
13. ඡන්ද

* අකුසල චෛතසික (14)

14. මෝහ
15. අහිරික
16. අනොත්තප්ප
17. උද්ධච්ච
18. ලෝභ
19. දිට්ඨි
20. මාන
21. දෝස
22. ඉස්සා
23. මච්ඡරිය
24. කුක්කුච්ච
25. ථීන
26. මිද්ධ
27. විචිකිච්ඡා

* සෝභන සාධාරණ චෛතසික (19)

28. සද්ධා
29. සති
30. හිරි
31. ඔත්තප්ප
32. අලෝභ
33. අදෝස
34. තත්‍රමජ්ඣත්තතා
35. කායපස්සද්ධි
36. චිත්තපස්සද්ධි
37. කායලහුතා
38. චිත්ත ලහුතා
39. කාය මුදුතා
40. චිත්තමුදුතා
41. කායකම්මඤ්ඤතා
42. චිත්තකම්මඤ්ඤතා
43. කායපාගුඤ්ඤතා
44. චිත්තපාගුඤ්ඤතා
45. කායුජ්ජුකතා
46. චිත්තුජ්ජුකතා

* අසාධාරණ සෝභන චෛතසික (06)

47. සම්මා වාචා
48. සම්මා කම්මන්ත (විරති චෛතසික තුනයි)
49. සම්මා ආජීව

50. කරුණා
51. මුදිතා } (අප්‍රමාණ චෛතසික දෙකයි)

52. ප්‍රඥා චෛතසිකය(අමෝහ)
* නාම ස්කන්ධය යනු චිත්ත චෛතසික මිශ්‍රණයකි.

පුණ්‍යානුමෝදනය :- බු.ව.2552 පොසොන් පුන් පොහෝ දින ධර්ම දානය වශයෙන් මෙම දහම් පත්‍රිකාව සකස් කොට (පඬුවස ගුණානන්ද හිමි) වන අප විසින් වැලිගම්පිටියේ පදිංචි සත්ගුණවත් සාරාචන්ද්‍රපෙරුම මහතාගේ ධන පරිත්‍යාගයෙන් මුද්‍රණය කරන ලදී. මෙම පිංකම් එතුමා ඇතුළු සියලු සැමටම "නිර්වාණය අවබෝධය පිණිස හේතු වේවා" යි ප්‍රාර්ථනා කරමි.

උපකාරක පොත් :- චතුරාර්ය සත්‍යය, අභිධර්ම මාර්ගය(රේරුකානේ චන්දවිමල නාහිමි රචිත)

තෙරුවන් සරණයි !

3 විපාක චේතනා

4 කිරිය චේතනා

1 පෙර භවයන්හිදී විදසුන් වඩා තිබීම

ත්‍රි හේතුක උත්පත්තියක් ලබා තිබීම 2

**සතර මහා භූත රූප**

| භූත රූප | කෙටි විස්තරය |
|---|---|
| ① පඨවි ධාතුව<br>උදා: මහ පොළව, ගස්, ගල්, ඇට, දත්, නිය, ආදිය පඨවි ධාතු බහුල වස්තූන්ය. | පඨවි යනු තද ගතියයි. යම් වස්තුවක් හෝ පුද්ගලයෙක් අතගා හෝ ඔබා බැලුවහම දැනෙන තද ගතිය එම පඨවි ධාතු ස්වභාවයයි. ලෝකයේ සාර භාර වස්තූන්ගේ සිට කුඩා වස්තූන් දක්වා ඇති සෑම පෙනෙන නොපෙනෙන සත්ව පුද්ගල හා වස්තුවකම මෙම පඨවි ධාතුව ඇත. මෙය තනිව කිසිවිට නොපවතින අතර අනෙකුත් භූත රූප සමඟ (ආපෝ, තේජෝ, වායෝ ඇතුළුව) එකකින් අනෙකක් වෙන් කළ නොහැකි පරිදි පිහිටා ඇත. එහෙත් ඒවායේ යෙදෙන රූප කොටස් ප්‍රමාණ අනුව තුම්න භූත රූපයද බව තීරණය වේ. |
| ② ආපෝ ධාතුව<br>උදා: සාගරය, ගංගා, පොකුණු ජලයද ලේ, කඳුළු, සැරව ආදී ආපෝ ධාතුව බහුල අවස්ථාවන්ය. | ඇලෙන, වැගිරෙන බව ආපෝ ධාතුවේ ස්වභාවයයි. යම් වස්තුවක් හෝ සත්ව ශරීරයක් සැකෙසී ඇති රූප කලාප විසිරී නොගොස් එකට බැඳී පැවතීම සිදු වන්නේ මෙම ආපෝ ධාතුවේ බලයෙනි.ආපෝ ධාතු මද වස්තු දැඩි බවින්ද බහුල වස්තු මෘදු බවින්ද යුක්ත වේ. ශරීරය තුළ ආපෝ ධාතුවට අයත් කොටස් දොළොසක් දක්වා ඇත. ජලය යනු ආපෝ ධාතුව බහුල අවස්ථාවකි. සත්ව-වස්තූන් භූත රූප අසමතුලිත වීමෙන් විනාශ වේ. මහ පොළොව ආපෝ ධාතුවෙන් විනාශ වීම ආපෝ සංවර්තයයි. |
| ③ තේජෝ ධාතුව<br>උදා: සූර්යය රශ්මිය ගිනි රශ්මියද සන්තාපන,පාචක පරිදහන අවස්ථාවන්හිදී තේජෝ බහුලය. | උණුසුම් බව හා සිසිල් බව තේජෝ ධාතුවේ ස්වභාවයයි. මෙය ඇසට නොපෙනෙන ධාතුවකි. එහෙත් තේජෝ ධාතුව බහුල ගිනිදැල් වර්ණය දැකිය හැක. මෙම තේජෝ ධාතුව ශරීරයේ ක්‍රියාත්මක වන ආකාරය අනුව සතරාකාරයකින් හඳුන්වයි. සත්වයකු, පුද්ගලයෙකු, කුඩා අවධියේ සිට ක්‍රමානුකූලව මේරීම, පැසවීම, දිරාපත් කිරීම මෙම තේජෝ ගුණයෙන් සිදු කරනු ලබයි.ශරීරය තුළ ක්‍රියාත්මක වන මෙම තේජෝ ගුණය පිරාපාක තේජෝ ගුණයයි. |
| ④ වායෝ ධාතුව<br>උදා: සුළඟද ආශ්වාස ප්‍රාශ්වාස වාතය වායෝ ධාතුව බහුලව ක්‍රියාකරන අවස්ථාවයි. | පුම්බන, තල්ලු කරන බව වායෝ ධාතුවේ ස්වභාවයයි.සත්ව සන්තානය තුළ නිරන්තරයෙන් ක්‍රියා කරයි. පිම්බීම වැඩි වන විට බර අඩු වීමත් හැකිළුනු විට බර වැඩිවීමත් සිදුවේ. සුළඟ යනු වායෝ ධාතුව බහුල වූ අවස්ථාවයි. එබැවින් සුළඟ මඟින් නිතර තල්ලු කිරීම, සෙලවීම සිදු කරයි. බහුලව ස්පර්ශය තුළින් දැනෙන ධාතු කොටසකි. එහෙත් වර්ණය වැඩි වූ විට දැකිය හැක. ගිනිදැල් සමඟ නගින දුමාරය නොයෙක් වර්ණයන්ගෙන් යුක්ත බව දැකිය හැක. |

** ලෝකයේ සවිඤ්ඤාණක, අවිඤ්ඤාණක සත්ව වස්තූන් සැකසී ඇති රූපය එක් රූපයක් නොව රූප කලාප රාශියක එකතුවකි. (රූප 28ක් අතුලතා) එහි ප්‍රධාන රූප සතර මෙම මහා භූත රූපයි. ඒ වාගේම ඒ භූත රූප හා බැඳී වෙන් කළ නොහැකි සේ තවත් රූප කොටස් සතරක් ඇත්තේය. ඒවා වර්ණ, ගන්ධ, රස, ඕජා නම් වේ. මෙම රූප අටට ශුද්ධාෂ්ටක කලාපයක් යැයි හඳුන්වයි. එහෙත් මෙම මූලික රූප කොටස් අටෙහි ඒ ඒ යෙදෙන ප්‍රමාණය වෙනස් වූ විට සියර සත්ව, වස්තූන්ද නොයෙක් නාමයන්ගෙන් හැඳින්වීම සිදු කරයි.*

භූත රූප :- භූත යන වචනාර්ථය නිතර වෙනස් වන, ස්ථිර පැවැත්මක් නැති යන අදහසයි. තවද භූතයෝ යනුවෙන් අමනුෂ්‍ය කොටසකටද ව්‍යවහාර වන නාමයකි. ඔවුන්ගේ ස්වභාවය ක්ෂණයකින් පෙනී සිටීමත් නොපෙනී යාමයි. එසේම මෙම ශරීරය සැකසී ඇති සතර මහා භූත රූප ප්‍රධාන අනෙකුත් රූප ඒකරාශි වී රූප කලාප වශයෙන් පවතින අතර ඉතා කෙටි කාලයකින් නිරුද්ධ වෙති. එක් රූප කලාපයක ආයුෂ සිතේ ආයුෂ මෙන් දාහත් ගුණයකි. ඒ අතරින් කුඩා ක්ෂණ දෙකක් රූප කලාපයක් උපද්දන්නටත්, නිරුද්ධ වන්නටත් ගතවන බැවින් කුඩා ක්ෂණ සතළිස් නවයක් (49) රූප කලාපයාගේ ආයුෂ වේ. මෙම පවතින කාලය තුළ ඒ ඒ හේතු ප්‍රත්‍ය ලැබීමෙන් තමන් මෙන් තව නවක් රූප කලාප උපද්දවා නිරුද්ධ වෙති. මෙහි වේගවත් බව නිසා කිසිවෙකුට එය දැකිය නොහැක. නමුත් කුඩා දරුවෙකුව සිට දිරාපත්වූ මහල්ලෙක් බවට පත් වීමත් ඉන්පසු සිත පැවැත්විය නොහැකි සත්වයට ශරීරය දිරාගිය විට(හෘදය වස්තු රූපය) සිත ශරීරයෙන් ඉවත් වේ. මෙම මරණය සිදු වීම ආයුක්ෂය මරණය හැටියට දක්වේ. මෙම භූත රූප පැවැත්ම මත සිදුවන ක්‍රියා දාමයක් බව වටහා ගත යුතුය.

ආත්ම නොවන බව වසන ඝන සතර
1. සන්තති ඝනය - එකින් එක පෙර පසුව් ඉපිද ඉපිද නිරුද්ධ වී යන නාම රූප පරම්පරාවන්හි ඇත්තාවූ එකක් ලෙස පෙනෙන ස්වභාවය සන්තති ඝනය නම් වේ.
2. සමූහ ඝනය - නාම රූපයන්ගේ පරම්පරාව එකක් සේ පෙනෙන හැටියට බැඳී පවත්නා ස්වභාවය සමූහ ඝනය නම් වේ.මෙය නාමයන්ගේ රූපයන්ගේ වෙනස්වීම නොපෙනෙන ලෙස ඒකරාශී වී ක්‍රියා කරන ස්වභාවයයි.
3. කෘත්‍ය ඝනය - එක් දෙයක් හැටියට වැටහීමය, ආත්මයක් හැටියට වැටහීමය යන අනේක නාම රූපයන් ආත්මය නමැති එක් දෙයක් හැටියට වැටහීමට හේතුවන අන්‍යෝන්‍ය සම්බන්ධය ඇත්තාවූ නාම රූපයන්ගේ කෘත්‍ය සමූහයට කෘත්‍ය ඝනය යැයි කියනු ලැබේ.
4. ආරම්මණ ඝනය - ආරම්මණයන් ගේ වශයෙන් අනේක ප්‍රකාර නාමයන්හි ඇති එක් දෙයක් සේ පෙනීමට හේතුවන බද්ධ භාවය ආරම්මණ ඝනය නම් වේ.රූප,ශබ්ද,ගන්ධ,රස,ස්පර්ශ,ධම්ම යන ආරම්මණ එකක් ලෙස ගැනීම.

විශේෂ කරුණක් :- මෙම භූත රූප ධර්මතාවය පිළිබඳ නිසි අවබෝධයක් ඇති කර ගත් අයෙකුට හැර අන් අයෙකුට අවිද්‍යාව බිඳ සසරින් එතෙර වීමේ(නිවන් දැකීම) දැඩි සැමැත්තක් පහළ නොවනු ඇත.

---

පුණ්‍යානුමෝදනය :- බු.ව. 2552 මැදින් පුන් පොහෝ දින ධර්ම දානය ලෙස මෙම දහම් පත්‍රිකාව (සඞ්වන ගුණානන්ද හිමි) වන අප විසින් සකස් කොට වැලිගම්පිටියේ පදිංචි සත්ගුණවත් සාරියප්පෙරුම මහතාගේ සහ එම මහත්මියගේ ධන පරිත්‍යාගයෙන් මුද්‍රණය කොට බෙදා දෙන අදී. මෙම ධර්ම දානය සියළු දෙනාටම නිවන් අවබෝධය පිණිස හේතුවේවායි ප්‍රාර්ථනා කරමි.

උපකාරක පොත් :- සුවිසි මහා ගුණ, සතිපට්ඨාන භාවනා ක්‍රමය(රේරුකානේ නාහිමි රචිත)
සත්ත සූර්යෝද්ගමන සූත්‍රය(හා උයනේ අරියධම්ම නාහිමි රචිත)
බෞද්ධ ශබ්ද කෝෂය I, II (සිරි ලියනගේ මහතා සම්පාදිත)

තෙරුවන් සරණයි !

3 ධර්ම දේශනාව ශීල,සමාධි, ප්‍රඥා වැඩෙන දේශනාවක් වීම

අසන්නා මහා නිසි බුද්ධියෙන් ශ්‍රවණය කිරීම 4

1 අපාය භූමි

"අන්නං, පානං, වත්ථං, යානං, මාලා, ගන්ධ, විලේපනං,
සෙය්‍යා, වසථ, පදීපෙය්‍යං, දාන වත්ථු ඉමේ දස"

කාම සුගති භූමි 2

**දශ දාන වස්තු**

| | දාන වර්ග | දාන ද්‍රව්‍ය ගැන කෙටි විස්තරය |
|---|---|---|
| ① | අන්නං | ආහාරයට ගැනීමට සුදුසු සියලු ආහාර වර්ග, බත්, ව්‍යංජන, කැවිලි, පලතුරු, ආදී ද්‍රව්‍ය |
| ② | පානං | බීමට ගන්නා හිතකර පාන වර්ග, කිරි, තේ, කෝපි, නොයෙක් පලතුරු බීම ආදී ද්‍රව්‍ය |
| ③ | වත්ථං | ප්‍රයෝජනය වන වස්ත්‍ර වර්ග, ඇඳීමට, පෙරවීමට සුදුසු වස්ත්‍ර ආදිය |
| ④ | යානං | ගමනාගමනයට වාහන දීම, ගමන් පහසුව සැලසීම හෝ ඒ සඳහා කටයුතු කිරීම ආදී |
| ⑤ | මාලා | දිය-ගොඩ හට ගන්නා වර්ණවත් සුවඳවත් මල් වර්ග |
| ⑥ | ගන්ධ | කපුරු, සුවඳ කූරු, සුවඳ කුඩු, ආදිය |
| ⑦ | විලේපනං | ඇඟ ගල්වන ද්‍රව්‍ය, සබන් , වර්ග ආදී ද්‍රව්‍ය |
| ⑧ | සෙය්‍යා | සිටීම, හිඳීම, සඳහා අවශ්‍ය උපකරණ, ඇඳ, පුටු, කොට්ට, මෙට්ට ආදිය |
| ⑨ | වසථ | ජීවත් වීම සඳහා වාසස්ථාන දීම, නිවාස සකස් කර දීම හෝ උපකාර කිරීම ආදී කටයුතු |
| ⑩ | පදීපෙය්‍යං | පහන් දැල්වීමේ උපකරණ, තෙල්, තිරි, ආදී ද්‍රව්‍ය |

* *මෙම දාන වස්තු ගිහි-පැවිදි දෙපක්ෂයටම සාධාරණ වේ. භික්ෂූන් වහන්සේලා උදෙසා පූජා කිරීමේදී සුදුසු ද්‍රව්‍ය සුදුසු කාලයේදීම විනය සලකා කරුණු පරිදි පූජා කිරීමෙකි. අන් අය උදෙසා කාල භේදයක් නැත.*

* විනය පිටකයේ සඳහන් පරිදි දාන වස්තුව -- 1.චීවර 2.පිණ්ඩපාත 3.සේනාසන 4.ගිලාන ප්‍රත්‍යය
* අභිධර්ම පිටකයේ සඳහන් පරිදි දාන වස්තුව -- 1.රූප 2.ශබ්ද 3.ගන්ධ 4.රස 5.ස්පර්ශ

භික්ෂූන් වහන්සේලාගේ පරිභෝජන ආහාර-පාන කැප-අකැප කාලය දැක්වීම

| * | ආහාරපාන පරිභෝජනය කාලයට අනුව බෙදීම |
|---|---|
| 1. | යාවකාලික - පිළිගත් දින විකාලයට පැමිණීම පෙර කාලය තුළ පරිභෝජනය කළ හැක. (මිශ්‍රණයෙන් පැසවූ සියලු ආහාර වර්ග) |
| 2. | යාමකාලික - පිළිගත් දින පශ්චිම යාමය පෙර වැළඳීමට සුදුසු පාන වර්ග (ඇඹිරීමෙන් මිරිකා ගත් කුඩා ඵල පාන) |
| 3. | සත්තාහකාලික - පිළිගෙන දින හතක් පෙර වැළඳිය හැකි ද්‍රව්‍ය (ගිතෙල්, වෙඬරු, තලතෙල්, මී පැණි) |
| 4. | යාවජීවික - ඉහත සඳහන් ද්‍රව්‍ය වලට අයත් නොවන පිළිගෙන ජීවිතාන්තය දක්වා වැළඳීමට හැකි ද්‍රව්‍ය (බෙහෙත් ද්‍රව්‍ය, පත්‍ර වර්ග ආදිය) |

| * | අෂ්ටපාන වර්ග හා පිළියෙල කරන අයුරු |
|---|---|
| 1. | අම්බපානය - ඉදුණු අඹ ඇඹිරීමෙන් මිරිකා ගැනීම |
| 2. | ජම්බුපානය - ජම්බුගෙඩි ඇඹිරීමෙන් මිරිකා ගැනීම |
| 3. | චෝච පානය - ඉදුණු ඇටකෙසෙල් ඇඹිරීමෙන් මිරිකා ගැනීම |
| 4. | මෝච පානය - ඉදුණු කෙසෙල් වර්ග ඇඹිරීමෙන් මිරිකා ගැනීම |
| 5. | මධුපානය - මිදිඵල මිරිකා ගැනීම |
| 6. | මුද්දික පානය - වියළි මිදි ඇඹිරීමෙන් මිරිකා ගැනීම |
| 7. | සාලූක පානය - නෙළුම්ගෙඩි ඇඹිරීමෙන් මිරිකා ගැනීම |
| 8. | ඵාරුසක පානය- මිනන් ගෙඩි ඇඹිරීමෙන් මිරිකා ගැනීම (තවත් මෙවැනි කුඩා පලතුරු වර්ග ඇඹිරීමෙන් මිරිකා සීනි දමා පිළියෙල සකස් කර ගත හැකිය.) |

* *වසුම්බුර වැනි විශේෂ ආහාරයන් දින හතක් කැප බව දක්වා ඇත. කපුරු, කිරිටි, මීපැණි, එළුමී තෙල්, කම්බ යන ගෝලිත් කලවම් කර ගැනීමෙන් රස සාදා ගත හැක.*

**දන්දීමේදී ප්‍රාර්ථනාව විය යුත්තේ** — තමන් සතු ධනය හෝ ද්‍රව්‍යයක් අන් අයගේ ප්‍රයෝජනයට මුදා හැරීමෙන් එහි අයිතිය තමන්ට අහිමි වන්නේය. එමගින් ඒ හා බැඳී තිබූ ලෝභය දුරු වන්නේය. එම නිසා ප්‍රාර්ථනාව විය යුත්තේ මේ හා බැඳී තිබූ ලෝභය දුරු වූවා සේ සියළු සංස්කාරයන් කෙරෙහි ලෝභය හෙවත් තෘෂ්ණාව නැති කිරීමට හේතු වේවා යන ප්‍රාර්ථනාවයි.

**මල්, පහන්, සුවඳදුම්, පූජාව**
- බුදුන් වහන්සේගේ සිල් සුවඳට - සෑම දිශාවකටම හමන සුවඳ දුමින් පූජා කළ හැක.
- බුදුන් වහන්සේගේ සමාධියට - පිපුණු, වර්ණවත්, සුවඳමලින්, පූජා කළ හැක.
- බුදුන් වහන්සේගේ ප්‍රඥාවට - අන්ධකාරය දුරු කරන්නාවූ පහන් ආලෝකයෙන් පූජා කළ හැක.

[මෙය එක් ක්‍රමයකට පූජා කිරීමකි.]

**සැලකිය යුතුයි:-** සංඝයා උදෙසා දන් පූජා කරන විට දාන වස්තුව ඉදිරිපත් කර වචනයෙන් කියා මනසින් එහි අයිතිය සහ සතු කරයි. එසේත් සංඝයා වහන්සේට එහි පරිභෝජන අයිතිය ඇත්තේ අත්පත නොවන් එයත් දෙන තමාරත් දුර සිට පාත්‍රයකට හෝ භාජනයකට හෝ සංඝයා වහන්සේගේ ශරීරය ස්පර්ශ කර සිටින මේසයක් මත තබන දේ පමණි. සංඝයා කැවිත වළක්වා කිරීමෙන් හෝ විකාල පැමිණීමෙන් එහි අයිතිය සංඝරත්නයට නැත්තේය. (ඉර අවරට යාම ආරම්භය විකාලයයි.)

**විශේෂ කරුණු:-**
- නිර්වාණ මාර්ගයේ පළමු පියවර ලෙස දානය සඳහන් කළ හැක. දන් දෙන්නෝ සොරකම් නොකරති.
- දාන මහත්ඵල වීමට තමන්ගේ සිල්වත් බව, ධාර්මිකව උපයා ගත් වස්තුව, ලබන්නාගේ සිල්වත් බව බලපායි.
- යමක් දීමෙන් පසු ඒ ගැන නැවත නැවත සිහිකර සිත සතුටු කර ගැනීම සිත වැඩීමට හේතුවේ.
- දෙන දෙයට අනුරූපව යමක් ලැබීම හේතු-ඵල ධර්මතාවයයි. ප්‍රාර්ථනයක් අවශ්‍ය නැත.(නිවන ප්‍රාර්ථනා කිරීම හැර) දීමට යමක් නැතිනම් පෙර දුන් දෙයක් ගැන හෝ අන් අය දෙන දේ ගැන සතුටු වීමත් පිං කමකි.

---

**පුණ්‍යානුමෝදනාව :-** බු.ව.2551 වස් පුන් පොහෝ දින වූ දානය වශයෙන් මෙම දහම් පත්‍රිකාව සකස් කොට (කරවිට ගුණානන්ද හිමි) වන අප විසින් පරිත්‍යාග කරන ලදී. මෙම පිංකම අනුමෝදනාවෙන් සැමට නිවන් සැප පිණිස හේතු වේවා !

**උපකාරක පොත් :-** නිර්වාණ විනිශ්චය, අභිධර්ම මාර්ගය, බෞද්ධයාගේ අත්පොත, උපසම්පදා ශීලය (රේරුකානේ නාහිමි රචිත)

3 රූපාවචර භූමි

**තෙරුවන් සරණයි !**

අරූපාවචර භූමි 4

1 ශාසනයේ ආයුෂ ගෙවී අවසන් වීමට ලංවීම

යහපත් ශුද්ධ සම්පත්තිය ප්‍රාර්ථනා කිරීම 2

| සප්ත ආර්ය ධනය | | ධන | කෙටි විස්තරය |
|---|---|---|---|
| ස | ① | සද්ධා ධනය | ආර්ය ශ්‍රාවක සැදැහැතියේ වෙයි. මෙම කරුණින්ද ඒ භාගවතුන් වහන්සේ අර්හත් වන සේක. සම්මා සම්බුද්ධ වන සේක. .......භගවා වන සේක.යයි තථාගතයන් වහන්සේගේ සම්මා සම්බෝධිය විශ්වාස කරයි. මෙම කරුණා සද්ධා ධනය යැයි කියනු ලැබේ.(ධර්ම රත්නය,සංඝ රත්නය පිළිබඳවද මෙසේමය.) |
| ප් | ② | සීල ධනය | ආර්ය ශ්‍රාවක තෙමේ පණිවායෙන් වැළකියේ වෙයි. ....... මද්‍ය පමා දෙයට කරුණු වූ රහමෙරින් වැළකියේ වෙයි. මෙය සීල ධනය යැයි කියනු ලැබේ.(පංච සීලය ආරක්‍ෂා කිරීම මෙහි දැක්වේ.) |
| ත | ③ | හිරි ධනය | ආර්ය ශ්‍රාවක තෙමේ පවට ලැජ්ජිත වෙයි. කාය දුශ්චරිතයෙන් , වාග් දුශ්චරිතයෙන්, මනෝ දුශ්චරිතයන් කෙරෙහි බිය ලැජ්ජිත වෙයි. ලාමක අකුසල ධර්ම සමාපත්තියෙන් ලැජ්ජිත වෙයි. මෙය හිරි ධනය යැයි කියනු ලැබේ. (තමන්ගේ කුලගොත්‍රය,වයස, පුරභාවය හා බහුශ්‍රැතය සලකා පවට ලැජ්ජිත වේ.) |
| ආ | ④ | ඔත්තප්ප ධනය | ආර්ය ශ්‍රාවක තෙමේ පවට භය ඇත්තේ වෙයි.කාය දුශ්චරිතයෙන් , වාග් දුශ්චරිතයෙන් මනෝ දුශ්චරිතයන් කෙරෙහි බිය ඇත්තේ වෙයි. ලාමක අකුසල ධර්ම කිරීමෙහි භය ඇත්තේ වෙයි. මෙය ඔත්තප්ප ධනය යැයි කියනු ලැබේ.(අත්තානුවාද, පරානුවාද, දණ්ඩ, දුග්ගති වශයෙන් භය සතර උපදවා ගනී.) |
| ර් | ⑤ | සුත ධනය | ආර්ය ශ්‍රාවක තෙමේ බහුශ්‍රැත ඇත්තේ වෙයි. ආදි කල්‍යාණ වූ, මධ්‍ය කල්‍යාණ වූ,පර්යවසාන කල්‍යාණ වූ (මැද, මුල, අග යහපත් වූ) පරිශුද්ධ වූ යම් ඒ ධර්ම කෙනෙක් මාර්ග බ්‍රහ්මචර්යා පාළ කරත් නම් එබඳු ධර්මයෝ ඔහු විසින් බොහෝ කොට අසන ලද වෙත්, ධරණ ලද වෙත්, වචනයෙන් පරිචිත වෙත්, සිතින් විමසන ලද වෙත්, ප්‍රඥා දෘෂ්ටියෙන් යුක්ත වෙත්, මෙය සුත ධනය යැයි කියනු ලැබේ. |
| ය | ⑥ | චාග ධනය | ආර්ය ශ්‍රාවක තෙමේ දුරු වූ මසුරු මල ඇති සිතින් ගිහි ගෙයි වාසය කරන්නේ වෙයි. දෙවනුවද දීමට කැමැත්තේ වෙයි. පිදීමේ ඇලුණේ, යදනට නිසි වූයේ, දානයෙහි විභාග කොට දීමේ ඇලුණේ ගිහි ගෙයි වෙසෙයි. මෙය චාග ධනය යැයි කිනු ලැබේ. (ගුණයෙන් තමන්ට වඩා උසස් අයට දීම පූජාද, තමාට පහත් අයට දීම දානයද වේ.) |
| ධ<br>ම | ⑦ | පඤ්ඤා ධනය | ආර්ය ශ්‍රාවක තෙමේ අරමුණු සීල, පිහාදි කොයෙන් සංඥා ලෙස හැඳිනීමද වෙයි. අරමුණු අනිත්‍ය දුක්ඛ, අනාත්ම සංඛ්‍යාත ත්‍රි ලක්‍ෂණාවබෝධයද ලෞකික භූමිය ඉක්මවා ලබන ලොව්තුරු ගුණ විශේෂයට ඇතුලත් වේ. සෝවාන් ආදි මාර්ගඵලාවබෝධයට පැමිණි බුද්ධියෙන් යුක්ත වේ. මෙය පඤ්ඤා ධනය යැයි කියනු ලැබේ. |

ගාථාව :-
" සද්ධා ධනං සීල ධනං
හිරි ඔත්තප්පියං ධනං
සුත ධනඤ්ච චාගො ච
පඤ්ඤා වෙ සත්තමං ධනං "

* *ආර්ය ශ්‍රාවක යනු මාර්ග ඵලයට පත්වූ ගිහි පැවිදි දෙපිරිසමය. එම ශ්‍රාවකයන් තුළ පවතින උතුම් ධනය සප්ත ආර්ය ධනයයි. මෙම ආර්ය ධනය " යම් ස්ත්‍රියකට හෝ පුරුෂයෙකුට හෝ ඇත්තේ නම් ඔවුන් දිළින්දෙක් නොවේයි" ආර්යයෝ පවසති. ආර්ය ධන අතරින් කිහිපයක් යමෙකුට උපතින්ම පිහිටා ඇත. එම නිසා තම තමන් තුළ ඇති නැති ආර්ය ධන හඳුනාගෙන නැති ගුණ ඇති කර ගැනීමට වීර්යය කළ යුතුය. වර්ධනය කළ යුතුයි.*

සීලයේ අවශ්‍යතාවය } සියළු ලෞකික සැප සම්පත් (නිවැරදිව) ලබන්නට , 2.සියළු රූපාවචර ධ්‍යාන ලබන්නට, 3. අරූපාවචර ධ්‍යාන සතර ලබන්නට 4.සියළු ප්‍රාතිහාර්ය පාන්නට 5.සියළුම සංයෝජන සිඳින්නට හෙවත් මාර්ගඵල ලබන්නට යම් සීලයක (අවම වශයෙන් පඤ්ච සීලය) පිහිටිය යුතුමය. (සීලය ⟶ සමාධිය ⟶ ප්‍රඥාව ⟶ සද්ධාව......)

සිඛපද බිඳීම අනුව සීලය වර්ග කර දැක්වීම }
1. සමාදන් වූ සීලයේ මුල් සිඛ පදය කඩවී ගියේ නම් එබඳු සීලය ඛණ්ඩ සීලයයි.(දාරුව සිඳීගිය වස්ත්‍රයක් මෙනි.)
2. මැද සිඛ පදයක් කඩ වී ගියේ නම් එබඳු සීලය ඡිද්‍ද සීලයයි. (මැද සිදුරු ගිය වස්ත්‍රයක් මෙනි)
3. පිළිවෙළින් සිකපද කිහිපයක් බිඳී ගියේ නම් එබඳු සීලය සබල සීලයයි.(පිටෙහි හටගත් පුල්ලි ඇති දෙනක් මෙනි.)
4. අතරින් පතර සිඛපද බිඳී ගියේ නම් එම සීලය කල්මාස සීලයයි.(අතර තුර පුල්ලි ඇති දෙනක් මෙනි)

සීලයේ පඤ්ච ආනිසංස }
1. නොපමාව වත වතා රැස්වන්නා වූ මහත් උපභෝග, පරිභෝග වස්තුව ඇතිවීම.
2. කීර්තිය දස දිසා හොඹවමින් මෙලොව සැමතැන පැතිර යාම.
3. ප්‍රබල පිරිස් මැදට පැමිණි කල ආනුභාව සම්පන්න බවින් විශාරද බවින් යුක්ත වීම.
4. නිදා පිබිදියාක් මෙන් මුළාව දරුණු දුක් නොවිඳ කාලක්‍රියා කිරීම.
5. මරණින් මතු දෙව් සැපත් ලැබීමට හැකිවීම.(මේවා බලාපොරොත්තු නොවී සිල් රැකීම උතුමිය.)

" සද්ධාතිනඤ්ච පියෝහොති
මිත්තෙසු ච විරොචති
කායස්ස භෙදා සුගතිං
උපපජ්ජති සීලවාති "

සැලකිය යුතුයි }
* සද්ධා නමැති බීජය යම් සන්තානයක පිහිටයිද එම සන්තානය තුළ සියළු ධර්ම හටගන්නට භූමිය වන්නේය.
* හීන, මධ්‍යම, ප්‍රණීත වශයෙන් සීලය රක්නා අයුරින් ප්‍රභේදයක් දක්වා ඇත. ආනිසංසද ඒ අයුරින්ම වේ.
* ගුණධර්ම හීන, මධ්‍යම, උත්කෘෂ්ඨ වශයෙන් ඇති පුද්ගලයන් රක්නා සීලයද ඒ අයුරින්ම ප්‍රභේද වන්නේය.

විශේෂ කරුණු }
* බෝධි සත්වයන් සීල පාරමිතාව පිරූ භව කිහිපයක් නම් සීලව නාගරාජව, චම්පෙය්‍ය නාගරාජව, භූරිදත්ත නාග රාජව,ඡද්දන්ත හස්ති රාජ වශයෙනි.තවත් බොහෝ අවස්ථා ජාතක පොත බැලීමෙන් දැනගත හැක.
* ප්‍රඥාව ගුණ ධර්ම වැඩීමට හිතිය යුතු අතර ගුණ ධර්ම වැඩීම තුළින් ප්‍රඥාව තව තවත් දියුණුවීම විශේෂ කරුණක් වේ.
* සන්තානයක් තුළ පවතින උසස්ම චෛතසික ධර්මය වන්නේ ප්‍රඥා චෛතසිකයයි.මෙම චෛතසික ධර්මය දියුණු කිරීම තුළින් පමණක් සත්වයා අරමුණු කෙරෙහි මධ්‍යස්ථව ක්‍රියා කරන්නේය.

---

පුණ්‍යානුමෝදනය :- බු.ව. 2563 දුරුතු පුන් පොහෝ දින ධර්ම දානය ලෙස මෙම දහම් පත්‍රිකාව (සාධ්‍යක ගුණානන්ද හිමි) වන අප විසින් සකස් කොට වැලිගම්පිටියේ පදිංචි සැදැහැති වී. කුලරත්න කාරියප්පෙරුම මහතාගේ සහ එම මහත්මියගේ ධන පරිත්‍යාගයෙන් මුද්‍රණය කොට බෙදා දෙන ලදී. මෙම ධර්ම දානය එතුමා ඇතුළු ඔබ සැමට නිවන් අවබෝධය පිණිස හේතු වේවායි ප්‍රාර්ථනා කරමි.

උපකාරක පොත් :- වේරුගොඩ චන්දවිමල නාහිමි රචිත ශාසනාවතරණය, බුද්ධ නිති සංග්‍රහය
බඹුන්ගොඩ ආනන්ද මෛත්‍රී නාහිමි රචිත බුද්ධ චරිතය
කුඩා හිල්ලේ පඤ්ඤාසාරාම හිමි රචිත- ආර්ය ධනය

තෙරුවන් සරණයි !

3 යම් සාසනයෙකු උතුම් සපත් සීලය රැකීම.

ඒනා ගුණවතුන් කුතුන් ඉපදවීම. 4

සම් ගැලවී විසිර ගියත්, නහර ගැලවී විසිර ගියත්,

# සප්ත විශුද්ධි

| | විශුද්ධි | කෙටි විස්තරය |
|---|---|---|
| 1 | සීල විශුද්ධිය | සීලයේ අපිරිසිදු බව සියළු ගුණ ධර්ම වැඩීමට මහත් බාධාවකි. අනුන්ට කළ වරද නිසා හෝ රහසින් හෝ සිත පද බිඳීමෙන් පසු සිතට බිය සැක උපදී. එය සිතට මහත් පීඩාවකි. ආලොචනාසිතුම්තොන්තරයට අලු වී ඇත. එබැවින් සීලයේ පාරිශුද්ධි බව ඇති කර ගැනීම සීල විශුද්ධියයි. |
| 2 | චිත්ත විශුද්ධිය | සන්තති, සමූහ, කෘත්‍ය, හා ආරම්මණ සංඛ්‍යාත චතුර්විධ ඝනයෙන් වැසී පවතින්නාවූ නාම-රූප ධර්මයන්ගේ යථා ස්වභාවය දැන ගැනීමට සමත් වූ නීවරණ ධර්මයන් ගෙන් තොර වූ සමාධි ගත සිතක් ඇති කර ගැනීම චිත්ත විශුද්ධියයි. |
| 3 | දෘෂ්ටි විශුද්ධිය | නාම-රූප ධර්ම සමූහය, මවය, පියාය, සහෝදරයා, සැයා, පිතුරා යනාදී වශයෙන් ගෙන කටයුතු කිරීම ආත්ම දෘෂ්ටියයි. එම ආත්ම දෘෂ්ටිය තොර කර ගැනීමට සමත් වන්නේ විදර්ශනා ඥානයයි. එබැවින් ආත්ම දෘෂ්ටියක් නැති විදර්ශනා ඥානය පහල කර ගැනීම දෘෂ්ටි විශුද්ධියයි. |
| 4 | කාංක්ෂා විතරණ විශුද්ධිය | නාම-රූපයන්ගේ පැවැත්ම සිදුවන හේතු දැන ගෙන සිටියද ඒ පිළිබඳ සැක සංකා ඇතිවේ. එම අවිනිශ්චිත බව, සැක සහිත බව, මාර්ග ඵල ලැබීමට බාධකය. සකල සාංකාවන් දුරු කිරීමට සමර්ථ වූ නාම-රූපයන්ගේ හේතු පිළිබඳ පාරිශුද්ධ ඥානය කාංක්ෂාවිතරණ විශුද්ධියයි. |
| 5 | මාර්ගා,මාර්ග ඥාන දර්ශන විශුද්ධිය | ක්‍රමානුකූලව භාවනාව යෙදෙන විට පෙර නිති නොදුටු සත්කායයේ පහළ නොවූ ආලෝකයන් සමහර විටදක්නට ලැබේ මාර්ග ඵලයන්ට පත්වූවයි සිතා මුළාවී භාවනාව අතහරී. මෙසේ මුළා නොවී මෙය මාර්ගය, මෙය අමාර්ගය, වශයෙන් දැන ගන්නා ඥානය මාර්ගා මාර්ග ඥාන දර්ශන විශුද්ධියයි. |
| 6 | ප්‍රතිපදා ඥාන දර්ශන විශුද්ධිය | මාර්ග ඵලයන්ට පත් වීමට පෙර නව මහා විදර්ශනා ඥාන පිළිවෙලින් ඇතිවේ. එම විදර්ශනා ඇති වීම තුළින් අනුක්‍රමයෙන් අනා හෝ අනුලෝම වශයෙන් දැන් දේට විනා ප්‍රත්‍යක්ෂ වශයෙන් සංස්කාර ස්වභාවයන් වැටහීමේ ඥාන ඇති වීමෙන් මාර්ග ඵලයන්ට පැමිණීමේ ප්‍රතිපදාව මෙය බව වැටහීම ප්‍රතිපදා ඥාන දර්ශන විශුද්ධියයි. |
| 7 | ඥාන දර්ශන විශුද්ධිය | සෝතාපත්ති ආදී සතර මාර්ග චිත්තයන්හි නුවණ ඥාන දර්ශන විශුද්ධියයි.( මෙම ඥාන පහළ වීම සඳහා සීල විශුද්ධියේ පටන් ප්‍රතිපදා ඥාන දර්ශන විශුද්ධිය දක්වා විශුද්ධි ඇතිකර ප්‍රතිපදා ඥාන දර්ශනය වන නව මහා විදර්ශනා ඥානයේ අවසන් ඥානයට අනුරූපව මාර්ගඥාන පහළ වීම සිදුවේ.) |

* සිතේ ක්‍රියාකාරී වේගයට සමාන කිසිවක් අත් ලෝ ධාතුවේ නැත්තේය. ඒ වගේම එම සිතේ ස්වභාවය ලොවට ඉගැන්වූ බුදු රජාණන් වහන්සේ සේ වෙනත් කිසිවෙකුදු නැත්තේය. එසේම සිතේ ස්වභාවය දැන ලෝකෝත්තර ඥාන පහළ කර ගැනීම ප්‍රත්‍යවෙක්ෂණයෙහිද හැර අන් දෙයකු නොවන්නේය. සප්ත විශුද්ධි තුළින් එම ලෝකෝත්තර ඥාන පහල කර ගැනීම පිණිස මහා පිළිවෙලක් පියවරෙන් පියවරට පත් කර ගත යුතු ආකාරය දක්වා ඇත.

සැලකිය යුතුයි :- සීලය නම් කය-වචනය තුළින් සිදුවන පව්කම් වලක්වා ගන්නා ප්‍රතිපදාවයි. එබැවින් පංච සීල ප්‍රතිපදාව බුදුවරයන් වහන්සේලා ලෝ පහළ වීමටත් පෙර පවතී. අප බෝධිසත්වයන් වහන්සේ ගිහිගෙයින් නික්මව ආරක්ෂා කළේ ආජීවක අෂ්ටාංග සීලයයි. බුදු රජාණන් වහන්සේ පහල වීමෙන් අනතුරුව පවතින එන විවිධ සීල ප්‍රතිපදා ඇත. එම ප්‍රතිපදා මෙසේ දැක්විය හැක.

| අංකය | සිල්පද | පංච සීල | ආජීවට්ඨමක සීල | අෂ්ටාංග උපෝසථ සීල | නවාංග සීල | දස සීල | උපසම්පදා සීලය |
|---|---|---|---|---|---|---|---|
| 1. | පාණාතිපාතා වේරමණී සික්ඛා පදං සමාදියාමි | ✓ | ✓ | ✓ | ✓ | ✓ | භික්ෂූන් අනුපිළිවෙලින් උසස්ම සීලය උපසම්පදා සීලයයි. එබැවින් මෙම සීලය අධි සීලයැයි හඳුන්වයි. කෝටියක් සංවර සීලය ඇතිද මෙයට අයත්. අධි සීලයන් ආරක්ෂා කරන්නෙට විනා ඉන්ද්‍රිය සංවර, සීලය සංවරය ඇති කරගෙන නිර්වාණ ධර්ම අවබෝධ කරගැනීමට සමත් ප්‍රතිපදාවකි .(9180,5,37,000 සීලයක් ඇත.) |
| 2. | අදින්නාදානා වේරමණී සික්ඛා පදං සමාදියාමි | ✓ | ✓ | ✓ | ✓ | ✓ | |
| 3. | කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛා පදං සමාදියාමි | ✓ | * | * | * | * | |
| 4. | මුසාවාදා වේරමණී සික්ඛා පදං සමාදියාමි | ✓ | ✓ | ✓ | ✓ | ✓ | |
| 5. | සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛා පදං සමාදියාමි | ✓ | ✓ | ✓ | ✓ | ✓ | |
| 6. | අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛා පදං සමාදියාමි | | ✓ | ✓ | ✓ | ✓ | |
| 7. | පිසුණාවාචා වේරමණී සික්ඛා පදං සමාදියාමි | | ✓ | | | | |
| 8. | ඵරුසාවාචා වේරමණී සික්ඛා පදං සමාදියාමි | | ✓ | | | | |
| 9. | සම්ඵප්පලාපා වේරමණී සික්ඛා පදං සමාදියාමි | | ✓ | | | | |
| 10. | මිච්ඡා ආජීවා වේරමණී සික්ඛා පදං සමාදියාමි | | | | | | |
| 11. | විකාල භෝජනා වේරමණී සික්ඛා පදං සමාදියාමි | | | ✓ | ✓ | ✓ | (ලෞකික වශයෙන් සීලයේ අනුසස්) |
| 12. | නච්ච ගීත වාදිත විසූක දස්සනා - වේරමණී සික්ඛා පදං සමාදියාමි | | | ✓ (12-13) | ✓ (12-13) | ✓ | 1. මහා භෝග සම්පත් ලැබීම.<br>2. යශ කීර්ති ඝෝෂාව පැතිරීම. |
| 13. | මාලා ගන්ධ විලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වේරමණී සික්ඛා පදං සමාදියාමි | | | | | ✓ | 3. පිරිසක් මැද නිර්භීතව කටයුතු කිරීමට හැකිවීම. |
| 14. | උච්චාසයන මහා සයනා වේරමණී සික්ඛා පදං සමාදියාමි | | | ✓ | ✓ | ✓ | 4. අවසන් මොහොත දක්වා සිහි මුළාවීමෙන් තොරව කටයුතු කිරීමට හැකිවීම. |
| 15. | ජාතරූප රජත පටිග්ගහණා වේරමණී සික්ඛා පදං සමාදියාමි | | | | | ✓ | |
| 16. | සබ්බ සත්තේසු මෙත්තා සහගතේන චේතසා විහරණං සමාදියාමි | | | | ✓ | | 5. මරණින් මතු සුගතිගාමී වීම. |

විශේෂ කරුණු :- * නිවන් මාර්ගයේ පළමු පියවර නම් සීලය පිරිසිදු කර ගැනීමයි. සියලුම ගුණ ධර්ම වැඩෙන භූමිය ලෙසත් අත්‍යවශ්‍ය පිරිසිදු සිල්වත් බවයි.('සීලෙ පතිට්ඨාය නරෝ සපඤ්ඤො, චිත්තං පඤ්ඤඤ්ච භාවයං')
* සීලයක් රැකීම පිණිස පුද්ගලයා වසන්ම අනෙකුන් පාරමිතා ගුණ යම් ප්‍රමාණයක් හෝ වර්ධනය වී තිබිය යුතුය.
* සිල් ආරක්ෂා කර ගැනීමට මහත් වූ වීර්යය තිබිය යුත්තේ සිතා බිඳීමට හැකි කායික මානසික ශක්තිය ඇති විටය.

---

පුණ්‍යානුමෝදනය :- බු.ව. 2552 දුරුතු පුන් පොහෝ දින ධර්ම දානය ලෙස මෙම දැන්වීම් පත්‍රිකාව (නවවන යුග්මානන්ද හිමි) වන අප විසින් සකස් කොට වැලිගම්පිටියේ පදිංචි සඳහාසේකර කාරියවසම් මහතාගේ ධන පරිත්‍යාගයෙන් මුද්‍රණය කොට බෙදා දෙන ලදී. මෙම ධර්ම දානය එතුමා ඇතුළු සියලු සැමට නිවන් අවබෝධය පිණිස හේතු වේවායි ප්‍රාර්ථනා කරමි.

උපකාරක පොත් :- විදර්ශනා භාවනා(රේරුකානේ චන්දවිමල නාහිමි රචිත), ත්‍රිපිටකයේ සංක්ෂිප්ත ලක්ෂණ ග්‍රන්ථය

තෙරුවන් සරණයි !


ඇට ගැලවී විසිර ගියත්, මස්,ලේ,විසිර ගියත්,

www.sathaapi.org

# සක්වල විභංගය

0777 772 556, 0777 404 529

## එක් සම්මා සම්බුදුවරයකුගේ ආඥා ක්ෂේත්‍රයකට මෙවැනි සක්වළ කෝටි ලක්ෂයක් අයත්වේ



**1** වේලාම බ්‍රාහ්මණයාගේ දානය.

- රිදියෙන් පිරවූ 84,000 ක් **රන් පාත්‍ර**
- රනින් පිරවූ 84,000 ක් **රිදී පාත්‍ර**
- අමුරනින් පිරවූ 84,000 ක් **කස්ලෝ පාත්‍ර**
- ස්වර්ණාලංකාර ඇති රන් ධජ ඇති රන්රසු දැලින් ගැවසුණු 84,000 ක් **ඇතුන්**
- සිංහ සම්, ව්‍යාඝ්‍ර සම්, දිවි සම්, පඬු පැළලි ඇතිරූ රනින් අලංකාර කළ රන් ධජ ඇති රන්රසු දැලින් ගැවසුණු 84,000 ක් **රිය**
- දුහුල් රෙදි ඇතිරූ කස්ලෝ කොසු ඇති 84,000 ක් **දෙනුන්**
- මිණි කොඩොල් පැළඳි 84,000 ක් **කන්‍යාවන්**
- කොළපලස්, සුදු ඇතිරි, ඝන පුප් ඵරලොම් ඇතිරි අතුළ කෙසෙල් මුව සමින් කළ උතුම් පසතුරුණු ඇති උඩුවියන් සහිත දෙපසතැබූ කොට්ටයින් ඇති 84,000 ක් **පළඟ**
- සියුම් කොමු පිළි, කොසෙය පිළි, කම්බිලි, කපු පිළි කෝටි 84,000 ක් **වස්ත්‍ර**
- නදී මෙන් ගලන **අන්නපාන, ඛාද්‍ය, භෝජ්‍ය, ලේහ්‍ය පෙය**

**2** එක් සෝවාන් වහන්සේනමක් වැළඳවීම. ⟶ *වේලාම බ්‍රාහ්මණයාගේ දානයට වඩා මහත්ඵලයි.*

**3** එක් සකෘදාගාමීන් වහන්සේනමක් වැළඳවීම. ⟶ *සෝවාන් වහන්සේලා සියයක් වැළඳවීමට වඩා මහත්ඵලයි.*

**4** එක් අනාගාමි වහන්සේනමක් වැළඳවීම. ⟶ *සකෘදාගාමීන් වහන්සේලා සියයක් වැළඳවීමට වඩා මහත්ඵලයි.*

**5** එක් රහතන් වහන්සේනමක් වැළඳවීම. ⟶ *අනාගාමීන් වහන්සේලා සියයක් වැළඳවීමට වඩා මහත්ඵලයි.*

**6** එක් පසේබුදුන් වහන්සේනමක් වැළඳවීම. ⟶ *රහතන් වහන්සේලා සියයක් වැළඳවීමට වඩා මහත්ඵලයි.*

**7** එක් සම්මා සම්බුදුන් වහන්සේනමක් වැළඳවීම. ⟶ *පසේබුදුන් වහන්සේලා සියයක් වැළඳවීමට වඩා මහත්ඵලයි.*

**8** සම්මා සම්බුදුන් වහන්සේ ප්‍රමුඛ භික්ෂු සංඝයා වැළඳවීම. ⟶ *සම්මා සම්බුදුන්වහන්සේ වැළඳවීමට වඩා මහත්ඵලයි.*

**9** සිව් දිග්හි භික්ෂූන් වහන්සේලා උදෙසා වෙහෙරක් කරවීම. ⟶ *ඉහත දානයට වඩා මහත්ඵලයි.*

**10** පහන් සිතින් තිසරණ සරණයාම. ⟶ *ඉහත දානයට වඩා මහත්ඵලයි.*

**11** පහන් සිතින් පංචශීල ශික්ෂා පද සමාදන් වීම. ⟶ *ඉහත පුණ්‍යකර්මයට වඩා මහත්ඵලයි.*

**12** ගඳක් සිඹිනා කාලයක් මෛත්‍රිය වැඩීම. ⟶ *ඉහත පුණ්‍යකර්මයට වඩා මහත්ඵලයි.*

**13** අසුරක් ගසනා කාලයක් අනිත්‍ය මෙනෙහි කිරීම. ⟶ *ඉහත පුණ්‍යකර්මයට වඩා මහත්ඵලයි.*

**සත්පුරුෂ දානය** ✱


1. පිරිසිදු දෑ දෙයි.
2. ප්‍රණීත දෑ දෙයි.
3. සුදුසු කල්හි දෙයි.
4. කැපදුවක් දෙයි.
5. පරීක්ෂාකොට දෙයි.
6. නිරතුරු දෙයි.
7. පහන් සිතින් දෙයි.
8. දුන්පසු සතුටු වෙයි.

**අසත්පුරුෂ දානය** ✱

රූක්ෂ හෝ ප්‍රණීත හෝ වේවා,
සකස් නොකොට දීම.
ගරු නොකොට දීම.
සියතින් නොදීම.
නිරතුරු නොදීම.
කම්ඵල අදහා නොදීම.

හේතුවෙන් එම දානයේ විපාක පහළවූවිට උදාර භෝජනය පිණිස, වස්ත්‍ර දැරීම, වාහන පරිහරණය පස්කම් ගුණයෙහි භෝගය පිණිස සිත නොනැමෙයි. ඔහුගේ පුතුන්, අඹුවන්, දාසයන්, මෙහෙකරුවන්, කම්කරුවන්, ඔහුගේ වචන අසනු නොකැමති වෙති. සවන් නොදෙති.

# ආර්ය පුද්ගල වර්ණනාව




[illegible]

1. [illegible] 324 පිටුව
2. [illegible] 42 පිටුව
3. [illegible]

www.aathaapi.org

Aarya Varnana version 2

[illegible] 077 777 2556 [illegible]